# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 අප්‍රේල් මස 10 වන දින

## II වන කොටස

## අතිරේකය

(2024.04.17 දින නිකුත් කරන ලදී)


# ශ්‍රී ලංකා විදුලිබල

**විදුලිබල කර්මාන්තයට සිදු කරනු ලබන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; ජාතික විදුලිබල උපදේශක සභාව පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මේ පනත ප්‍රකාර විදුලිබල කර්මාන්තය සඳහා නියාමක වශයෙන් කටයුතු කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම සම්බන්ධ සියලු කටයුතු පැවරී ඇති සංස්ථාමය අස්තිත්ව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කිරීමට අදාළ ව්‍යවස්ථාමය පියවර සැපයීම සඳහා ද; ඒ හා සම්බන්ධ සියලු කටයුතුවලට අදාළ වන ක්‍රියාපටිපාටි නිශ්චිතව දැක්වීම සඳහා ද; 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත සහ 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත පරිච්ඡින්න කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 210.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා විදුලිබල

එල්.ඩී.-ඕ. 1/2023

**විදුලිබල කර්මාන්තයට සිදු කරනු ලබන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; ජාතික විදුලිබල උපදේශක සභාව පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මේ පනත ප්‍රකාර විදුලිබල කර්මාන්තය සඳහා නියාමක වශයෙන් කටයුතු කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම සම්බන්ධ සියලු කටයුතු පැවරී ඇති සංස්ථාමය අස්තිත්ව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කිරීමට අදාළ ව්‍යවස්ථාමය පියවර සැපයීම සඳහා ද; ඒ හා සම්බන්ධ සියලු කටයුතුවලට අදාළ වන ක්‍රියාපටිපාටි නිශ්චිතව දැක්වීම සඳහා ද; 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත සහ 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත පරිච්ඡින්න කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම සම්බන්ධ සියලු කටයුතු පැවරී ඇති සහ මෙම කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සඳහා සහ මෙම කටයුතු සම්බන්ධයෙන් වෙළෙඳපොළ තරඟකාරීත්වය නිර්මාණය කිරීම සඳහා වගකිව යුතු වන ස්වාධීන සංස්ථාමය අස්තිත්ව සංස්ථාගත කිරීම මගින් වර්තමානයේ දී රජයට හිමි තනි අස්තිත්වයක් වෙත පැවරී ඇති විදුලිබල කර්මාන්තයේ කටයුතු වෙන් කර තැබීම සහ වෙන් කිරීම මගින් තහවුරු කරනු ලබන විදුලිබල කර්මාන්තයට අලුත් ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා වන අවශ්‍යතාව යථා පරිදි හඳුනාගනු ලබන සහ ඒ සඳහා සැලසුම් කරනු ලබන, විදුලිබල කර්මාන්තයේ පවත්නා ආයතනික ව්‍යුහය සඳහා ප්‍රතිසංස්කරණ අවශ්‍ය හෙයින් ද: පූර්විකාව

විදුලිබල කර්මාන්තයේ සංක්‍රාන්තිය සහ ප්‍රතිසංවිධානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම සහ කාලීන සහ අත්‍යවශ්‍ය නෛතික, ව්‍යුහාත්මක, අධීක්ෂණය සහ වෙළෙඳපොළ පදනම් කරගත් වෙනස්වීම් මත පදනම් වූ හඳුනාගත් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සමඟ ආරම්භ වන ක්‍රියාවලියකි. කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත කිරීම සහ රාජ්‍ය පෞද්ගලික අංශ හවුල් ව්‍යාපාර පිළිවෙත්

භාවිත කර විදුලිබල කර්මාන්තයේ සෑම කටයුත්තකදී ම පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා පහසුකම් සැලැස්වීම සඳහා විනිවිදභාවයෙන් යුත් අයක්‍රමයක් හරහා, විනිවිදභාවයෙන් යුත් මූල්‍ය, ආයෝජන සහ සම්පත් කළමනාකරණය සහ වැඩිදියුණු කරන ලද වගවීමේ සහ අධීක්ෂණ පියවර හරහා මේ පනත යටතේ පිහිටුවනු ලබන සංස්ථාමය අස්තිත්වවල මූල්‍ය ස්වයං පූර්ණතාව සහතික කිරීමට ප්‍රතිසංස්කරණ මගින් අපේක්ෂා කරන හෙයින් ද:

රජයේ කාබන්හරණ ඉලක්ක, දේශගුණික විපර්යාස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ නවීන තාක්ෂණය මගින් පහසුකම් සපයනු ලබන විදුලිබල උත්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්ති දායකත්වය වැඩි කිරීම සහ ආනයනික පොසිල ඉන්ධන ප්‍රභවයන් මත යැපීම අවම කිරීම සඳහා දේශීය පුනර්ජනනීය බලශක්ති ප්‍රභවවලින් බලශක්ති උත්පාදනය කිරීම ප්‍රශස්තකරණය සඳහා වන ක්‍රියා සහ පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීමට පහසුකම් සැලැස්වීම පිණිස සහ කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් ආකාරයකින් විදුලිබල උත්පාදනය කිරීමේ විකල්ප ක්‍රියාවලීන් අතර තරඟය වැඩි කිරීම පිණිස බලශක්ති පරිවර්තනය, ගබඩා කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වන නව තාක්ෂණයන් යොදා ගැනීම හරහා විදුලිබල කර්මාන්තයේ විකාශනය සඳහා ශ්‍රී ලංකා රජයේ කැපවීම හඳුනාගැනීම අවශ්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දින

1. (1) මේ පනත 2024 අංක      දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ, 3 වන වගන්තියේ, 38 වන වගන්තියේ සහ මේ වගන්තියේ (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වගන්තිවල විධිවිධාන හැර, මේ පනතේ විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය:

එසේ වුව ද, නියමිත දිනය, පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ සිට මාස හයක් පසු නොවන දිනයක් විය යුතු ය:

එසේම තවදුරටත්, මේ උපවගන්තිය මගින් නියම කරනු ලබන පරිදි නියමිත දිනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ නොමැති නම්, මේ වගන්තියේ, 3 වන වගන්තියේ, 38 වන වගන්තියේ සහ මේ වගන්තියේ (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වගන්තිවල විධිවිධාන හැර, මේ පනතේ විධිවිධාන මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දිනයේ සිට මාස හයක කාලසීමාවක් ඉකුත් වූ වහාම ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

(3) මේ වගන්තියේ, 3 වන වගන්තියේ සහ 38 වන වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ දී ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

(4) මේ උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ඇති කරනු ලැබිය යුතු හෝ සපුරාලනු ලැබිය යුතු බවට මේ පනත මගින් නියම කරනු ලබන විශේෂ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, පහත දැක්වෙන පරිදි ඒ එක් එක් වගන්ති ක්‍රියාත්මක වීම සඳහා වෙනස් දිනයන් නියම කරනු ලැබිය හැකි යː-

(අ) විවෘත ප්‍රවේශයට අදාළ 13 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මකභාවයට එළඹෙනු ලබන්නේ යම් දිනයක සිට ද, එකී දිනය; සහ

(ආ) තොග විදුලිබල වෙළෙඳපොළට අදාළ IX වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මකභාවයට එළඹෙනු ලබන්නේ යම් දිනයක සිට ද, එකී දිනය.

(5) (4) වන උපවගන්තිය ප්‍රකාර සාදනු ලබන සෑම නියමයක් ම, අදාළ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට දින අනූවක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු යː

එසේ වුව ද, (4) වන උපවගන්තිය ප්‍රකාර සාදනු ලැබීමට අවශ්‍ය නියමයන්, පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දින සිට අවුරුදු පහක කාලසීමාවක් ඉකුත්වීමට පෙර සාදනු ලැබිය යුතු ය. එකී අවුරුදු පහක කාලසීමාව ඇතුළත කිසිදු නියමයක් සාදනු ලැබ නොමැති නම්, (4) වන උපවගන්තියේ දක්වා ඇති වගන්තිවල විධිවිධාන එකී අවුරුදු පහක කාලසීමාව ඉකුත්වන දිනයේ සිට ක්‍රියාත්මකභාවයට එළඹෙන ලෙසට සලකනු ලැබිය යුතු යː

එසේම තවදුරටත්, අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, එකී අවුරුදු පහක කාලසීමාව ඉකුත්වීමට පෙරාතුව තුන් මසක් ඇතුළත කවර හෝ අවස්ථාවක දී, එකී කාලසීමාව වරකට අවුරුද්දක් වන සේ දීර්ඝ කළ හැකි අතර, කෙසේ වුව ද එකී දීර්ඝකිරීම්වල එකතුව අවුරුදු පහක් නොඉක්මවිය යුතු ය.

## I වන කොටස

### පනතේ පරමාර්ථ

පනතේ පරමාර්ථ

**2.** විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම සම්බන්ධයෙන් වූ මේ පනතේ පරමාර්ථ වන්නේ,-

(අ) සෑම විට ම විනිවිදභාවයෙන් යුතු ප්‍රතිපත්ති හරහා, මුළු කාලය පුරාම ශ්‍රී ලංකාව පුරා සපයනු ලබන සහ නිසි පරිදි සම්බන්ධීකරණය වූ, කාර්යක්ෂම සහ පිරිමැසුම්දායක විදුලිබල සැපයුම් පද්ධතියක, සැපයීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුතු ස්වාධීන සහ වගකීමෙන් බැඳී සිටින සංස්ථාමය අස්තිත්ව හරහා වැඩිදියුණු වූ විදුලිබල කර්මාන්තයේ කාර්යසාධනය සහතික කිරීම;

(ආ) රට පුරා කාර්යක්ෂම විදුලිබල සැපයුමක් සඳහා ස්වාධීන සහ වගකීමෙන් බැඳී සිටින සංස්ථාමය අස්තිත්ව පිහිටුවීම සඳහා පහසුකම් සැලැස්වීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම;

(ඇ) තොග විදුලිබල වෙළෙඳපොළ පිහිටුවීම සහ එහි ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලැස්වීම;

(ඈ) පුනර්ජනනීය බලශක්තිය, විනිවිදභාවයෙන් යුත් කුසලතා අනුපිළිවෙල අනුව උත්පාදන ධාරිතාව ප්‍රේෂණය ක්‍රියාත්මක කිරීම සහ සියලුම වර්ගවල උත්පාදන තාක්ෂණ සහ පාරිභෝගිකයන් සඳහා සම්ප්‍රේෂණ ජාලය වෙත වෙනස්කමකින් තොරව ප්‍රවේශ වීම සැපයීම ඇතුලු නව උත්පාදන ධාරිතාවයේ විවෘත තරඟකාරී ප්‍රසම්පාදනය සඳහා ඉඩ දෙමින්, ප්‍රමුඛතා සැලකීම් සහ ඇතුලු වීමේ බාධක ඉවත් කිරීම මගින් විදුලිබල කර්මාන්තයේ තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඉ) (මෙහි මින් මතු "බලපත්‍රලාභීන්" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනත යටතේ බලපත්‍ර ප්‍රදානය කරනු ලැබ ඇති අස්තිත්ව විසින්, ඔවුන් වෙත නිකුත් කරන ලද අදාළ බලපත්‍රවලින් බලය ලබා දී ඇති හෝ නියම කර ඇති කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කරනු ඇති බව සහතික කිරීම;

(ඊ) සියලු පරිශ්‍ර වෙත සපයනු ලබන විදුලිබලය ඵලදායී ලෙස භාවිත කිරීම සහතික කරනු ලබන අතරම, විදුලිබලය සඳහා වූ අනාගත අවශ්‍යතා ඇතුළු විදුලිබලය සඳහා වූ සියලු සාධාරණ ඉල්ලීම් සපුරා ඇති බවට සහතික වීම;

(උ) වැඩිදියුණු කරන ලද ප්‍රමිතීන්, විශ්වසනීයත්වය සහ සේවාවල ගුණාත්මකභාවය මගින් විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම තුළින් උද්ගත වන අන්තරායයන්ගෙන් ජනතාව ආරක්ෂා කිරීම;

(ඌ) සියලු පාරිභෝගිකයන් වෙත විදුලිබලය ලබා ගැනීමේ හැකියාව සහ බලපත්‍රලාභීන්ගේ මූල්‍ය ශක්‍යතාව සහතික කිරීම පිණිස අයකුම මූලධර්ම හඳුනා ගැනීම; සහ

(එ) ස්වාභාවික සම්පත් උපරිම ලෙස භාවිත කිරීම සහතික කරමින් ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති සහ එහි ජාත්‍යන්තර බැඳීම්වලට අනුව ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ කාබන්හරණය සැලසීම සහ පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

## II වන කොටස

### ජාතික විදුලිබල උපදේශක සභාව, ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම

3. (1) මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින් මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික විදුලිබල උපදේශක සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. ජාතික විදුලිබල උපදේශක සභාව පිහිටුවීම

(2) සභාව, (1) වන උපවගන්තියෙන් එය වෙත පවරා ඇති නාමයෙන් සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, එකී නාමයෙන් එය විසින් සහ එයට එරෙහිව නඩු පවරනු ලැබිය හැකි ය.

(3) (අ) ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත උපදෙස් දීමේ වගකීම සභාව වෙත තිබිය යුතු යः-

(i) විදුලිබල කර්මාන්තයට සහ මේ පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීමට අදාළ කාරණා;

(ii) ශ්‍රී ලංකාවේ විදුලිබලය උත්පාදනය කිරීමට, සම්ප්‍රේෂණය කිරීමට, බෙදා හැරීමට, වෙළෙඳාම් කිරීමට, සැපයීමට සහ ප්‍රසම්පාදනය කිරීමට අදාළව මේ පනතේ විධිවිධානවලට අනුව විදුලිබල කර්මාන්තයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අදාළ කාරණා;

(iii) ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හරහා විදුලිබල කර්මාන්තයේ සංවර්ධනය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කර ගැනීම පිණිස කලාපීය වෙළෙඳපොළවල් සමඟ අන්තර් සම්බන්ධතා ඇතුළු තරඟකාරී විදුලිබල වෙළෙඳපොළවල් පිහිටුවීම ඇතුළුව විදුලිබල කර්මාන්තයේ සංවර්ධනය සඳහා වන යෝජනා සහ සැලසුම් සකස් කිරීමට අදාළ පිළිවෙත් සම්බන්ධයෙන්;

(iv) අවම ආර්ථික පිරිවැයක් යටතේ විදුලිබල ඉල්ලුම සපුරාලීම පිණිස පුනර්ජනනීය බලශක්තිය, නවීන තාක්ෂණ ක්‍රම සහ බලශක්ති කාර්යක්ෂමතාව ඇතුළු දේශීය බලශක්ති විභවයන් උපරිම වශයෙන් භාවිත කිරීම;

(v) මේ පනතේ විධිවිධාන යටතේ ජාතික විදුලිබල ප්‍රතිපත්තිය ප්‍රකාර දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාළ කාරණා;

(vi) පාරිභෝගිකයන් වෙත විදුලිබලය ලබා ගැනීමේ හැකියාව නියාමනය කරන ලද අස්තිත්වවල මූල්‍ය ස්ථාවරභාවය සහ ආයෝජන සඳහා සාධාරණ ප්‍රතිලාභ සහතික කිරීම

පිණිස, මුදල් අමාත්‍යාංශය සහ නියාමක විමසා, ජාතික අයකුම ප්‍රතිපත්තිය සකස් කිරීමට අදාළ කාරණා; සහ

(vii) ජාතික විදුලිබල ප්‍රතිපත්තියට සම්බන්ධ හෝ එයින් උද්ගත වන වෙනත් යම් කාරණයක්.

(ආ) සභාව විසින්, මේ උපවගන්තිය යටතේ එහි වගකීම් ඉටු කිරීමේ දී, අදාළ පරදු දරන්නන් විමසනු ලැබිය හැකි අතර, සද්භාවයෙන් සහ රටෙහි මෙන්ම පාරිභෝගිකයන්ගේ සුභසිද්ධිය පිණිස ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(4) සභාව, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන් හත්දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, ඔවුන් අතරින් එක් අයකු අමාත්‍යවරයා විසින් සභාවේ සභාපති ලෙස පත් කරනු ලැබිය යුතු යː-

(අ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ආ) ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඇ) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඈ) බලශක්ති ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්ෂේත්‍රයේ විශේෂඥතාව ඇති, විශිෂ්ඨත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු විස්සක පළපුරුද්දක් සහිත තැනැත්තකු;

(ඉ) ආර්ථික විද්‍යාව පිළිබඳ විශිෂ්ඨත්වයට පත්, විශේෂඥතාව ඇති, සහ අවම වශයෙන් අවුරුදු විස්සක පළපුරුද්දක් සහිත තැනැත්තකු;

(ඊ) බලශක්ති පද්ධති සැලසුම් සහ මෙහෙයුම් ක්ෂේත්‍රයේ විශේෂඥතාව ඇති, විශිෂ්ඨත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු විස්සක පළපුරුද්දක් සහිත තැනැත්තකු; සහ

(උ) පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති සංක්‍රාන්තිය සහ මූල්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥතාව ඇති, විශිෂ්ඨත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු විස්සක පළපුරුද්දක් සහිත තැනැත්තකු.

(5) (අ) සභාවේ සෑම සාමාජිකයකු විසින් ම, ධුරය භාර ගැනීමට පෙරාතුව පත් වීමේ දිනය වන විට පවතින ස්වකීය බැඳියාවන් පිළිබඳ පොදු අනාවරණය කිරීමක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) සභාව ඉදිරියේ ගැනීමට තිබෙන යම් කරුණක් සම්බන්ධයෙන් ඍජුව හෝ වක්‍රව බැඳියාවක් ඇති සභාවේ සාමාජිකයකු විසින් එම සම්බන්ධතාවයේ ස්වභාවය සභාව වෙත අනාවරණය කරනු ලැබිය යුතු අතර, එවැනි සාමාජිකයකු එම කාරණය සම්බන්ධයෙන් සභාවේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගී නොවිය යුතු ය.

(6) (අ) සභාව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, පරිපාලන ක්ෂේත්‍රයේ විශේෂඥතාව ඇති, විශිෂ්ඨත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු විස්සක පළපුරුද්දක් සහිත තැනැත්තකු අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා වගකියනු ලැබිය යුතු අතර, සභාව විසින්, කලින් කලට, තමා වෙත පවරනු ලබන කාර්ය ඉටු කළ යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පරිපාලන අධීක්ෂණයට යටත්ව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(7) සභාවේ සාමාජිකයන් අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුර දරනු ලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධාන සහ ස්වකීය පත්වීම් ලිපිවල දක්වා ඇති යොමු කිරීම් අනුදේශවලට අනුකූලව සභාව වෙත පවරා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

(8) (අ) සභාව ඉදිරියේ පවතින යම් නිශ්චිත ගැටලුවක් සඳහා අදාළ විශේෂඥතාව අවශ්‍ය වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වන ලද සුදුසුකම් සහ විශේෂඥතාව සහිත තැනැත්තන් සභාවේ රැස්වීම්වලට සහභාගි වීම සඳහා සමාග්‍රහණය කරගනු ලැබිය හැකි ය.

(ආ) එකී තැනැත්තන්, ඔවුන්ගේ ප්‍රවීණත්වය අවශ්‍ය කරන්නා වූ ගැටලුව පිළිබඳ සාකච්ඡා කරනු ලබන යම් රැස්වීමකට සහභාගි වී සහාය දක්වනු ලැබිය යුතු අතර, එසේ වුව ද, එසේ සාකච්ඡා කරනු ලබන යම් කාරණාවක දී ඡන්දය ලබා දීම සඳහා හිමිකම් නොලැබිය යුතු ය.

(9) (අ) යම් තැනැත්තකු -

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකුව සිටීම නතර වේ නම්;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ පත් කරනු ලැබීමට පෙරාතුව වූ අවුරුදු තුනක් ඇතුළත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව, පළාත් සභා මන්ත්‍රීවරයකුව හෝ පළාත් පාලන ආයතනයක සභිකයකුව සිට ඇත්තේ නම් හෝ;

(iii) විදුලිබල කර්මාන්තයේ යම් අස්තිත්වයක හෝ එම තැනැත්තා විසින් ඉටු කරනු ලබන වෙනත් යම් කාරණයක දී ඍජුව හෝ වක්‍රව බැඳීම් අතර ඝට්ටනයකට තුඩු දෙන මූල්‍යමය හෝ වෙනත් යම් සම්බන්ධතාවක් සහිත සම්බන්ධිත තැනැත්තකු වේ නම්;

(iv) ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට හඳුනාගනු ලබන්නේ නම් හෝ ප්‍රකාශ කරනු ලබන්නේ නම්;

(v) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් ලිඛිත නීතියක් යටතේ වස්තු භංගත්වයට හෝ බුන්වත්භාවයට පත්ව ඇති බවට ප්‍රකාශ කරනු ලැබ හෝ වස්තු භංගත්වයට හෝ බුන්වත්භාවයට පත්ව නිදහස් කරනු ලැබ නොමැත්තේ නම්;

(vi) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් යම් අපරාධමය වරදකට වරදකරු කරනු ලැබ ඇත්තේ නම්; හෝ

(vii) සභාවේ සාමාජිකයකු වශයෙන් එකී තැනැත්තා වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමෙන් එකී තැනැත්තාව වළක්වන යම් මානසික හෝ ශාරීරික දුබලතාවකින් පෙළෙන්නේ නම්,

එම තැනැත්තා සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

(ආ) සභාවේ යම් සාමාජිකයකු (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් නුසුදුසුකමකට යටත් වන්නේ නම්, අමාත්‍යවරයා විසින් ඒ සඳහා හේතු ලිඛිතව අමාත්‍ය මණ්ඩලය වෙත දැනුම් දීමෙන් පසු එම සාමාජිකයාව ඉවත් කරනු ලැබිය යුතු ය.

(10) (අ) සභාව විසින්, සභාවේ වගකීම්වලට අදාළ කාරණා ඇතුළු (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව එහි වගකීම් ඉටු කිරීමේ දී සභාවට සහාය ලබා දිය යුතු යම් තැනැත්තන් සංඛ්‍යාවක් සභාවේ කාර්ය මණ්ඩලය වශයෙන් කටයුතු කිරීමට සේවයට නියුක්ත කරගනු ලැබිය යුතු ය.

(ආ) සභාව විසින්, කාර්ය මණ්ඩලයේ ආයතනික සැලැස්ම සහ කාර්ය මණ්ඩලයේ එක් එක් සාමාජිකයාට පවරනු ලබන කාර්යභාරය සහ සභාවේ එදිනෙදා කටයුතු කළමනාකරණය කළ යුතු ආකාරය නිශ්චිතව දක්වමින් රීති සාදනු ලැබිය යුතු ය.

(ඇ) සභාවේ සාමාජිකයන් සහ කාර්ය මණ්ඩලය වෙත, පාරිශ්‍රමික ගෙවිය යුතු ආකාරය සහ ගෙවිය යුතු අනුප්‍රමාණ භාණ්ඩාගාරයේ ලේකම්වරයා විමසා අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(11) සභාවේ කටයුතු කරනු ලැබිය යුතු ආකාරය සහ සභාවේ රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටිය නියාමනය කිරීම සඳහා සභාව විසින් රීති සාදනු ලැබිය යුතු ය.

(12) අමාත්‍යවරයා විසින්, කලින් කලට, සභාවේ කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ඉටු කිරීම සහ කිරීම සඳහා අවශ්‍ය විය හැකි සමස්ත සැලසුම් කිරීම සහ සම්බන්ධීකරණය ඇතුළු ජාතික විදුලිබල ප්‍රතිපත්තියට සම්බන්ධ කාරණා පිළිබඳ යම් විධාන සහ මාර්ගෝපදේශ සභාව වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. එකී විධාන සහ මාර්ගෝපදේශ මේ පනතේ පරමාර්ථවලට සහ ජාතික විදුලිබල ප්‍රතිපත්තියට අනුකූල විය යුතු ය.

ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම

**4.** (1) ජාතික විදුලිබල ප්‍රතිපත්තිය මගින් 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අරමුණු පිළිබිඹු කිරීම සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 5 වන වගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමඟ අනුකූල වන ආකාරයට විදුලිබල කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ රජයේ ප්‍රතිපත්තිය පිළිබිඹු කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසුව, අමාත්‍යවරයා විසින්, අනාගත ඉහළ යන විදුලිබල ඉල්ලුම සපුරාලීමට ශ්‍රී ලංකාවට හැකියාව ලබා දීමේ අදහස ඇතිව, නියාමක, ජාතික පද්ධති ක්‍රියාකරු, බලපත්‍රලාභීන්, පාරිභෝගික සංවිධාන සහ අදාළ වෙනත් පරදු දරන්නන් විමසීමෙන් පසුව සහ අදාළ සියලු ජාතික ප්‍රතිපත්ති සහ අමාත්‍යවරයාගේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුකූලව ජාතික විදුලිබල ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කරන ලෙසට සභාව වෙත විධාන කරනු ලැබිය යුතු ය.

(3) සභාව විසින්, (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ විධානයට අනුකූලව පහත දැක්වෙන කරුණු පිළිබඳ රජයේ ප්‍රතිපත්තියේ දළ සටහනක් ඇතුළත් කළ යුතු ජාතික විදුලිබල ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීමට කටයුතු කළ යුතු ය. එනම්:-

(අ) විදුලිබල සැපයුමෙහි තරඟකාරී අයකුම සහ විශ්වසනීයත්වය හරහා පාරිභෝගික තෘප්තිය වැඩි දියුණු කිරීම සහ කාබන්හරණය සඳහා වන රජයේ අන්තර්ජාතික බැඳීම් සමග යමින් සහ විදුලිබලය ලබා ගැනීමේ හැකියාව, බලශක්ති සුරක්ෂිතතාව සහතික කරමින් ඇස්තමේන්තුගත ඉල්ලුම සපුරාලීම සඳහා විදුලිබල පද්ධතිය වර්ධනය කිරීම;

(ආ) විදුලිබලය උත්පාදනය කිරීම සම්බන්ධයෙන් භාවිත කිරීමට නියමිත තාක්ෂණික ක්‍රම සහ බලශක්ති කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ඉල්ලුම් පාර්ශව තාක්ෂණයන්;

(ඇ) ජාතික බලශක්ති සුරක්ෂිතතාව වර්ධනය කරනු ලබන සහ ආනයනික පොසිල ඉන්ධන ප්‍රභවයන් මත රඳා පැවතීම අඩු කරනු ලබන පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති ගබඩා කිරීම සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැනි බලශක්ති තාක්ෂණික ක්‍රමයන්හි ආයෝජන සිදු කිරීමට දිරිමත් කිරීම;

(ඈ) පුනර්ජනනීය බලශක්ති-පාදක විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය, බලශක්ති ගබඩා කිරීම සහ අවසාන භාවිතකරුගේ බලශක්ති කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම ඇතුළු විදුලිබල කර්මාන්තයේ මූල්‍ය ශක්‍යතාව සහ විදුලිබල කර්මාන්තය වෙත පෞද්ගලික අංශයේ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අවශ්‍යතාව සහතික කිරීම;

(ඉ) නව උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බලශක්ති ගබඩා ධාරිතාවය ප්‍රසම්පාදනය කිරීමේ දී තරඟකාරිත්වය හඳුන්වා දීම සහ තොග විදුලිබල වෙළෙඳපොළ පිහිටුවීම සඳහා පූර්ව කොන්දේසි සහ වැදගත් අදියර නිශ්චිතව දැක්වීම;

(ඊ) රජයේ විදුලිබල ප්‍රතිපත්ති අරමුණු මුදුන් පමුණුවා ගැනීම පිණිස විදුලිබල කර්මාන්තයෙහි ධරණීය වර්ධනයක් සඳහා අවශ්‍ය වන ආයෝජනයන් රැස්කිරීම;

(උ) මුදල් අමාත්‍යාංශය සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය විමසා සාදනු ලබන ජාතික අයකුම ප්‍රතිපත්තිය;

(ඌ) කලින් කලට ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඇතුළත් කිරීම; සහ

(එ) පනතේ පරමාර්ථ සපුරාලීම සඳහා වන ප්‍රමුඛතා සහ පියවර හඳුනාගැනීම.

(4) (අ) (3) වන උපවගන්තිය ප්‍රකාරව සභාව විසින් ජාතික විදුලිබල ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීම අවසන් කිරීමෙන් පසුව සහ ප්‍රමාණවත් පොදු පරදු දරන්නන් ප්‍රමාණවත් ලෙස විමසීමෙන් පසුව, අමාත්‍යවරයා විසින්, එම ප්‍රතිපත්ති කෙටුම්පත මේ පනතේ විධිවිධාන සමඟ සහ බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමඟ අනුකූල වන බවට සෑහීමට පත්වීමෙන් පසුව, එම ප්‍රතිපත්ති කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) එම ප්‍රතිපත්තියට අනුමතය ප්‍රදානය කිරීමට පෙරාතුව අමාත්‍ය මණ්ඩලය විසින්, (අ) ඡේදය යටතේ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද එම කෙටුම්පත සමාලෝචනය කරනු ලැබිය හැකි අතර, ඒ සඳහා සංශෝධන ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලැබීමෙන් පසුව, අමාත්‍යවරයා විසින්, එම අනුමතය ලද දින සිට මාසයක කාලසීමාවක් ඇතුළත ජාතික විදුලිබල ප්‍රතිපත්තිය ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(6) ජාතික විදුලිබල ප්‍රතිපත්තිය, මේ වගන්තිය ප්‍රකාරව අනුමත කරනු ලැබීමෙන් සහ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව, විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම සහ

ප්‍රසම්පාදනය කිරීම පිළිබඳ සියලු පූර්ව ප්‍රතිපත්ති ලේඛන, ඒ යටතේ නිසි පරිදි කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, අභිබවා බලපැවැත්විය යුතු ය.

(7) (4) වන උපවගන්තිය මගින් නියම කර ඇති ආකාරයට අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලබා ගැනීමෙන් පසුව, නියාමක විසින් බලපත්‍රලාභීන් වෙත විධාන නිකුත් කිරීම හරහා ජාතික විදුලිබල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහතික කරනු ලැබිය යුතු ය.

(8) අමාත්‍යවරයා විසින්, සෑම අවුරුදු පහකට වරක්ම සභාවේ උපදෙස් මත සහ පරදු දරන්නන් විමසීමෙන් පසු ජාතික විදුලිබල ප්‍රතිපත්තියේ සමාලෝචනයක් පැවැත්වීමට කටයුතු සලස්වනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ඉහත කී අවුරුදු පහක කාලසීමාව සම්පූර්ණ වීමට පෙරාතුව, ජාතික විදුලිබල ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමේ හදිසි අවශ්‍යතාවක් ඇති වුවහොත්, අමාත්‍යවරයා විසින්, ජාතික විදුලිබල ප්‍රතිපත්තියේ සමාලෝචනයක් පැවැත්වීමට කටයුතු සලස්වන ලෙස සභාව වෙත විධාන කරනු ලැබිය හැකි ය.

(9) (1) සිට (7) දක්වා වූ උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති කාර්යපටිපාටිය, ජාතික විදුලිබල ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් අනුකූල කර ගන්නා බවට අමාත්‍යවරයා විසින් සහතික විය යුතු ය.

(10) අමාත්‍යවරයා විසින්, ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ විෂයය පවරනු ලැබ ඇත්තා වූ අමාත්‍යවරයා විමසා සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සහිතව එම ප්‍රතිපත්තියේ ජාතික ක්‍රමෝපාය සහ ජාතික ඉලක්ක ඇතුළු ජාතික විදුලිබල ප්‍රතිපත්තියේ මූලධර්ම ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ, කලින් කල, ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි ය. එවැනි මාර්ගෝපදේශ මගින්-

(අ) පහත සඳහන් දේ සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සපයනු ලැබිය යුතු ය. එනම් -ඃ

(i) විදුලිබල කර්මාන්තය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පහසුකම් සැලසීම;

(ii) බලශක්ති සුරක්ෂිතතාව සහ පාරිසරික ධරණීයත්වයට අදාළ වෙනත් ප්‍රතිපත්තිමය අරමුණු සහ ඉලක්කවලට අනුකූලව අපේක්ෂිත ඉල්ලුම් වර්ධනය සපුරාලීම

පිණිස ජාතික විදුලිබල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහතික කිරීම;

(iii) විදුලිබල කර්මාන්තයේ ධරණීය සංවර්ධනය උදෙසා ජාතික ඉලක්ක අත්කර ගැනීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවය ඇස්තමේන්තු කිරීම සහ මේ පනත මගින් නියම කර ඇති ආකාරයට බලපත්‍ර ප්‍රදානය කිරීමට, නියාමන සහ විමර්ශන ක්‍රියාකාරකම්වලට අදාළ යාන්ත්‍රණ අධීක්ෂණය කිරීම;

(iv) දැරිය හැකි සහ ධරණීය ආකාරයකින් පුනර්ජනනීය බලශක්තිය වැඩි කිරීම සඳහා සහ රටෙහි පවතින බලශක්ති ආරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ඉලක්ක අත්කර ගැනීම සඳහා යොදාගත යුතු දිරිගැන්වීම් හඳුනා ගැනීම;

(v) 29 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ජාතික අයකුම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම;

(vi) තරඟකාරීත්වය සහ පාරිභෝගික වරණය හඳුන්වා දීම සඳහා විදුලිබල වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීමේ දී අනුගමනය කළ යුතු මූලධර්ම සහ ප්‍රතිපත්ති හඳුනාගැනීම;

(vii) මෙහෙයුම් වියදම්, ණය සේවා සහ බලපත්‍රලාභීන්ගේ කොටස් මත සාධාරණ ලාභය ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රවාහ සහතික කිරීම සඳහා ප්‍රමාණවත් වන්නා වූ ද පාරිභෝගිකයන් වෙත විශ්වසනීය සහ දැරිය හැකි මිල සහිත විදුලිබල සැපයුමක් පවතින බවට සියලු අවස්ථාවල දී සහතික කිරීම; සහ

(viii) ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු විදුලිබල කර්මාන්ත කාර්යසාධන වාර්තාවල ස්වභාවය පිළිබඳ මගපෙන්වීම් ලබා දීම; සහ

(ආ) නියාමක සහ අදාළ පරදු දරන්නන් විමසා, පහත දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ජාතික පද්ධති ක්‍රියාකරු වෙත මාර්ගෝපදේශ සැපයීම, එනම්:-

(i) ජාතික විදුලිබල ප්‍රතිපත්තිය ප්‍රකාරව පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ වෙළෙඳපොළ පාදක වූ දිරිගැන්වීම්;

(ii) විශ්වසනීයත්වය සහ බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා බලශක්ති ගබඩා කිරීම සහ වෙනත් ආර්ථිකමය බලශක්ති ප්‍රභව සඳහා වන දිරිගැන්වීමේ ප්‍රතිපත්ති;

(iii) විවෘත ප්‍රවේශය හරහා තරඟකාරිත්වය හඳුන්වාදීම සහ තොග විදුලිබල වෙළෙඳපොළ පිහිටු වීම සඳහා අවශ්‍ය වන පියවර; සහ

(iv) නිශ්චිත විශ්වාසයෙන් යුතු ව ධරණීය ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය වන ජාතික ඉලක්ක සහ ජාත්‍යන්තර බැඳීම් සපුරාලීම පිණිස සහ අවම ආර්ථික පිරිවැයකට විදුලි සැපයුම සිදු කිරීමට හැකියාව ලබා දීම පිණිස දීර්ඝ කාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම සකස් කිරීම.

(11) (අ) අදාළ යම් ලිඛිත නීතියකට යටත්ව, නියාමක සහ ජාතික පද්ධති ක්‍රියාකරු විසින් වහාම (10) වන උපවගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද යම් ලිඛිත ප්‍රතිපත්ති මාර්ගෝපදේශ බලාත්මක කරනු ලැබිය යුතු ය.

(ආ) ප්‍රතිපත්ති මාර්ගෝපදේශ බලාත්මක කිරීමේ දී පැනනැගිය හැකි යම් දුෂ්කරතා සම්බන්ධයෙන් නියාමක සහ ජාතික පද්ධති ක්‍රියාකරු විසින් අමාත්‍යවරයා දැනුවත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින්, නියාමක සහ ජාතික පද්ධති ක්‍රියාකරු විමසා, පනතේ මූලික ව්‍යුහය තුළ සහ අදාළ ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අදාළ මූලධර්ම තුළ එම දුෂ්කරතාවලට මුහුණදීමේ දී යොදාගත යුතු පියවර නිශ්චය කරනු ලැබිය යුතු අතර, ඒ සම්බන්ධව නියාමකට සහ ජාතික පද්ධති ක්‍රියාකරුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(12) අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, ජාතික පද්ධති ක්‍රියාකරුගේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම පිළිබඳව පනතේ IV වන කොටස යටතේ ජාතික පද්ධති ක්‍රියාකරු වෙත ලිඛිතව, සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, ජාතික පද්ධති ක්‍රියාකරු විසින් වහාම එකී විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

## III වන කොටස

## විදුලිබල කර්මාන්තය සඳහා වූ නියාමක

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විදුලිබල කර්මාන්තයේ නියාමක විය යුතු බව

**5.** (1) (මේ පනතේ "ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද (මේ පනතේ "නියාමක" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දින සිට විදුලිබල කර්මාන්තයේ නියාමක ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) විදුලිබල කර්මාන්තයට අදාළව නියාමකගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, නියාමක විසින් සියලු අවස්ථාවල දී, යුක්තිසහගතව, සාධාරණ ලෙස, අපක්ෂපාති ලෙස සහ ස්වාධීනව මෙන්ම කාලානුරූපීව, විනිවිදභාවයෙන් යුතුව, වාස්තවිකව සහ මේ පනතේ මූලධර්ම සහ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, යම් නිශ්චිත කරුණක් සම්බන්ධයෙන් මේ පනතේ කිසිදු විධිවිධානයක් සලසා නොමැති අවස්ථාවක දී, නියාමක විසින් ඒ පිළිබඳව තීරණය කිරීම පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ අදාළ විධිවිධාන අදාළ කරගනු ලැබිය හැකි යඃ

එසේම තවදුරටත්, විදුලිබල කර්මාන්තයට අදාළ වන මේ පනතේ විධිවිධාන සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ විධිවිධාන අතර යම් ගැටුමක් ඇති වන අවස්ථාවක දී, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

(3) නියාමකට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් බලය තිබිය යුතු ය.

එනම්-

(අ) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු, ජාතික පද්ධති ක්‍රියාකරු සහ විදුලිබලය බෙදා හැරීම ඇතුළු විදුලිබල උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ යෙදී සිටීමට බලය ලබා දී ඇති තැනැත්තන් වෙත බලපත්‍ර ප්‍රදානය කිරීම;

(ආ) බලපත්‍රවල කොන්දේසි නිශ්චය කිරීම සහ එම කොන්දේසි වෙනස් කිරීම මෙන්ම එම කොන්දේසිවලට අනුකූල නොවීම හෝ උල්ලංඝනය කිරීම හේතුවෙන් බලපත්‍ර අවලංගු කිරීම;

(ඇ) පාරිභෝගික සේවා ප්‍රමිතිවලට අනුකූලව ක්‍රියා කිරීම ඇතුළු බලපත්‍රලාභීන්ගේ කාර්යසාධනය නියාමනය කිරීම;

(ඈ) බලපත්‍රවල කොන්දේසි සහ නියමවලට අනුකූල වීම සහතික කර ගැනීම සඳහා බලාත්මක කිරීමේ නියෝග සෑදීම;

(ඉ) තොග විදුලිබල වෙළෙඳපොළ සහ විවෘත ප්‍රවේශය හඳුන්වා දීම සහ ක්‍රියාත්මකභාවයට පත් කිරීම සඳහා අදාළ නියෝග සැකසීම පිණිස 13 වන සහ 30 වන වගන්ති ප්‍රකාරව අමාත්‍යවරයා වෙත සහාය දැක්වීම;

(ඊ) තරඟකාරී නොවන වෙළෙඳපොළ භාවිතයන්, ඒකාබද්ධ කිරීම් සහ අත්කර ගැනීම් මෙන්ම ආධිපත්‍ය තත්ත්වයන් අයුතු ලෙස භාවිත කිරීම වැළැක්වීම සඳහා විමර්ශන කිරීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම;

(උ) 46 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආරාවුල් විසඳීම;

(ඌ) බලපත්‍රලාභීන් විසින් සහ විදුලිබල පාරිභෝගිකයන් විසින් අනුගමනය කරනු ලැබිය යුතු ආරක්ෂිත මාර්ගෝපදේශ සහ විධාන නිකුත් කිරීම මගින් විදුලිබල සැපයුම් පද්ධතියේ ආරක්ෂිත ක්‍රියාත්මක වීම සහතික කිරීම සහ එම මාර්ගෝපදේශ සහ විධාන බලාත්මක කිරීම;

(ඵ) විදුලිබල සැපයුම් වටිනාකම් දාමයෙහි ඵලදායී වැඩිදියුණුව ප්‍රවර්ධනය කිරීම සහ ඉල්ලුම් පාර්ශව බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම ප්‍රවර්ධනය කිරීම;

(ඒ) කලින් කලට අවශෝෂක අයක්‍රම නියම කිරීම, උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් විදුලිබලය මිල දී ගැනීමේ අයක්‍රමය, බෙදා හැරීමේ බලපත්‍රලාභීන් වෙත ජාතික පද්ධති ක්‍රියාකරුගේ තොග විකුණුම් අයක්‍රමය, සම්ප්‍රේෂණ සහ බෙදා හැරීම් බලපත්‍රලාභීන් වෙත ගෙවිය යුතු සම්ප්‍රේෂණ අයක්‍රමය සහ විවෘත ප්‍රවේශ ගාස්තු, බෙදා හැරීමේ අයක්‍රමය සමන්විත වන අවසාන පරිශීලක පාරිභෝගික අයක්‍රමය (එනම්, බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ ජාල පිරිවැය සඳහා) සහ සැපයුම් අයක්‍රමය (එනම්, බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ විදුලිබලය මිල දී ගැනීමේ අයක්‍රමය) සහ සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් අයකරගනු ලබන අවසර දෙනු ලබන ආදායම්;

(ඔ) පරදු දරන්නන්ගේ විමසීමෙන් පසුව දීර්ඝ කාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරු වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඕ) දීර්ඝ කාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලසුමට අනුව නව උත්පාදන ධාරිතාවයේ විවෘත තරගකාරී ප්‍රසම්පාදනය අනුගමනය කිරීම හරහා ජාතික පද්ධති ක්‍රියාකරුගේ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ විදුලිබලය මිල දී ගැනීමේ පිරිවැය අඩු කිරීම සහ ජාතික පද්ධති ක්‍රියාකරු විසින් පවත්නා උත්පාදන ධාරිතාවය ආර්ථිකමය වශයෙන් අඩුම පිරිවැයකට ප්‍රේෂණය කිරීම සහතික කිරීම;

(ක) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් භාරගනු ලබන උත්පාදන ප්‍රේෂණ පිළිබඳ ප්‍රේෂණ විගණනය භාර ගැනීම;

(ග) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් භාර ගන්නා ලද නව උත්පාදන, සම්ප්‍රේෂණ සහ බලශක්ති ගබඩා ධාරිතාවයෙහි වාණිජමය නියමයන් අධීක්ෂණය කර අනුමත කිරීම; සහ

(ච) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලසුම අනුමත කිරීම සහ අනුමත වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලසුමෙන් වන විචලනයන් අධීක්ෂණය කිරීම.

නියාමක විසින් ලේඛනයක් පවත්වාගෙන යා යුතු බව

**6.** (1) නියාමක විසින්, මේ පනත යටතේ වූ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා නියම කරනු ලැබිය යුතු ආකෘතියකින් ස්වකීය කාර්යාලයේ ලේඛනයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) නියාමක විසින්, එම ලේඛනයේ පහත දැක්වෙන කාරණා ඇතුළත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු යː-

(අ) මේ පනත යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයකට ම අදාළ තොරතුරු;

(ආ) ප්‍රදානය කරනු ලැබූ යම් බලපත්‍රයක කොන්දේසි වෙනස් කිරීමට හෝ එවැනි යම් බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට අදාළ තොරතුරු;

(ඇ) සෑම නියමයක් ම, විධානයක් ම සහ තීරණයක් ම ඇතුළු නියාමකගේ සෑම තීරණයක් ම;

(ඈ) මේ පනත ප්‍රකාරව සාදනු ලබන සෑම බලාත්මක කිරීමේ නියමයක් ම;

(ඉ) නියාමකගේ මුද්‍රාව තබා ඇති වෙනත් යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයකට අදාළ තොරතුරු; සහ

(ඊ) මේ පනත ප්‍රකාරව පවත්වනු ලබන යම් මහජන අදහස් විමසීමක කටයුතු පිළිබඳ වාර්තා.

(3) ලේඛනයේ අන්තර්ගත කරුණු දවසේ සාධාරණ කාලයක් තුළ දී ජනතාව විසින් පරීක්ෂා කර බැලීම සඳහා ඉදිරිපත් කර තබනු ලැබිය යුතු ය. ලේඛනයේ අන්තර්ගත යම් තොරතුරක් පිළිබඳ සහතික පිටපත් නියමිත ගාස්තුවක් ගෙවා ඉල්ලුම් කිරීමේ දී ඉල්ලුම්කරු වෙත සපයනු ලැබිය යුතු ය. ලේඛනයේ අන්තර්ගත තොරතුරු නියාමකගේ වෙබ් අඩවියේ ද පළ කරනු ලැබිය හැකි ය.

තොරතුරු ඉල්ලා සිටීම සඳහා නියාමක සතු බලතල

**7.** (1) නියාමක විසින්, මේ පනත යටතේ වූ ස්වකීය කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා, ලිඛිත දැන්වීමක් මගින්, එකී දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් ඇතුළත නියාමක වෙත, හෝ නියාමක විසින් තත්කාර්යය සඳහා බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු වෙත, අවස්ථාවෝචිත පරිදි, යම් බලපත්‍රලාභියකුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ භාරයේ ඇති එකී දැන්වීමේ නිශ්චිතව දක්වනු

ලැබිය හැකි සියලු තොරතුරු හෝ ලේඛන සපයන ලෙස එකී සෑම බලපත්‍රලාභියකු සහ වෙනත් යම් තැනැත්තන් වෙත නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් සපයන ලෙස නියම කොට ඇති යම් තොරතුරු හෝ ලේඛන, එම තොරතුරු හෝ ලේඛන සපයන ලෙස නියම කොට ඇති තැනැත්තා හෝ බලපත්‍රලාභියා විසින්, එම තොරතුරු හෝ ලේඛන සැපයීම තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් ප්‍රකාරව තහනම් කර ඇත්නම් මිස, එකී නියමයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත, එම දැන්වීමට අනුකූලව කටයුතු කිරීම, සෑම බලපත්‍රලාභියකුගේම හෝ තැනැත්තකුගේම වගකීම විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සපයන ලද කිසිදු තොරතුරක් හෝ ලේඛනයක් එම තොරතුර හෝ ලේඛනය සපයනු ලබන බලපත්‍රලාභියාගේ හෝ තැනැත්තාගේ කැමැත්ත ඇතිව මිස, නියාමක විසින් පළ කිරීම හෝ වෙනත් යම් තැනැත්තකු වෙත හෙළිදරව් කිරීම කරනු නොලැබිය යුතු ය.

(4) නියාමක විසින් (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන එම තොරතුරු හෝ ලේඛන සපයනු ලබන බලපත්‍රලාභියාගේ හෝ තැනැත්තාගේ කැමැත්තෙන් තොරව යම් තොරතුරු හෝ ලේඛන,-

(අ) යම් අධිකරණයක් විසින් එම තොරතුරු හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙස නියම කිරීමේ දී, එම අධිකරණය වෙත; හෝ

(ආ) මේ පනත මගින් නියාමක වෙත පවරා ඇති යම් කර්තව්‍යයක් ඉටු කිරීමේ කාර්ය සඳහා; හෝ

(ඇ) මේ පනත යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක යම් තොරතුරක් සපයන ලෙසට නියම කරනු ලබන කොන්දේසියකට අනුකූලව ක්‍රියා කිරීමට ඉඩ සැලැස්වීමේ කාර්ය සඳහා; හෝ

(ඈ) 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා,

එම තොරතුරු සපයන ලද තැනැත්තාගේ කැමැත්තෙන් තොරව හෙළිදරව් කිරීම, (3) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

විදුලි පරීක්ෂකවරුන්

8. (1) නියාමක විසින්, මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යථා පරිදි සුදුසුකම්ලත් තැනැත්තන් යම් සංඛ්‍යාවක් විදුලි පරීක්ෂකවරුන් ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) පහත දැක්වෙන කර්තව්‍ය ද ඇතුළුව මේ වගන්තිය ප්‍රකාරව හෝ මේ පනතේ අනෙකුත් විධිවිධාන ප්‍රකාරව තමා වෙත පවරන ලද කර්තව්‍ය ඉටු කිරීම (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විදුලි පරීක්ෂකවරයකුගේ කාර්යය විය යුතු යː-

(අ) විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, තොග මිල දී ගැනීම් සහ තොග අලෙවිය ඇතුළු වෙළෙඳාම් කිරීම, බෙදාහැරීම හෝ සැපයීම සඳහා බලපත්‍රයක් මගින් බලය දී ඇත්තා වූ හෝ බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ තැනැත්තන්ට අයත් විදුලි මාර්ග සහ විදුලි පිරියත සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම;

(ආ) යම් පාරිභෝගිකයකුගේ පරිශ්‍රය තුළ වූ යම් විදුලි මාර්ගයක් සහ විදුලි පිරියතක්, එම විදුලි මාර්ගය හෝ පිරියතය සම්බන්ධයෙන් හෝ එම විදුලි මාර්ගය හෝ පිරියතය හරහා හෝ එමගින් විදුලිබලය සැපයීම සම්බන්ධයෙන් මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් ප්‍රකාරව පනවා ඇති යම් නියමයක් සමඟ අනුකූල වී ඇද්ද යන්න සොයා දැනගැනීම සඳහා යම් පාරිභෝගිකයකු විසින් ඉල්ලා සිටින්නේ නම් සහ එසේ ඉල්ලා සිටින අවස්ථාවක, එම විදුලි මාර්ගය හෝ විදුලි පිරියතය පරීක්ෂා කිරීම සහ සෝදිසි කිරීම; සහ

(ඇ) නියාමක විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි (අ) හෝ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති කර්තව්‍යවලට අදාළ වෙනත් යම් ආනුෂංගික කර්තව්‍ය ඉටු කිරීම.

(3) (අ) විදුලි පරීක්ෂකවරුන් විසින්, මේ වගන්තිය ප්‍රකාරව ඔවුන් වෙත පවරා ඇති පරීක්ෂණයකට හෝ සෝදිසි කිරීමකට අදාළ කර්තව්‍ය නියාමකගේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලැබිය යුතු ය.

මේ වගන්තිය ප්‍රකාරව සිදු කරනු ලැබූ පරීක්ෂණයක් හෝ සෝදිසි කිරීමක් සම්පූර්ණ කිරීමෙන් පසු, එම විදුලි පරීක්ෂකවරුන් විසින්, සිදු කරන ලද සෑම විදුලි මාර්ග හෝ විදුලි පිරියත පරීක්ෂා කිරීමකට ම හෝ සෝදිසි කිරීමකටම අදාළව එකී පරීක්ෂකවරුන් විසින් ඔවුන්ගේ සොයාගැනීම් පිළිබඳ වාර්තාවක් නියාමක වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) එසේ ඉදිරිපත් කරනු ලැබූ යම් වාර්තාවක් සමාලෝචනය කිරීමෙන් පසු, නියාමක විසින්, විදුලි පරීක්ෂකවරයකුගේ සොයාගැනීම් සමඟ එකඟ වීම හෝ එකඟ නොවීම කරනු ලැබිය හැකි ය. එම සොයාගැනීම් සමඟ එකඟ නොවන අවස්ථාවක දී, එම වාර්තාව ක්‍රියාත්මක කිරීමට පෙර, එම වාර්තාවට අවශ්‍ය වෙනස් කිරීම් සිදු කරන ලෙස නියාමක විසින් අදාළ විදුලි පරීක්ෂකවරයාට නියම කරනු ලැබිය හැකි ය.

(4) පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් මේ වගන්තියේ කාර්ය සඳහා නියාමක විසින් රීති සාදනු ලැබිය හැකි යː-

(අ) විදුලි පරීක්ෂකවරුන් ලෙස පත් කරනු ලබන තැනැත්තන්ගේ සුදුසුකම්;

(ආ) විදුලි පරීක්ෂකවරුන් වෙත පනවා ඇති කාර්ය ඉටු කරනු ලැබිය යුතු ආකාරය සහ එසේ ඉටු කරනු ලැබිය යුතු කාලසීමාවන් දැක්වීම;

(ඇ) විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, වෙළෙඳාම් කිරීම, බෙදාහැරීම හෝ සැපයීම සඳහා බලපත්‍රයක් මගින් බලය පවරනු ලැබ ඇති හෝ බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති තැනැත්තන්ට -

(i) විදුලි පරීක්ෂකවරුන් වෙත වාර්තා හෝ වෙනත් අදාළ තොරතුරු සපයන ලෙස; සහ

(ii) එම විදුලි පරීක්ෂකවරුන් වෙත, පරිශ්‍ර වෙත ප්‍රවේශ වීමට සහ විදුලි පිරියත සහ වෙනත් පහසුකම් භාවිත කිරීම සඳහා ඉඩ ලබා දෙන ලෙස,

නියම කිරීම;

(ඇ) එකී පරීක්ෂකවරුන් වෙත ගාස්තු වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් වේ නම්, එම මුදල සහ එම ගාස්තු ගෙවිය යුතු තැනැත්තන් නිශ්චිතව දැක්වීම;

(ඉ) විදුලිබලය සැපයීමේ ස්වකීය වගකීමෙන් බලපත්‍රලාභියකු නිදහස් කරනු ලැබිය හැකි අවස්ථානුගත කරුණු හඳුනාගැනීම; සහ

(ඊ) (2) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල විධිවිධාන සලස්වා ඇති පරිදි විදුලි මාර්ග හෝ විදුලි පිරියත පරීක්ෂා කිරීමට හෝ සෝදිසි කිරීමට අදාළව විදුලි පරීක්ෂකවරයකු සහ පාරිභෝගිකයකු හෝ බලපත්‍රලාභියකු අතර නොඑකඟතාවයක් ඇති වූ අවස්ථාවක අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය දැක්වීම.

(5) මේ වගන්තිය යටතේ විදුලි පරීක්ෂකවරයාට ලැබෙන යම් ගාස්තුවක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 31 වන වගන්තිය යටතේ පිහිටුවන ලද නියාමකගේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### ජාතික පද්ධති ක්‍රියාකරු පිහිටුවීම

**9.** 2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාර සංස්ථාගත කරන ලද්දා වූ ද, කොටස්වලින් සියයට සියයක් රජය විසින් දරනු ලබන්නා වූ ද, සීමාසහිත සමාගමක් මේ පනත ප්‍රකාර ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍යතාවය ලැබිය යුතු ය.

ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා වන යෝග්‍යතාවය

**10.** (1) (අ) 9 වන වගන්තියේ දක්වා ඇති සමාගමක් (මෙහි මින්මතු "ජාතික පද්ධති ක්‍රියාකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික පද්ධති ක්‍රියාකරු විය යුතු අතර, එකී සමාගම වෙත ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය නියාමක විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

ජාතික පද්ධති ක්‍රියාකරු වෙත බලපත්‍රය නිකුත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය සහ කර්තව්‍ය

(ආ) ජාතික පද්ධති ක්‍රියාකරුගේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සතු කරනු ලැබිය යුතු යː-

(i) අතිරේක ලේකම්වරයකුගේ තත්ත්වයට වඩා අඩු නොවන තත්වයක් දරන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු;

(ii) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයකු;

(iii) බලශක්ති පද්ධති මෙහෙයුම් සහ සැලසුම් පිළිබඳ අවම වශයෙන් අවුරුදු පහළොවක පළපුරුද්දක් සහිත විදුලි ඉංජිනේරුවරයකු;

(iv) ව්‍යාපෘති මූල්‍ය සහ ප්‍රසම්පාදනය පිළිබඳ අවම වශයෙන් අවුරුදු පහළොවක පළපුරුද්දක් සහිත තැනැත්තකු; සහ

(v) වාණිජ නීතිය පිළිබඳ විශේෂඥතාව ඇති, විශිෂ්ඨත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු පහළොවක පළපුරුද්දක් සහිත තැනැත්තකු, ඔවුන්ගෙන් එක් අයකු අමාත්‍යවරයා විසින් සභාපති වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(ඇ) ජාතික පද්ධති ක්‍රියාකරුගේ ප්‍රධාන විධායක නිලධරයා පරිපාලනය පිළිබඳ විශේෂඥතාව ඇති, විශිෂ්ඨත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු විස්සක පළපුරුද්දක් සහිත තැනැත්තකු විය යුතු අතර, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය;

(ඈ) ජාතික පද්ධති ක්‍රියාකරුගේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් හෝ ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් ස්වකීය ධුරය භාර ගැනීමට පෙරාතුව ස්වකීය පත් වීම් දිනයේ පැවති ඔවුන්ගේ බැඳියාවන් පිළිබඳ පොදු හෙළිදරව් කිරීමක් අමාත්‍යවරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(ඉ) මණ්ඩලය ඉදිරියේ ගැනීමට තිබෙන යම් කරුණකට සෘජුව හෝ වක්‍රව බැඳියාවක් ඇති යම් අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයා විසින් එම බැඳියාවන්ගේ ස්වභාවය පිළිබඳ මණ්ඩලය වෙත හෙළිදරව් කරනු ලැබිය යුතු අතර, එම කාරණය සම්බන්ධයෙන් වූ මණ්ඩලයේ යම් සාකච්ඡාවක් හෝ තීරණයක් සඳහා සහභාගී නොවිය යුතු ය.

(2) පහත දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ජාතික පද්ධති ක්‍රියාකරු වගකියනු ලැබිය යුතු යː-

(අ) ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ තථ්‍ය කාල මෙහෙයුම්කරණය සඳහා පද්ධති පාලන මධ්‍යස්ථානය මෙහෙය වීම සහ පවත්වාගෙන යෑම;

(ආ) ඉදිරි වර්ෂයේ දී සිදු කිරීමට අපේක්ෂිත නව උත්පාදන ධාරිතාව ඇතුළු පවත්නා උත්පාදන ධාරිතාවයෙන් විදුලිබල අපේක්ෂිත ඉල්ලුම සපුරාලීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරු විසින් අපේක්ෂා කරන ආකාරය පිළිබඳව නිශ්චිතව දක්වමින් නියාමක වෙත සෑම වර්ෂයකම සැප්තැම්බර් මාසයේ තිස්වන දින හෝ එදිනට පෙර අවම ආර්ථික පිරිවැය මත පදනම්ව වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලසුම ඉදිරිපත් කිරීම;

(ඇ) රටෙහි විදුලිබල පද්ධතියෙහි ඒකාබද්ධ මෙහෙයවීම වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලසුමෙහි ප්‍රක්ෂේපණ මත පදනම් වන බවට සහතික කිරීම සහ වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලසුමෙන් යම් වෙනස්කම් පිළිබඳව ඒ හා සම්බන්ධ හේතු ද සමඟ නියාමක වෙත සෑම ලිත් මාසයක් අවසානයේ දී ම අධීක්ෂණය කර වාර්තා කිරීම;

(ඈ) කාලීනව විදුලිබල සැපයුම හා ඉල්ලුම තුලනය කිරීම සහතික කිරීම සඳහා විදුලිබල පද්ධතිය සමායෝජිතව ක්‍රියාත්මක කිරීම සහ එකී කාර්යය සඳහා-

(i) නියම කරනු ලැබිය යුතු උපරිම උත්පාදන කාලසටහන්ගත කිරීම සහ ප්‍රේෂණය සම්බන්ධයෙන් වන මූලධර්ම, මාර්ගෝපදේශ සහ ක්‍රමවේදවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම;

(ii) යම් දෙන ලද වේලාවක දී මුළු විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා වඩාත්ම පිරිමැසුම්දායක සහ වාසිදායක නියම මත සහ විනිවිදභාවයෙන් සහ වගකිව යුතු ආකාරයකින්, ජාතික පද්ධති ක්‍රියාකරු විසින් එළඹ ඇති හෝ ඔහු වෙත පවරා ඇති විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් හෝ ප්‍රමාණීකෘත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්වලට අනුකූලව උපරිම උත්පාදන කාලසටහන්ගත කිරීම සහ උත්පාදන පිරියතවලින් විදුලිබලය ප්‍රශස්ත ලෙස ප්‍රේෂණය කිරීම සහතික කිරීම, අනුගමනය කළ යුතු කාර්යපටිපාටීන් සහ භාවිත කළ යුතු ගිවිසුම් ආකෘති නියම කරනු ලබන පරිදි විය යුතු ය;

(iii) ජාලක කේත සංග්‍රහයට අනුකූලව ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සුරක්ෂිතව සහ පිරිමැසුම්දායක ලෙස ක්‍රියාත්මක කිරීම මගින් ජාලකයේ පාලනය සඳහා වන තථ්‍ය කාල මෙහෙයුම් සහ දෛනික විදුලිබල ප්‍රේෂණය සිදු කිරීම, ජාලකයේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම සහ නියම කරනු ලබන ආකාරයෙන්, ප්‍රේෂණ විගණනය සිදු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සහ දත්ත නියාමක වෙත ලබා දීම සහතික කිරීම;

(ඉ) විශේෂයකින් තොරව සම්ප්‍රේෂණ තදබදය කළමනාකරණය කිරීම කාලෝචිත සහ ඵලදායී ආකාරයකින් සිදු කිරීම සහතික කිරීම;

(ඊ) විදුලිය ආනයනය කිරීම සහ අපනයනය කිරීම අධීක්ෂණය කිරීම ඇතුළුව, විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් හෝ ප්‍රමාණීකෘත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් මගින් උත්පාදන බලපත්‍රලාභියකුගෙන් විදුලිබලය තොග වශයෙන් මිල දී ගැනීම සහ විදුලිය විකිණීමේ ගිවිසුම් මගින් බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට හෝ නියාමකගේ පූර්ව අනුමතය ඇතිව, වෙනත් පාරිභෝගිකයන්ට හෝ විදුලිය විකිණීම හෝ කලාපීය වෙළෙඳපොළ සමඟ විදුලිය වෙළෙඳාම් කිරීම සම්බන්ධයෙන් වන සියලු මූල්‍ය ගනුදෙනු වාර්තාගත කිරීම සඳහා, තොග සැපයුම් ගනුදෙනුවල ගිණුමක් ස්ථාපිත කිරීම සහ ඒ ගිණුමේ තොරතුරුවල මාසික පොදු අනාවරණයක් සිදු කිරීම. අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය සහ භාවිත

කළ යුතු තොග සැපයුම් ගනුදෙනු ගිණුම්වල සහ ගිවිසුම්වල ආකෘති නියම කරනු ලබන පරිදි විය යුතු ය;

(උ) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය හරහා සම්ප්‍රේෂණය කරනු ලබන විදුලිබලයේ ප්‍රමාණය සහ ගුණාත්මකභාවය පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම;

(ඌ) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයේ සමස්ත ක්‍රියාකාරිත්වය විෂයයෙහි අධීක්ෂණය සහ පාලනය ක්‍රියාත්මක කිරීම; සහ

(එ) නියාමක විසින් අනුමත කරනු ලබන කාර්යපටිපාටිවලට අනුකූලව පුනර්ජනනීය බලශක්ති පිරියත කඩින් කඩ නිපදවීමේ ස්වභාවය කළමනාකරණය කිරීමට, කලින් කලට, 11 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, තීරණය කරන ලද පරිදි බලශක්තිය ගබඩා කිරීමේ සහ ආනුෂංගික සේවා සපයා ගැනීමඃ

එසේ වුව ද, ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, නියම කරනු ලබන ආකාරයෙන් සහ නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව මිස, යම් වාණිජමය කටයුත්තක නොයෙදිය යුතු ය.

(3) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාරණා ක්‍රියාත්මක කළ යුතු කාර්යපටිපාටිය, ආකෘතිය සහ ආකාරය අමාත්‍යවරයා විසින්, නියම කරනු ලැබිය යුතු ය.

(4) සැක දුරු කිරීම සඳහා, නියමිත දින සිට සහ ඉන්පසු, 18 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති -

(අ) උත්පාදන පිරියතවල උත්පාදන කාලසටහන්ගත කිරීම, පවරා දීම සහ යෝග්‍යතා ක්‍රමයට අනුව පිරිමැසුම්දායක ලෙස ප්‍රේෂණය කිරීම;

(ආ) පිරිවැය, ආර්ථික වටිනාකම සහ කාබන්හරණ පරමාර්ථ සැලකිල්ලට ගනිමින් විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා අනාගත විදුලිබල පද්ධතිය උපරිම ලෙස සැලසුම් කිරීම;

(ඇ) පද්ධති පාලන මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම; සහ

(ඇ) උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් තොග වශයෙන් විදුලිබලය ලබා ගැනීම සහ එසේ තොග වශයෙන් ලබා ගත් විදුලිබලය බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට සහ දේශීය, කලාපීය හෝ ජාත්‍යන්තර වෙළෙඳපොළේ වෙළෙඳාම් කරන වෙනත් පාරිභෝගිකයන්ට විකිණීම,

සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය පැවරීම, ඉහත කී ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය ජාතික පද්ධති ක්‍රියාකරු වෙත පැවරීමට ආනුෂංගිකව සිදු කරනු ලැබිය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(5) ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, උත්පාදන සහ සම්ප්‍රේෂණ ධාරිතාව යන දෙයාකාරය, බලශක්තිය ගබඩා කිරීම සහ වසර දහයක කාලසීමාවක් ආවරණය වන ආනුෂංගික සේවා එකතු කිරීම් ඇතුළත් විය යුතු දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම සහ 4 වන වගන්තිය ප්‍රකාරව අනුමත ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සහ නිකුත් කරනු ලබන ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුකූලව වසර දහයක තවදුරටත් වූ කාලසීමාවක් සඳහා දර්ශන සැලැස්මක් සෑම වසර දෙකකට වතාවක් සකස් කළ යුතු ය.

(6) ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, එකී දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේ දී, අවම ආර්ථික පිරිවැය මූලධර්මය, ආර්ථික වශයෙන් වඩාත්ම පිරිමැසුම්දායක විදුලිබල උත්පාදන ධාරිතාවේ උපයෝජ්‍යතාව සහ වෙනත් ශක්‍ය විකල්ප පරිදර්ශන සැලකිල්ලට ගෙන, එය නියාමක වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(7) (අ) නියාමක විසින්, බලපත්‍රලාභීන් ඇතුළුව අදාළ පරදු දරන්නන් විමසීමෙන් පසුව, සැලැස්ම ලැබී මාස දෙකක් ඇතුළත ජාතික පද්ධති ක්‍රියාකරු වෙත නිර්දේශ සැපයිය යුතු ය.

(ආ) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් (අ) ඡේදය යටතේ ලැබුණු නිර්දේශ සැලකිල්ලට ගනිමින් සැලැස්ම සම්පූර්ණ කළ යුතු අතර, නියාමක විසින් ඉදිරිපත් කරන ලද යම් නිර්දේශයක් නොපිළිගැනීම සඳහා වන හේතු ද ඇතුළත් කර ඒ නිර්දේශ ලැබී මාසයක් ඇතුළත අමාත්‍යවරයා වෙත එය ඉදිරිපත් කළ යුතු ය. අමාත්‍යවරයා විසින් නියාමක සහ සභාව විමසා සැලැස්ම සමාලෝචනය කළ යුතු අතර, ජාතික විදුලිබල ප්‍රතිපත්තියට එහි ඇති අනුකූලතාවය පිළිබඳ සෑහීමට පත්වීමෙන් පසු වසර අවසන් වීමට පෙරාතුව අනුමතය සඳහා එය

අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. අමාත්‍ය මණ්ඩලය විසින් සැලැස්ම ලැබී මාස තුනක් ඇතුළත හේතු දක්වමින් සැලැස්ම අනුමත කිරීම හෝ අනුමත නොකිරීම කළ යුතු ය.

(8) ජාතික පද්ධති ක්‍රියාකරු, අනුමත දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් අනුමත සැලැස්මෙන් බැහැරව සිදු කරන ලද විචලනයන් අමාත්‍යවරයා සහ නියාමක වෙත නොපමාව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(10) ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්මෙන් බැහැරව සිදු කරන ලද විචලනයන් සඳහා වන හේතු සහ එකී විචලනයන් සහ ඒ විචලනයන්ගෙන් පැනනගින ආර්ථික සලකා බැලීම් වේ නම් ඒ සඳහා වන හේතු නිශ්චිතව දක්වන වාර්තාවක් අමාත්‍යවරයා සහ නියාමක වෙත වාර්ෂිකව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(11) දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්මට -

(අ) අඩුම ආර්ථික පිරිවැයකින් යුත් උත්පාදන තාක්ෂණයන්, බලශක්ති පරිවර්තන සහ ගබඩා කිරීමේ තාක්ෂණයන් සහ වෙනත් ඉල්ලුම් අංශ තාක්ෂණයන් ඇතුළුව උත්පාදනය පුළුල් කිරීම සහ සම්ප්‍රේෂණ ජාලය සංවර්ධනය කිරීම යන දෙවර්ගය ම සඳහා වන සාධාරණ තක්සේරුගත විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා උත්පාදන පිරියතවල ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බව සහතික කිරීමේ සැලසුම් ඇතුළත් විය යුතු ය;

(ආ) ජාතික විදුලිබල ප්‍රතිපත්තියේ සැකෙවින් දක්වා ඇති ප්‍රමුඛතා මත පදනම්ව අපේක්ෂිත විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා අවශ්‍ය විදුලිබල උත්පාදන ධාරිතා එකතු කිරීම් හඳුනාගනු ලැබිය යුතු ය;

(ඇ) 15 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය වර්ධනය කිරීම සඳහා නව සම්ප්‍රේෂණ ධාරිතාවක් සහ සම්ප්‍රේෂණ වත්කම් හඳුනාගැනීම සහ නියාමක විසින් අනුමත කරනු ලබන නියම හා

කොන්දේසිවලට යටත්ව සහ අනුමත දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්මට අනුකූලව නව විදුලි පිරියතවලට සම්බන්ධතාව ලබා දීම හෝ කලාපීය වෙළෙඳපොළවල්වලට සම්බන්ධතාව ලබා දීම කරනු ලැබිය යුතු ය.

(12) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරුට සහ අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ට අයත් සම්ප්‍රේෂණ සහ ජාල පහසුකම් මත ක්‍රියාත්මක කිරීමේ අධිකාරී බලය ජාතික පද්ධති ක්‍රියාකරු වෙත ප්‍රදානය කරන සම්ප්‍රේෂණ සේවා ගිවිසුම්වලට ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු සහ 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍ර නිකුත් කරනු ලබන තැනැත්තන් සමඟ ජාතික පද්ධති ක්‍රියාකරු ඇතුළත් විය යුතු ය.

(13) (අ) ජාතික පද්ධති ක්‍රියාකරුට, මේ පනත යටතේ නිකුත් කරනු ලබන ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රයේ අධිකාරී බලය යටතේ අනෙකුත් රටවලට විදුලිය වෙළෙඳාම් කිරීමේ අනන්‍ය අයිතිවාසිකමක් තිබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ සිදු කිරීමට අරමුණු කරන වෙළෙඳාමක නියම සහ කොන්දේසි අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ යුතු ය.

(ඇ) යම් රටකට විදුලිය සෘජුව ම අලෙවි කිරීමට කිසිදු උත්පාදන බලපත්‍රලාභියකුට බලය නොපැවරිය යුතු අතර, කිසිදු පාරිභෝගිකයකුට හෝ බෙදාහැරීමේ බලපත්‍රලාභියකුට යම් රටකින් විදුලිය මිල දී ගැනීමට බලය නොපැවරිය යුතු ය.

(14) ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, (12) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි උත්පාදන බලපත්‍රලාභීන් සමග විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්වලට සහ සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් සමඟ සම්ප්‍රේෂණ සේවා ගිවිසුම්වලට එළඹිය යුතු යඃ

එසේ වුව ද, ලංකා විදුලිබල මණ්ඩලය විසින් එළඹ ඇත්තා වූ ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී වලංගුව සහ ක්‍රියාත්මකව පවතින්නා වූ ද, සියලු විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් සහ ප්‍රමාණිකෘත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් ඒ විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් හෝ ප්‍රමාණිකෘත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්වල ඉතිරි කාලසීමාව

සඳහා සමාන නියම සහ කොන්දේසි යටතේ ජාතික පද්ධති ක්‍රියාකරු වෙත පවරනු ලැබිය යුතු අතර, මේ පනත ප්‍රකාරව ඇතුළත් වූ ලෙස වලංගුව සහ බලාත්මකව අඛණ්ඩව පැවතිය යුතු ය. ඒ විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් සහ ප්‍රමාණීකෘත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්වලට එළඹ ඇති උත්පාදන බලපත්‍රලාභීන් විසින් ඒ ගිවිසුම් අවසන් වන තෙක් ජාතික පද්ධති ක්‍රියාකරු වෙත විදුලිය අලෙවි කිරීමට බැඳී සිටිය යුතු ය.

11. (1) ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, දීර්ඝ කාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලසුමට අනුකූලව,- ප්‍රසම්පාදනය

(අ) පහත දැක්වෙන කාර්යපටිපාටිය මත පදනම්ව ටෙන්ඩර් කැඳවීම මගින් විදුලිබලය උත්පාදන ධාරිතාව සහ බලශක්ති ගබඩා ධාරිතාව සැපයීම කළ යුතු ය:-

ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, යම් අලුත් උත්පාදන පිරියතයක් සැපයීම හෝ (3) වන උපවගන්තියේ දක්වා ඇති කරන ලද පර්යන්ත ධාරිතාව ඉක්මවා පවතින පිරියතයක උත්පාදන ධාරිතාව, බලශක්ති ගබඩා කිරීමේ ධාරිතාව සහ වෙනත් යම් ආකාරයේ අනුසේවාවක ධාරිතාව පුළුල් කිරීම, ඉදිරියට සිදු කරගෙන යාම සඳහා යෝජනා කැඳවිය යුතු අතර, රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර සඳහා යොදාගත් කාර්යපටිපාටි ඇතුළත් ප්‍රසම්පාදනය විනිවිදභාවයෙන් සහ තරගකාරී ආකාරයෙන් සිදු කළ යුතු ය. එකී ප්‍රසම්පාදනය සඳහා වන විදුලිබල කර්මාන්තයේ නිශ්චිත කාර්යපටිපාටි සහ ඒ සඳහා අවශ්‍ය කරන ආකෘති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ආ(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විමසා සකස් කරනු ලැබිය යුතු අතර, එය නියම කරනු ලබන පරිදි විය යුතු යඃ

එසේ වුව ද,-

(i) උත්පාදන පිරියතයේ ධාරිතාව (3) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි පර්යන්ත අගයට පහළින් හෝ සමානව පවතින්නේ නම් සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 18 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් පුනර්ජනනීය බලශක්ති සම්පත් මාර්ගයෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා අවසාන අනුමතය ලබා දී ඇත්තේ නම්;

(ii) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ අලුත් උත්පාදන පිරියතයක් වැඩි දියුණු කිරීමට හෝ පවතින උත්පාදන පිරියතයක උත්පාදන ධාරිතාව පුළුල් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතයක් ලබාගෙන ඇති අවස්ථාවක; හෝ

(iii) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ ලංකා විදුලිබල මණ්ඩලය විසින්, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධානවලට අනුව, වලංගු ප්‍රදාන ලිපියක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක,

ජාතික පද්ධති ක්‍රියාකරු මේ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම අවශ්‍ය නොවිය යුතු යඃ

එසේ වුව ද, අඩුම පිරිවැයකට තැනැත්තකු විසින් සපයනු ලැබීමට අවශ්‍ය වන හදිසි ධාරිතාව සැපයීම හෝ විභවීය ප්‍රතිලාභය දීර්ඝ ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලියට වඩා වැදගත්කමකින් යුතු අවස්ථාවක දී, අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි ජාතික ව්‍යසනයක් හෝ ප්‍රධාන උත්පාදන පිරියතයක අනපේක්ෂිත දීර්ඝකාලීන විදුලිය ක්‍රියා විරහිත කිරීමක් අතරතුර දී යම් හදිසි අවස්ථාවකට මුහුණ දීම සඳහා වැඩි දියුණු කරමින් පවතින යම් අලුත් උත්පාදන පිරියතයක් හෝ යම් පවත්නා උත්පාදන පිරියතයක් පුළුල් කිරීම සම්බන්ධයෙන් ටෙන්ඩරයක් භාර දීමේ අවශ්‍යතාවය, අදාළ කර නොගත යුතු ය.

(ආ) පහත දැක්වෙන කාර්යපටිපාටිය මත පදනම්ව සම්ප්‍රේෂණ ධාරිතාව සැපයීම කළ යුතු යඃ-

(i) අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, ජාතික ආර්ථිකයේ යහපත පිණිස ඇතැම් සම්ප්‍රේෂණ වත්කම් ගොඩනැගීම සඳහා ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු වෙත පවරන ලෙසට ජාතික පද්ධති ක්‍රියාකරු වෙත දැනුම් දිය හැකි ය.

(ii) අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, ඇතැම් සම්ප්‍රේෂණ වත්කම් රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරවල අනුගමනය කළ යුතු යෝජිත පිළිවෙත භාවිත

කරමින් ප්‍රසම්පාදනය කිරීමට පැවරිය හැකි ය. ජාතික පද්ධති ක්‍රියාකරු විසින් එකී සම්ප්‍රේෂණ වත්කම් විනිවිදභාවයෙන් යුතුව සහ තරගකාරී ආකාරයකින් ප්‍රසම්පාදනය කිරීම සඳහා යෝජනා කැඳවිය යුතු ය. එකී ප්‍රසම්පාදනය සඳහා වූ නිශ්චිත කාර්යපටිපාටි සහ ඒ සඳහා අවශ්‍ය කරන ආකෘති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ආ(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විමසා සකස් කරනු ලැබිය යුතු අතර, එය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(iii) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් තෝරා ගත් පාර්ශවය වෙත ප්‍රදාන ලිපියක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) විදුලිබලය හෝ විදුලිබල උත්පාදන ධාරිතාවය මිල දී ගැනීම සඳහා වන නිර්දේශිත මිල දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලසුමේ නියමවලට අනුකූල බවට සහ ඒ මිල දී ගැනීමේ නියමයන් සහ කොන්දේසි තාක්ෂණික සහ ආර්ථික නිර්ණායකයන් තුළට ගැනෙන බවට නියාමක සෑහීමට පත් වන අවස්ථාවක, ජාතික පද්ධති ක්‍රියාකරුගේ යම් නිර්දේශයක් ලැබුණු පසුව නියාමක විසින් හැකි ඉක්මනින් එහි අනුමතය ප්‍රදානය කිරීම කළ යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ජාතික පද්ධති ක්‍රියාකරු සමඟ ප්‍රමාණිකෘත විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම්වලට එළඹීමට අවසර දිය හැකි, පුනර්ජනනීය බලශක්ති තාක්ෂණය පදනම් වූ යම් විදුලි පිරියතයක උපරිම ධාරිතාවය නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, සමුච්චිත පදනම මත ප්‍රමාණිකෘත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් භාවිත කරමින් එකිනෙකාට යාබද ස්ථානයකින් ලබා ගත හැකි එවැනි පුනර්ජනනීය බලශක්ති පිරියතවල උපරිම ධාරිතාවය, මේ වගන්තියේ පරිදි අලුත් ධාරිතාවයේ තරගකාරී ප්‍රසම්පාදනය සඳහා කාර්යපටිපාටි නියම කරමින් නියෝග සෑදූ විට, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝගයක් මගින් තවදුරටත් අඩු කළ යුතු මෙගාවොට් 10ට නොවැඩි ධාරිතාවක් විය යුතු යඃ

එසේම තවදුරටත්, ශ්‍රී ලංකා භූමි ප්‍රදේශය තුළ සහ ශ්‍රී ලංකා ජල තීරය තුළ පිහිටා ඇති විදුලි අපනයනයන්ට සම්බන්ධ යම් විදුලි ව්‍යාපෘතියක් අමාත්‍ය මණ්ඩලයේ අනුමතය මත පමණක් භාර ගනු ලැබිය යුතු ය.

ගෘහීත උත්පාදන පිරියත සහ සමර්පිත සම්ප්‍රේෂණ මාර්ග

**12.** (1) මේ කොටසේ පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් තැනැත්තකු විසින්, ගෘහීත උත්පාදන පිරියතයක් සහ සමර්පිත සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය හැකි යː

එසේ වුව ද,-

(අ) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය මාර්ගයෙන් ගෘහීත උත්පාදන පිරියතයකින් විදුලිබලය සැපයීම උත්පාදන බලපත්‍රලාභියකුගේ උත්පාදන ස්ථානයක ආකාරයෙන් ම නියාමනය කරනු ලැබිය යුතු ය;

(ආ) විදුලිබලය උත්පාදනය සහ සම්ප්‍රේෂණය සම්බන්ධයෙන් නියාමක විසින් නිකුත් කරනු ලබන ආරක්ෂිත නියෝග, සියලු ගෘහිත උත්පාදන පිරියත සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. යම් ගෘහීත උත්පාදන පිරියතයක් 28 වන වගන්තියේ කාර්ය සඳහා නියම කර ඇති ධාරිතා සීමාව ඉක්මවා යන අවස්ථාවක, එවැනි පිරියත සම්බන්ධයෙන් උත්පාදන බලපත්‍රයක් ලබා ගත යුතු ය;

(ඇ) එකී ගෘහීත උත්පාදන පිරියත සහ සමර්පිත සම්ප්‍රේෂණ මාර්ග ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයට සම්බන්ධ කර ඇත්නම්, එකී ගෘහීත උත්පාදන පිරියත මගින්, අවස්ථාවෝචිත පරිදි, ගෘහීත උත්පාදන හෝ සම්ප්‍රේෂණ බලපත්‍රයක් ලබා ගනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයට සම්බන්ධ කර ඇති එකී ගෘහීත උත්පාදන පිරියත මගින්, ජාලක කේත සංග්‍රහයට සහ නියාමක විසින් සහ ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු විසින් නියම කරනු ලබන වෙනත් තාක්ෂණික පරාමිතීන්ට සහ ආරක්ෂණ පියවරවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) ගෘහීත උත්පාදන පිරියතයක් ඉදිකර එකී පිරියතය පවත්වාගෙන යනු ලබන සහ ක්‍රියාත්මක කරනු ලබන සැම තැනැත්තකු විසින් ම, විවෘත ප්‍රවේශය සම්බන්ධයෙන් නියම කරනු ලබන්නා වූ මාර්ගෝපදේශවලට අනුකූලව සහ ඒ සම්බන්ධයෙන් නිශ්චිතව දක්වනු ලබන ගාස්තු ගෙවීමෙන් පසුව, එකී පිරියතයේ සිට භාවිත කිරීමට නියමිත ස්ථානය දක්වා විදුලිය ගෙන යාමේ කාර්යය සඳහා විවෘත ප්‍රවේශය ලැබීමේ අයිතිවාසිකම භුක්ති විඳිනු ලැබිය යුතු යː

එසේ වුව ද, එකී විවෘත ප්‍රවේශය ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු සහ අදාළ බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් නිශ්චය කරනු ලබන්නා වූ, ප්‍රමාණවත් සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ධාරිතාවේ උපයෝජ්‍යතාවයට යටත් විය යුතු ය.

(3) සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ධාරිතාවේ උපයෝජ්‍යතාව සම්බන්ධයෙන් වන යම් ආරාවුලක් නියාමක විසින් නිරාකරණය කරනු ලැබිය යුතු ය.

**විවෘත ප්‍රවේශය**

13. (1) නියාමක, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු සහ බෙදා හැරීමේ බලපත්‍රලාභියා විමසා, අමාත්‍යවරයා විසින්, මේ පනතේ 1 වන වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන දිනයක සිට විවෘත ප්‍රවේශය අදාළ වීම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. එකී විවෘත ප්‍රවේශය අදියර ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, අනුයාත අදියරවල විවෘත ප්‍රවේශ ප්‍රමාණය නියම කරනු ලබන ආකාරයෙන් සිදු කරනු ලැබිය යුතු අතර, හරස් සහනාධාර ගෙවීම සහ නියම කරනු ලබන වෙනත් මෙහෙයුම් සීමාවන් ඇතුළු කොන්දේසිවලට යටත් විය යුතු ය. විවෘත ප්‍රවේශ අයකිරීම් සහ ඒ සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් අධිභාරයක් VIII වන කොටසේ විධිවිධාන ප්‍රකාරව නියාමක විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයකින් ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව ලැබුණු අධිභාරය බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ සැපයුම් ප්‍රදේශය ඇතුළත හරස් සහනාධාරය පියවා ගැනීම සඳහා යොදා ගනු ලැබිය යුතු යː

එසේ වුව ද-

(අ) එකී අධිභාරය සහ හරස් සහනාධාර ජාතික අයකුම ප්‍රතිපත්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට අනුක්‍රමිකව අඩු කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ස්වකීය භාවිතය සඳහා යම් නියමිත ස්ථානයකට විදුලිබලය රැගෙන යාම සඳහා ගෘහීත උත්පාදන පිරියතයක් පිහිටුවා ඇති තැනැත්තකුට විවෘත ප්‍රවේශය ලබා දෙන්නේ නම්, එකී අධිභාරය අයකරනු නොලැබිය යුතු ය.

## V වන කොටස

### ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු

ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය ඉල්ලුම් කිරීම සඳහා වන යෝග්‍යතාවය

**14.** (1) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇත්තා වූ ද, එහි කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන්නා වූ ද, පොදු සමාගමක් නොවන කිසිම තැනැත්තකු, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය, මේ පනත ප්‍රකාරව ඉල්ලුම් කිරීම සඳහා යෝග්‍යතාවය නොලැබිය යුතු ය.

(2) 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට අනුකූලව සම්ප්‍රේෂණ මාර්ගයක් ඉදිකිරීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරු විසින් ප්‍රදාන ලිපියක් නිකුත් කර ඇති යම් තැනැත්තකු විසින් අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රයක් සහ අදාළ ජාලක කේත සංග්‍රහයට සහ වෙනත් තාක්ෂණික ප්‍රමිතීන්ට සහ පරාමිතීන්ට අනුකූලව ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අනුමතය ලබා ගැනීම පිණිස නියාමක වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය. එවැනි අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ට ඔවුන් විසින් ගොඩනගන ලද ඒ සම්ප්‍රේෂණ වත්කම්වල හිමිකාරිත්වය රඳවා තබා ගැනීමට බලය ලබා දිය යුතු අතර, ජාලක කේත සංග්‍රහයට අනුකූලව සහ ජාතික පද්ධති ක්‍රියාකරු විසින් තීරණය කරන පරිදි පවතින අතිරික්ත සම්ප්‍රේෂණ ධාරිතාවයට යටත්ව, යම් උත්පාදන ස්ථානයකට හෝ පාරිභෝගිකයකුට විශේෂයකින් තොරව සම්ප්‍රේෂණ සම්බන්ධතාවයක් සැපයීමට නියම කළ යුතු ය. 10 වන වගන්තියේ (12) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ජාතික පද්ධති ක්‍රියාකරු සමඟ එළඹුණු සම්ප්‍රේෂණ සේවා ගිවිසුම ප්‍රකාරව ජාතික පද්ධති ක්‍රියාකරු විසින් ඒ සම්ප්‍රේෂණ වත්කම්වල මෙහෙයුම්කරණය දැරිය යුතු ය.

(3) සැක දුරු කිරීම සඳහා, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සීමාව මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තකු සඳහා අදාළ නොවිය යුතු බව සඳහන් කරනු ලැබේ.

ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු සහ ආදීන්ගේ වගකීම්

**15.** (1) (මේ පනතේ "ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) 14 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති සමාගමක්, නියමිත දිනයේ දී ලංකා විදුලිබල මණ්ඩලයට අයත් සම්ප්‍රේෂණ වත්කම්වල හිමිකාරිත්වය සහ පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු ය.

(2) 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් සහ ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු, ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයේ භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, පුළුල් කිරීම සහ නඩත්තු කිරීම හා සම්බන්ධ ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් සහ දේශීය, කලාපීය හෝ ජාත්‍යන්තර වෙළෙඳපොළේ වෙනත් සුදුසුකම්ලත් අස්තිත්වයන් වෙත තොග වශයෙන් විදුලිබලය සම්ප්‍රේෂණය කිරීම සඳහා වගකිව යුතු ය:

එසේ වුව ද, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු විසින්, යම් ගිවිසුමකට එළඹීම හෝ අන්‍යාකාරයකින් විදුලිබලය උත්පාදනය කිරීම, බෙදා හැරීම, සැපයීම හෝ වෙළෙඳාමෙහි යෙදීම කරනු නොලැබිය යුතු ය.

(3) නියමිත දිනයට පෙරාතුව ම වන දිනයේ දී -

(අ) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයේ භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, පුළුල් කිරීම සහ නඩත්තු කිරීම සහ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියට යටත්ව, ශ්‍රී ලංකාව පුරාම කාර්යක්ෂම, සමායෝජිත, විශ්වසනීය සහ පිරිමැසුම්දායක ඒකාබද්ධ සම්ප්‍රේෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම;

(ආ) සම්ප්‍රේෂණ පද්ධතියට සම්බන්ධ වී සිටින බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට සහ ඉහළ වෝල්ටීයතා පාරිභෝගිකයන්ට තොග වශයෙන් විදුලිබල සම්බන්ධතාවය ලබා දීම සහ සම්ප්‍රේෂණය කිරීම,

සම්බන්ධයෙන් 18 වන වගන්තිය ප්‍රකාර ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉටු කරනු ලබන කර්තව්‍ය පැවරීම (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරුට පැවරීමට ආනුෂංගිකව සහ මේ වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයෙන්, අවශ්‍ය ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව සිදු කරනු ලැබිය යුතු ය.

(4) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු විසින් -

(අ) ජාතික පද්ධති ක්‍රියාකරු සමග එළඹුණු සම්ප්‍රේෂණ සේවා ගිවිසුමට සහ මේ පනතේ විධිවිධානවලට සහ ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රයේ නියමයන්ට අනුකූලව ජාතික පද්ධති ක්‍රියාකරුගේ උපදෙස් යටතේ විදුලිය සම්ප්‍රේෂණය කිරීම ආරම්භ කරනු ලැබිය යුතු ය;

(ආ) සම්ප්‍රේෂණ ධාරිතාව පිළිබඳ අවශ්‍යතා හඳුනාගැනීම සඳහා සහ දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම සකස් කිරීමට පහසුකම් සැලසීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරුට ආදානයන් සපයනු ලැබිය යුතු ය;

(ඇ) සම්ප්‍රේෂණ වත්කම්වල ආයෝජනය කිරීම සහ ජාතික ආර්ථිකයේ යහපත උදෙසා වන අවස්ථාවක, පෞද්ගලික අංශයේ ආයෝජන ලබා ගැනීම පිණිස ජාතික පද්ධති ක්‍රියාකරුට පහසුකම් සැලසීම කරනු ලැබිය යුතු අතර, 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ප්‍රසම්පාදනය කිරීම;

(ඈ) පෞද්ගලික ආයෝජකයන් විසින් ගොඩනඟන ලද එකී සම්ප්‍රේෂණ වත්කම්වල පරීක්ෂණ සිදු කිරීමේ දී, ජාතික පද්ධති ක්‍රියාකරු විමසා, භෞතිකව සාක්ෂි දැරීම සහ ඉන්පසුව ජාලක කේත සංග්‍රහය සහ අනෙකුත් අදාළ සියලු තාක්ෂණික ප්‍රමිතීන් හෝ පරාමිතීන් අනුගමනය කර ඇති බවට සහතික කරමින් අනුකූලතා සහතිකයක් නිකුත් කළ යුතු ය. අනුකූලතා සහතිකය නිකුත් කිරීමෙන් පසුව, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු විසින් පෞද්ගලික ආයෝජකයන් විසින් ගොඩනඟන ලද එකී සම්ප්‍රේෂණ වත්කම් මගින් විශේෂයකින් තොර පදනමක් මත ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයට සම්බන්ධ කිරීම සිදු කිරීම;

(ඉ) මුළු රට පුරාම කාර්යක්ෂම, සමායෝජිත, විශ්වසනීය සහ පිරිමැසුම්දායක ඒකාබද්ධ සම්ප්‍රේෂණ පද්ධතියක් වැඩි දියුණු කිරීම, පුළුල් කිරීම සහ පවත්වාගෙන යාම;

(ඊ) නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් නියාමකගේ අනුමතය ඇතිව උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට සහ වෙනත් සුදුසුකම්ලත්

පාරිභෝගිකයන් වෙත තොග වශයෙන් විදුලි සම්බන්ධතාව ලබා දීම සහ කලාපීය වෙළෙඳපොළවල්වල සම්ප්‍රේෂණ ජාලයට ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සම්බන්ධ කිරීම සහ සම්ප්‍රේෂණ ගාස්තු හෝ නියම කරනු ලැබිය හැකි යම් වෙනත් ගාස්තු අයකර ගැනීම;

(උ) නියාමක විසින් නිශ්චය කරනු ලබන පරිදි වන විවෘත ප්‍රවේශ ගාස්තු ගෙවීමට යටත්ව, විවෘත ප්‍රවේශය ප්‍රදානය කිරීම සඳහා නියමිත පූර්ව කොන්දේසිවලට අනුකූල වීමෙන් පසු ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයේ සියලු සුදුසුකම්ලත් පාරිභෝගිකයන්ට සම්ප්‍රේෂණ සේවාවන්හි විවෘත ප්‍රවේශය සැපයිය යුතු අතර, එවැනි විවෘත ප්‍රවේශයක් සඳහා වන අනුමතය ලබා දීම අයුක්ති සහගත ලෙස වැළැක්වීම නොකළ යුතු ය;

(ඌ) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සම්බන්ධයෙන් වන ජාලක කේත සංග්‍රහය සහ අනෙකුත් තාක්ෂණික සහ මෙහෙයුම් කේත මෙන්ම ප්‍රමිතීන් කෙටුම්පත් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමට ජාතික පද්ධති ක්‍රියාකරු සමග සම්බන්ධීකරණය වීම:

එසේ වුව ද, ජාලක කේත සංග්‍රහය විධිමත් ආකාරයකට යාවත්කාලීන කරනු ලැබිය යුතු අතර, නියාමක විසින් අනුමත කරනු ලැබිය යුතු ය;

(එ) ජාලක කේත සංග්‍රහය සහ නිසි පරිදි අනුමත කරන ලද දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම ප්‍රකාරව ජාලය පුළුල් කිරීම සඳහා අවශ්‍යතාවයක් ඇති වන කවර හෝ අවස්ථාවක, නියාමක විමසා ඒ සඳහා පහසුකම් සැලසීම;

(ඒ) සම්ප්‍රේෂණ අයකුම සහ වෙනත් ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් වන යෝජනා, කලින් කලට, නියාමක වෙත ඉදිරිපත් කිරීම; සහ

(ඔ) සම්ප්‍රේෂණ බලපත්‍රය ප්‍රකාරව කරගෙන යනු ලබන සම්ප්‍රේෂණ ව්‍යාපාරය සඳහා වෙනම ගිණුම් පවත්වාගෙන යාම,

කරනු ලැබිය යුතු ය.

සම්ප්‍රේෂණ මාර්ග සහ ජාලක උපපොළ

**16.** 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, නිසි පරිදි අනුමත කරන ලද දීර්ඝකාලීන බල පද්ධති සංවර්ධන සැලැස්ම ප්‍රකාරව ශ්‍රී ලංකා භූමි ප්‍රදේශය තුළ සහ ශ්‍රී ලංකා ජල තීරය තුළ සම්ප්‍රේෂණ මාර්ග, ජාලක උපපොළවල් සහ වෙනත් ආශ්‍රිත සම්ප්‍රේෂණ පිරියත සහ උපකරණ ගොඩනැඟීමට ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරුට බලය තිබිය යුතු ය. කලාපීය වෙළෙඳපොළවල්වල සම්ප්‍රේෂණ ජාලය හා ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය අතර යම් අන්තර් සබඳතාවයක් ඇති අවස්ථාවක දී, ඒ සම්ප්‍රේෂණ අන්තර් සබඳතාවය අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමතය ලබා ගැනීමෙන් පසුව පමණක් ගොඩනැඟිය යුතු ය.

## VI වන කොටස

### 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගම් සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගම් සංස්ථාගත කිරීම සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කරන ලද කටයුතු එම සමාගම් සතු කිරීම

**17.** (1) I වන උපලේඛනයේ විස්තර කර ඇති විදුලිබල කර්මාන්තයේ ව්‍යුහය ප්‍රකාරව අවශ්‍ය විය හැකි පරිදි සීමාසහිත සමාගම් යම් සංඛ්‍යාවක් 2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සංස්ථාගත කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ඒ එක් එක් සීමාසහිත සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය නියම කරනු ලබන ආකෘතියට සාරානුකූලව සකස් කරනු ලැබිය යුතු ය. 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානවලට යටත්ව, මේ කොටසේ කාර්ය සඳහා 18 වන වගන්තිය යටතේ සකස් කරන ලද පැවරුම් සැලැස්ම ප්‍රකාරව ඒ එක් එක් සීමාසහිත සමාගමට නීතිය ක්‍රියාත්මක වීමෙන් පැවරීමට ඇති කටයුතු එකී එක් එක් සීමාසහිත සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ සහ සාංගමික ව්‍යවස්ථාවලියේ සවිස්තරාත්මකව නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(2) 18 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පැවරුම් සැලැස්මේ දක්වා ඇති යෝජනා ක්‍රමයට අනුකූලව, විදුලිය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම සහ සැපයීම සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කරන ලද කටයුතු සහ අදාළ කාර්ය සහ කර්තව්‍ය සමඟ විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ සැපයීමට අදාළ ලංකා විදුලිබල මණ්ඩලයේ සියලු වත්කම් සහ බැරකම් මේ වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම ප්‍රකාරව නියමිත දිනයේ දී, (1) වන උපවගන්තිය ප්‍රකාරව සංස්ථාගත කරන ලද සීමාසහිත සමාගම් සතු කරනු ලැබිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල අවශ්‍යතා සපුරාලීමෙන් පසුව ද, පැවරුම් සැලැස්ම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට අවශේෂ සමාගම් එකක් හෝ කිහිපයක් සංස්ථාගත කිරීම අවශ්‍ය වන බව පෙනී යන්නේ නම්, ඒ අවශ්‍ය වන අවශේෂ සමාගම් සංඛ්‍යාව 2007 අංක 07 දරන සමාගම් පනතේ ඒ සඳහා විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් සංස්ථාගත කරනු ලැබිය යුතු අතර, මේ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එකී සමාගම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

පැවරුම් සැලැස්ම පිළියෙල කිරීම

**18.** (1) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා සහ භාණ්ඩාගාර ලේකම්වරයා සහ අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී, අදාළ පරදු දරන්නන් ද විමසා (මෙහි මින්මතු "පැවරුම් සැලැස්ම" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ සංක්‍රාන්තිය, පැවරීම සහ ප්‍රතිසංවිධානය සැලසීම සඳහා වන පැවරුම් සැලැස්මක් සකස් කරන ලෙසට මේ පනතේ 38 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයට නියම කළ යුතු ය. මේ වගන්තියේ සහ විදුලිබල කර්මාන්තයේ ව්‍යුහය සම්බන්ධයෙන් වන I වන උපලේඛනයේ සලසා ඇති පරිදි පැවරුම් සැලැස්මේ විදුලිය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම සහ සැපයීම සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ කටයුතු විවිධාංග කිරීම සඳහා වන සවිස්තරාත්මක සැලසුම්, යෝජනා සහ විධික්‍රම අන්තර්ගත විය යුතු ය.

(2) විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය විසින් පැවරීමේ සැලැස්ම අමාත්‍යවරයාගේ ප්‍රතිපත්ති විධිවිධානවලට යටත්ව පිළියෙල කරනු ලැබිය යුතු අතර,-

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසුව, නියමිත දිනයට ඉක්බිතිව ම වූ දිනයේ දී ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු මූලික පැවරීමේ සැලැස්මට විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම සහ සැපයීම ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් වන කටයුතු සතු කිරීම පිළිබඳව වන සියලු විස්තර මෙන්ම මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා අනුප්‍රාප්තික සමාගම්වලට මූලිකව ම අවශ්‍ය වන වත්කම් සහ බැරකම් පැවරීම සඳහා වන මූල්‍යමය සැලැස්මක් ද අන්තර්ගත විය යුතු ය; සහ

(ආ) එයට අවසාන පැවරීමේ සැලැස්මක් ඇතුළත් විය යුතු අතර, එය නියමිත දින සිට අවුරුදු දෙකකට පසු නොවන දිනයක සකස් කර අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඉක්බිතිව ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය. අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු විදුලිබල කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ශේෂව පවතින සියලු කාරණා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අන්තර්ගතව ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිළියෙල කරන ලද පැවරීමේ සැලැස්ම මගින්-

(අ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ලංකා විදුලිබල මණ්ඩලය මගින් කරන ලද කාර්ය සහ කර්තව්‍ය හඳුනාගනු ලැබිය යුතු ය;

(ආ) ලංකා විදුලිබල මණ්ඩලයේ පවත්නා මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් වන විට දී, සැපයුම් වගකීම් ඇතුළත් වන්නා වූ එකී වගකීම්වල කොටසක්, ලංකා විදුලිබල මණ්ඩලයේ ජල විදුලිබල උත්පාදන වත්කම් පවරා දෙනු ලබන සහ ශ්‍රී ලංකා රජය විසින් සියයට සියයක ප්‍රතිශතයකින් හිමිකාරිත්වය දරන සමාගමක් වන්නා වූ අනුප්‍රාප්තික සමාගම වෙත පවරා දෙනු ලබන අතර, එකී වගකීම්වල ශේෂ වන කොටස පැවරීමේ සැලැස්මේ නිශ්චිතව දක්වනු ලබන යම් අනුපාතවලින්, වෙනත් අනුප්‍රාප්තික සමාගම් අතර බෙදාහරිනු ලබන බව නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය;

(ඇ) පහත දැක්වෙන කාර්ය සහ කර්තව්‍ය සහ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවානියුක්තයන් 17 වන වගන්තියේ දක්වා ඇති අනුප්‍රාප්තික සමාගම් වෙත බෙදාහැරීම සහ පසුව සතු කිරීම් කිරීමට හැකියාව ලබා දීමට ලංකා විදුලිබල මණ්ඩලයේ යම් කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන වර්ගවලට වෙන් කිරීම කළ යුතු ය:-

(i) ජලය, තාපය සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මත පදනම්ව විදුලිබලය උත්පාදනය කිරීම;

(ii) විදුලිය සම්ප්‍රේෂණය කිරීමේ සේවාවන් සහ ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය නඩත්තු කිරීම;

(iii) විදුලිබල ඉල්ලුම පුරෝකථනය කිරීම සහ සැලසුම් කිරීම, විදුලිබලය ප්‍රසම්පාදනය කිරීම සහ තොග වශයෙන් විදුලිබලය විකිණීම, විදුලිබලය පිරිමැසුම්දායක ලෙස ප්‍රේෂණය කිරීම, පද්ධති පාලන මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම ඇතුළුව කළමනාකරණය කිරීම සහ සම්ප්‍රේෂණ ජාල ව්‍යාප්ත කිරීමට සැලසුම් කිරීම; සහ

(iv) විදුලිබලය බෙදා හැරීම හෝ සැපයීම;

(ඈ) 17 වන වගන්තියේ දක්වා ඇති අනුප්‍රාප්තික සමාගම් සතු කළ යුතු සහ ඒ සමාගම් විසින් කරනු ලැබිය යුතු සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් සහ සේවානියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල කළමනාකරණය, සහාය සේවා සහ පවත්නා මානව සම්පත විභජනය කිරීම ඇතුළුව, එහෙත් ඊට සීමා නොවූ (ආ) වන ඡේදයේ දක්වා ඇති කාර්ය සහ කර්තව්‍යවලට ඍජුව සම්බන්ධ නොවන්නා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්ය, කර්තව්‍ය සහ කටයුතු හඳුනා ගනු ලැබිය යුතු ය;

(ඉ) එකම කොටස්කරු ශ්‍රී ලංකා රජය වන 17 වන වගන්තියේ දක්වා ඇති සමාගමකට හෝ සමාගම්වලට-

(i) ලංකා විදුලිබල මණ්ඩලයේ පවරා නොමැති සියලු අවශේෂ වත්කම්, බැරකම්, කාර්ය සහ කර්තව්‍ය මෙන්ම ඉතිරි කාර්ය මණ්ඩලය ද වෙන් කරනු ලැබිය යුතු යː

එසේ වුව ද, අවශේෂ සමාගම්වල පරිපාලන වියදම් අයකර ගැනීම සඳහා අවශේෂ සමාගම්වලට අනෙකුත් අනුප්‍රාප්තික සමාගම්වලින් ගෙවිය යුතු අයකුමයේ අනුප්‍රමාණය නියාමක විසින් තීරණය කරනු ලැබිය හැකි අතර, එකී අයකුම මුදල රැස් කිරීමේ කාර්යපටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ රක්ෂකයා සහ භාරකරු ලෙස කර්තව්‍ය වෙන් කිරීම සහ එකී සේවක අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල කළමනාකරණය කිරීමට වෙන් කරනු ලැබිය යුතු යː

එසේ වුව ද, අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල යන දෙකම ඒ කාර්යය සඳහා පිහිටුවන ලද වෙනම සමාගමකට පවරනු ලැබිය යුතු අතර, එකී අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ ප්‍රතිලාභ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ සේවානියුක්තයන්ට සහ ලංකා විදුලිබල මණ්ඩලයේ පෙර සේවානියුක්තයන්ට පමණක් අදාළ විය යුතු යː

එසේම තවදුරටත්, එවැනි අරමුදල් කළමනාකරණය කිරීම සඳහා පවරන ලද සමාගමක පාලන ව්‍යුහය නියම කරනු ලබන පරිදි විය යුතු අතර, ඒ අරමුදල්වල ආයෝජන තීරණ පිළිබඳ විමසිය යුතු නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ සේවානියුක්තයන් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ පෙර සේවානියුක්තයන් අතරින් අනුයෝජිතයන් ඇතුළත් කළ යුතු ය;

(ඊ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ලංකා විදුලිබල මණ්ඩලයේ ධුර දරන ලංකා විදුලිබල මණ්ඩලයේ සියලුම නිලධරයන් සහ සේවකයන්-

(i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් නිසි පරිදි හඳුනාගනු ලබන බවට;

(ii) මේ පනත ක්‍රියාත්මක වීමෙන් මාස හතරක් ඇතුළත අදාළ අනුප්‍රාප්තික සමාගම් වෙත යෝජිත අනියුක්ත කිරීම සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් දැනුම් දෙනු ලබන බවට; සහ

(iii) (ii) වන උපවගන්තියේ දක්වා ඇති දැන්වීම ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත, එකී අදාළ අනුප්‍රාප්තික සමාගම්වලට අනියුක්ත වීමට ඔවුන් තෝරා ගන්නේ ද නැති ද යන්න, ලංකා විදුලිබල මණ්ඩලය වෙත දැනුම් දීමට අවශ්‍ය බවට,

සහතික විය යුතු අතර, නියමිත දිනයට පසු දිනයේ සිට බල පැවැත්වෙන පරිදි, ලංකා විදුලිබල මණ්ඩලයේ ඔවුන්ගේ සේවානියුක්ත ගිවිසුම යටතේ ගෙවනු ලබන එම වැටුප සමඟ මූලික පැවරීමේ සැලැස්ම යටතේ එකී අනුප්‍රාප්තික සමාගම් වෙත අනියුක්ත කරනු ලැබිය යුතු ය. සේවානියුක්තයකු අනුප්‍රාප්තික සමාගමකට අනියුක්ත වීමට තෝරා නොගන්නා අවස්ථාවක දී, එකී සේවානියුක්තයා ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයකට හිමිකම් ලැබිය යුතු අතර, එකී යෝජනා ක්‍රමයේ නියමයන් සහ කොන්දේසි නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) ලංකා විදුලිබල මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී 17 වන වගන්තියේ දක්වා ඇති අනුප්‍රාප්තික සමාගමක සේවයට සම්බන්ධ වීමට තෝරාගනු ලබන අවස්ථාවක දී, එකී නිලධරයා හෝ සේවකයා -

(අ) විශ්‍රාම හිමිකම සහ වෙනත් විශ්‍රාම ප්‍රතිලාභ ගණනය කිරීමේ කාර්යය සඳහා පමණක්, එකී නිලධරයා හෝ සේවකයා ලංකා විදුලිබල මණ්ඩලය මගින් සේවා නියුක්ත කර ගන්නා ලද දින සිට 17 වන වගන්තියේ දක්වා ඇති අනුප්‍රාප්තික සමාගම්වල ඔහුගේ සේවා කාලය අවසන් කරන තෙක් ලංකා විදුලිබල මණ්ඩලයේ රජයේ සේවකයකු ලෙස අඛණ්ඩව ම සේවයේ නියුතු වී ඇති බවට සලකනු ලැබිය යුතු අතර, එවැනි යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ අනුප්‍රාප්තික සමාගමක සේවා කාලය ඔහුගේ ලංකා විදුලිබල මණ්ඩලයේ පෙර සේවා කාලයට එකතු කළ විට, වසර විස්සක් හෝ ඊට වැඩි වන්නේ නම්, අනුප්‍රාප්තික සමාගමක ඔහුගේ සේවා කාලය අවසානයේ දී ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදලේ රීතිවලට අනුකූලව එකී නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ විය හැකි විශ්‍රාම වැටුප සහ විශ්‍රාම ප්‍රතිලාභ ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය;

(ආ) ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ රීති හෝ නියෝග ප්‍රකාරව ඔවුන් විසින් සිදු කළ යුතු අර්ථසාධක අරමුදලට යම් දායක මුදල් ගෙවීම් ඒ අනුප්‍රාප්තික සමාගම සමඟ එක්ව අඛණ්ඩව කරනු ලැබිය යුතු යː

එසේ වුව ද, යම් සේවානියුක්තයකු විසින් අත්සන් කරන ලද යම් බන්ධනීය සේවා බැඳුම්කරයක් ඒ

සේවානියුක්තයාව අනියුක්ත කරන ලද අනුප්‍රාප්තික සමාගමට පවරනු ලැබිය යුතු ය.

(5) (අ) අදාළ අනුප්‍රාප්තික සමාගමට යෝජිත අනියුක්ත කිරීම පිළිබඳ ලංකා විදුලිබල මණ්ඩලයේ යම් නිලධරයකුට හෝ සේවකයකුට දැනුම් දුන් දින සිට ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීම තෝරා ගනු ලබන එකී නිලධරයා හෝ සේවකයා, එකී නිලධරයා හෝ සේවකයා විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවා කාලය වසර දහඅටක් සම්පූර්ණ කර ඇත්නම්, එවැනි නිලධරයන් හෝ සේවකයන් ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදලේ රීතිවලට අනුකූලව අදාළ විය හැකි විශ්‍රාම වැටුපට සහ වෙනත් විශ්‍රාම ප්‍රතිලාභවලට හිමිකම් ලැබිය යුතු ය.

(ආ) (i) යම් අනුප්‍රාප්තික සමාගමක සේවයට බැඳීමට තෝරා ගනු ලබන ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධරයන් හෝ සේවකයන් ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ අඛණ්ඩව සාමාජිකයන් විය යුතු අතර, ඒ යටතේ ඇති සියලු ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබිය යුතු ය.

(ii) අනුප්‍රාප්තික සමාගම් සහ අනුප්‍රාප්තික සමාගම්වල සේවානියුක්තයන්ව සිටින ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් නියමිත දිනයට පසු දිනයේ දී, අවස්ථාවෝචිත පරිදි, අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ රීති හෝ නියෝග මගින් ගෙවීමට නියමිත යම් දායක මුදල් අර්ථසාධක අරමුදලට සහ විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

## VII වන කොටස

### බලපත්‍ර දීම

බලපත්‍ර නොලත් විදුලිය උත්පාදනය සහ බෙදාහැරීම වරදක් බව

**19.** (1) යම් තැනැත්තකු විසින් -

(අ) විදුලිය උත්පාදනය කිරීම;

(ආ) උත්පාදන බලපත්‍රලාභියකුගෙන් බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට හෝ සම්ප්‍රේෂණ ජාලයට සම්බන්ධ වී ඇති වෙනත් යම් සුදුසුකම්ලත් පාරිභෝගිකයකුට

හෝ දේශීය, කලාපීය හෝ අන්තර්ජාතික වෙළෙඳපොළේ යම් අස්තිත්වයකට හෝ අස්තිත්වයකින් තොග වශයෙන් විදුලිබලය සම්ප්‍රේෂණය කිරීම;

(ඇ) 10 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි ජාතික පද්ධති ක්‍රියාකරුගේ කාර්ය ඉටු කිරීම;

(ඈ) යම් පරිශ්‍රයකට හෝ යම් පාරිභෝගිකයකුට හෝ අලෙවිකරුවකුට විදුලි සම්බන්ධතාවක් ලබා දීමේ කාර්යය සඳහා විදුලිබලය බෙදා හැරීම සහ සැපයීම හෝ බෙදා හැරීම,

එකී තැනැත්තාට පනත ප්‍රකාරව ඔහුට ප්‍රදානය කළ බලපත්‍රයක් ප්‍රකාරව එසේ කිරීමට බලය දී ඇත්නම් හෝ විදුලි සැපයුම අනන්‍යයෙන් ම පෞද්ගලික භාවිතය සඳහා භාවිත කරන්නේ නම් හෝ 28 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති තැනැත්තකු නම් මිස, එසේ නොකළ යුතු ය.

(2) මේ පනත යටතේ තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාර බලය යටතේ හෝ මේ පනත යටතේ ප්‍රදානය කළ නිදහස් කිරීමක් යටතේ හැර -

(අ) යම් පාරිභෝගිකයකුට හෝ පරිශ්‍රයකට විදුලි සම්බන්ධතාවයක් ලබා දීමේ කාර්යය සඳහා විදුලිය උත්පාදනය කරන, සම්ප්‍රේෂණය කරන හෝ බෙදා හරින; හෝ

(ආ) විදුලිය අපනයනය කරන හෝ ආනයනය කරන,

යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව, වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂ තුනකට නොඅඩු දඩයකට හෝ මාස හයකට නොඅඩු සහ වසරකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වරදක් සඳහා තැනැත්තකුට නඩු පවරනු ලබන අවස්ථාවක දී, ඒ උපවගන්තිය යටතේ පනවන දඬුවමට අමතරව, අධිකරණය විසින්, වරදකරු කළ තැනැත්තාට, (1) වන උපවගන්තිය යටතේ එකී තැනැත්තා විසින් වරදකරුවකු කළ කටයුත්ත, ඒ වගන්තියෙන් නියම කර ඇති පරිදි එකී තැනැත්තා විසින්, ඒ කටයුත්ත සඳහා බලපත්‍රයක් ලබා ගන්නා තෙක්, වහාම ක්‍රියාත්මක වන පරිදි කරගෙන යාමෙන් වළකින ලෙස තවදුරටත් නියෝග කළ යුතු ය.

(4) නියාමකගේ ලිඛිත අනුමතය ඇතිව මිස, මේ වගන්තිය යටතේ වන වරදක් සම්බන්ධයෙන් කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමේ යෝග්‍යතාවය

**20.** (1) ඕනෑම තැනැත්තකු උත්පාදන බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය.

(2) පහත සඳහන්-

(අ) අවස්ථාවෝචිත පරිදි, 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ රජයට අයිති ව්‍යාපාර ව්‍යවසායන් පොදු සමාගම් බවට පරිවර්තනය කිරීම පනත යටතේ හෝ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ හෝ සංස්ථාපිත කළ සමාගමක්;

(ආ) 1972 අංක 5 දරන ජාතික රාජ්‍ය සභාවේ සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කළ සමිතියක්,

බෙදාහැරීමේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය.

(3) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත, ශ්‍රී ලංකා රජය විසින් -

(අ) සියයට සියයක ප්‍රතිශතයකින් එහි කොටස් දරන සීමාසහිත සමාගමක් පමණක් ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය;

(ආ) සියයට පනහකට වැඩි ප්‍රතිශතයකින් එහි කොටස් දරන සීමාසහිත සමාගමක් පමණක් ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය.

(4) නියමිත දින සිට බලාත්මක වන පරිදි -

(අ) උත්පාදන කාලසටහන්ගත කිරීම, උත්පාදන පිරියතවල වගකීම සහ පිරිමැසුම්දායක ප්‍රේෂණය, අනාගත විදුලි ඉල්ලුම් සපුරාලීම සඳහා සැලසුම, පද්ධති පාලන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සහ නඩත්තුව, උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් විදුලිබලය තොග වශයෙන් ප්‍රසම්පාදනය කිරීම සහ එකී තොග වශයෙන් ප්‍රසම්පාදිත විදුලිබලය බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට විකිණීම සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ සියලු කර්තව්‍ය ජාතික පද්ධති ක්‍රියාකරු වෙත පවරනු ලැබිය යුතු ය; සහ

(ආ) බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට විදුලිබලය තොග වශයෙන් සම්ප්‍රේෂණය කිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සමන්විත වන භෞතික යටිතල පහසුකම්වල නඩත්තුව සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ සියලු කර්තව්‍ය 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු වෙත පවරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති සීමා කිරීමට යටත්ව, 10 වන වගන්තියේ (11) වන උපවගන්තියේ (ඇ) ඡේදයට සහ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව සම්ප්‍රේෂණ වත්කමක් ඉදිකිරීමට අයිතිවාසිකමක් අත්පත් කරගත් යම් තැනැත්තකුට අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍ර ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(6) තනි සමාගමක සියයට පනහකට වැඩි කොටස් ප්‍රමාණයක් සෘජුව හෝ වක්‍රව දරන්නා වූ තැනැත්තකුට පහත දැක්වෙන කවර හෝ බලපත්‍ර දෙකක සංයෝජනයක් ප්‍රදානය කරනු නොලැබිය යුතු යː-

(අ) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය සහ උත්පාදන බලපත්‍රයක්;

(ආ) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය සහ බෙදාහැරීමේ බලපත්‍රයක්;

(ඇ) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය සහ ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රයක්;

(ඈ) ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය සහ බෙදාහැරීමේ බලපත්‍රයක්;

(ඉ) ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය සහ උත්පාදන බලපත්‍රයක්; හෝ

(ඊ) උත්පාදන බලපත්‍රයක් සහ බෙදාහැරීමේ බලපත්‍රයක්.

බලපත්‍රයක් සඳහා වන අයදුම්පත සහ බලපත්‍රය ප්‍රදානය

**21.** (1) විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදාහැරීම හෝ සැපයීම සඳහා හෝ බලපත්‍රයක් ප්‍රදානය කිරීමට හෝ එකී කුමන හෝ බලපත්‍රයක දීර්ඝ කිරීමක් සඳහා වන අයදුම්පතක් නියම කරනු ලැබිය යුතු පරිදි ඒ යම් ආකෘතියකින් නියාමක වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එය නියම කළ යුතු පරිදි වූ යම් තොරතුරු සහ ලේඛන සහ යම් ගාස්තුවලින් සමන්විත විය යුතු ය.

(2) අයදුම්පත ලැබුණු පසු, අදාළ අයදුම්පත මගින් හෙළිදරව් කළ තොරතුරු මත පදනම්ව අයදුම්කරුට බලපත්‍රයක් නිකුත් කිරීමට කිසිදු බාධාවක් නොමැති බව පෙනී යන බවට නියාමකගේ මතය වන්නේ නම්, නියාමක විසින්, අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව, බලපත්‍රය නිකුත් කිරීමෙන් හෝ එය දීර්ඝ කිරීමෙන් බලපෑම් ඇති විය හැකි තැනැත්තන්ට දැනුම් දීම පිණිස අරමුණු කරන ලද ව්‍යාපෘතියේ තොරතුරු සමඟ බලපත්‍රය හෝ අයදුම් කරන ලද දීර්ඝ කිරීම ප්‍රදානය කිරීමට එය අදහස් කරන බවට නියාමකගේ නිල වෙබ් අඩවියේ හෝ ගැසට් පත්‍රයේ හෝ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් දේශීය පුවත්පතක දැන්වීමක් පළ කිරීම ඇතුළුව එකී බලපත්‍රය හෝ අයදුම් කරන ලද දීර්ඝ කිරීම ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම ආරම්භ කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන සෑම දැන්වීමක ම-

(අ) බලපත්‍රය අයදුම් කරන්නේ කවර කාර්යයක් සඳහා ද යන්න සහ අයදුම්කරුට බලපත්‍රය හෝ දීර්ඝ කිරීම ප්‍රදානය කිරීමට නියාමක විසින් අදහස් කරන බව;

(ආ) එකී බලපත්‍රය හෝ දීර්ඝ කිරීම ප්‍රදානය කිරීමට අරමුණු කරන හේතු; සහ

(ඇ) එකී ව්‍යාපෘතියේ කටයුතුවලට හෝ එකී අරමුණු කරන ලද ව්‍යාපෘතියේ තත්ත්වයට හෝ එකී බලපත්‍රය ප්‍රදානය කිරීමට විරුද්ධ වීමට අදාළව තැනැත්තන්ගේ සැලකිරීම් ප්‍රකාශ කරමින් නියාමක වෙත සිදු කළ හැකි ලිඛිත කරුණු දැක්වීමේ කාලසීමාව දැන්වීම පළ කරන දින සිට දින විසි අටකට නොඅඩු විය යුතු බවට,

ප්‍රකාශ කළ යුතු ය.

(4) එම බලපත්‍රය ප්‍රදානය කිරීමට එරෙහිව ලිඛිත කරුණු දැක්වීම් ලැබුණු පසුව, නියාමක විසින්, කාරණය විභාග කිරීමට නීති සහ ඉංජිනේරු ක්ෂේත්‍රවල වසර දහයකට නොඅඩු පළපුරුද්ද සහ විශිෂ්ටත්වය ඇති සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් පත් කළ යුතු ය. (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ දක්වා ඇති අදාළ තැනැත්තන්ට ඔවුන්ගේ කරුණු දැක්වීම් සිදු කිරීමට අවසර දී යම් විභාග සිදු කර, ස්ථාන පරීක්ෂණයෙන් පසුව විනිශ්චය මණ්ඩලය විසින් ලිඛිතව එහි නිර්දේශය නියාමක වෙත දැනුම් දිය යුතු ය.

(5) නියාමක විසින්, (4) වන උපවගන්තිය යටතේ විනිශ්චය මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයට අනුකූලව, නිර්දේශය ලැබුණු දින සිට දින අනූවක් ඇතුළත ඉල්ලුම්කරුට ඒ සම්බන්ධයෙන් දැනුම් දිය යුතු එහි තීන්දුව ලබා දිය යුතු ය.

(6) (අ) නියාමකගේ තීන්දුව මගින් කරුණු දැක්වීම නිෂ්ප්‍රභ කරන්නේ නම්, එවිට, නියාමක විසින් අයදුම් කරන ලද බලපත්‍රය ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතු අතර, එකී බලපත්‍රය අදාළ එක් එක් බලපත්‍ර කාණ්ඩය ඒ සම්බන්ධයෙන් නියම කරනු ලැබිය යුතු ආකෘතියකින් විය යුතු ය.

(ආ) එක් එක් බලපත්‍ර කාණ්ඩයට අදාළ නියම සහ කොන්දේසි ද නියම කරනු ලබන පරිදි විය යුතු අතර, අයදුම්කරුට නිකුත් කරන ලද බලපත්‍රයට, ප්‍රදානය කරනු ලබන අදාළ බලපත්‍රයට අදාළ නියම සහ කොන්දේසි නිශ්චිතව දක්වනු ලබන උපලේඛනයක් ඇතුළත් විය යුතු ය.

(7) මේ කොටස ප්‍රකාරව නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම, නියම කරනු ලබන පරිදි,-

(අ) බලපත්‍රවල කොන්දේසිවලට;

(ආ) අදාළ බලපත්‍ර කාණ්ඩවල බලතල සහ කාර්යයන්ට;

(ඇ) II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයේ බලපත්‍රලාභීන් විසින් භාරගන්නා ලද ඉදිකිරීමේ සහ නඩත්තු කටයුතු ක්‍රියාවට නැංවීම සඳහා වන අවසර පත්‍ර සහ නිෂ්කාශන ලබා ගැනීමට අදාළ වන විධිවිධානවලට;

(ඈ) III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයේ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් අනුකූල විය යුතු විදුලි බලය සැපයීමට අදාළ ප්‍රමිතීන්ට සහ කාර්යපටිපාටිවලට; සහ

(ඉ) IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයේ විදුලිබල පරිභෝජනය මනු කියවීමට අදාළ කාර්යපටිපාටියට,

යටත් විය යුතු අතර, ඒවා එකී එක් එක් බලපත්‍රලාභියාට අදාළ විය යුතු ය.

බලපත්‍ර පැවරීම

**22.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, බලපත්‍රයක් පැවරීමේ දී ඒ පැවරීමට බලය ලබා දෙන යම් කොන්දේසියක් සහිතව හෝ රහිතව පැවරීමේ හැකියාව තිබිය යුතු ය.

(2) නියාමකගේ පූර්ව එකඟත්වය ඇතිව මිස, බලපත්‍රයක් පවරනු ලැබීමේ හැකියාව නොතිබිය යුතු ය.

(3) 21 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කළ අයදුම් පත්‍රය අනුමත කරන්නේ ද නොකරන්නේ ද යන්න තීරණය කිරීමේ දී නියාමක විසින් පැවරුම්ලාභියාට අනුරූප බලපත්‍රයක් හෝ අනුරූප බලපත්‍රයක කොටසක් ප්‍රදානය කරන්නේ ද නොකරන්නේ ද යන්න තීරණය කිරීමේ දී අදාළ කරගනු ලැබිය හැකි සමාන නිර්ණායක ම අදාළ කරගනු ලැබිය යුතු ය.

(4) පැවරුම්ලාභියා විසින්-

(අ) පාරිභෝගිකයන්ගේ අයිතීන් සුරැකීමේ කාර්යය සඳහා නියාමක විසින් අවශ්‍ය යයි සලකනු ලබන බලපත්‍රයේ කොන්දේසි විකරණය කිරීමට හෝ යම් වැඩිදුර කොන්දේසි පැනවීමට; සහ

(ආ) නියාමක විසින් අවශ්‍ය යයි සලකනු ලබන කොන්දේසිවල යම් අතුරු හෝ ආනුෂංගික විකරණවලට,

එකඟ වීමට යටත්ව, (3) වන උපවගන්තිය ප්‍රකාරව අනුමතය ලබා දිය හැකි ය.

(5) නිශ්චිතව දක්වනු ලබන යම් කොන්දේසිවලට පැවරුම්ලාභියා විසින් අනුකූල වන බවට යටත්ව, බලපත්‍රයක පැවරීමට බලය දෙන කොන්දේසි ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(6) (අ) බලපත්‍රය පැවරීමට හැකියාවක් නොමැති නම්-

(ආ) පැවරීම හෝ අපේක්ෂිත පැවරීම බලපත්‍රයේ කොන්දේසියක් උල්ලංඝනය කරන්නේ නම්; හෝ

(ඇ) (2) වන උපවගන්තිය යටතේ එකඟත්වය ලබා දුන්නේ යම් කොන්දේසියකට යටත්ව ද, එකී කොන්දේසිය පැවරීමට හෝ අපේක්ෂිත පැවරීමට පෙර උල්ලංඝනය කරනු ලැබ තිබේ නම්,

බලපත්‍රයක පැවරීමක් හෝ අපේක්ෂිත පැවරීමක් බල රහිත විය යුතු ය.

බලපත්‍ර විකරණය හෝ අවලංගු කිරීම සහ බලාත්මක කිරීමේ නියෝග

**23.** (1) නියාමක විසින්, ජාතික යහපත සඳහා යම් බලපත්‍රයක් විකරණය කිරීමට අවශ්‍ය යයි පෙනී යන්නේ නම්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, නියම කරනු ලබන පරිදි සාමාන්‍ය අයදුමක අවස්ථානුගත කාරණාවල දී සහ විවිධ බලපත්‍ර කාණ්ඩවලට අදාළව නියම කරනු ලැබිය යුතු පරිදි යම් ආකාරයකින් සහ ආකෘතියකින් බලපත්‍රලාභියාගේ එකඟත්වය සහිතව හෝ රහිතව ප්‍රදානය කරනු ලබන නියමිත බලපත්‍රයේ කොන්දේසි විකරණය කිරීමට කටයුතු කළ යුතු ය.

(2) නියාමක විසින්, (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි පළ කරන ලද දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් එය වෙත ඉදිරිපත් කළ යම් කරුණු දැක්වීම් සලකා බැලීමෙන් පසුව සහ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, උත්පාදන බලපත්‍රයක් හෝ බෙදා හැරීමේ බලපත්‍රය හෝ ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය එකී බලපත්‍ර අවලංගු කිරීමට අදාළ නියමයන්ට අනුකූලව අවලංගු කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය ප්‍රකාරව යම් බලපත්‍රයක් අවලංගු කිරීමට පෙරාතුව නියාමක විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් සහ එකී අවලංගු කිරීම මගින් බලපෑම් ඇති විය හැකි තැනැත්තන්ගේ අවධානයට යොමු කිරීම පිණිස සුදුසු යයි එය සලකන වෙනත් යම් ආකාරයන්ගෙන් දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති බලපත්‍රය අවලංගු කිරීමට අදහස් කරන බවට සහ එසේ අදහස් කිරීමට හේතු සහ එකී අවලංගු කිරීමට එරෙහිව කරුණු දැක්වීම් ඉදිරිපත් කළ යුතු නිශ්චිත කාලසීමාවක් ප්‍රකාශ කළ යුතු ය. බලපත්‍රයක් අවලංගු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) (අ) යම් උත්පාදන, සම්ප්‍රේෂණ හෝ බෙදාහැරීමේ බලපත්‍රලාභියකු විසින් එවැනි බලපත්‍රලාභියකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක යම් කොන්දේසියක් හෝ යම් ව්‍යවස්ථාපිත නියමයක් උල්ලංඝනය කරනු ලබන බවට හෝ උල්ලංඝනය කිරීමට ඉඩ ඇති බවට නියාමක සෑහීමට පත් වන්නේ නම්, බලපත්‍රලාභියා විසින් ඒ කොන්දේසියට හෝ නියමයට අනුකූල වීම තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් විධිවිධානයක් ඇතුළත් බලාත්මක කිරීමේ නියෝගයක් නියාමක විසින් කරනු ලැබිය යුතු ය.

(ආ) බලාත්මක කිරීමේ නියෝගයක් -

(i) නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන පරිදි යම් දේ කිරීමට හෝ කිරීමෙන් වැළකීමට එය අදාළ වන බලපත්‍රලාභියාට නියම කරනු ලැබිය යුතු ය;

(ii) නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් කාලසීමාවක් සඳහා බලාත්මකව තිබිය යුතු ය; හෝ

(iii) නියාමක විසින්, ඕනෑම අවස්ථාවක දී, අවලංගු කිරීම හෝ විකරණය කිරීම කළ හැකි අතර, ඕනෑම අවස්ථාවක දී නියෝගයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව අවසානයේ දී බලාත්මක වීම නතර විය යුතු ය.

(5) (අ) (4) වන උපවගන්තිය යටතේ බලාත්මක කිරීමේ නියෝගයක් කිරීමට පෙර නියාමක විසින් -

(i) බලාත්මක කිරීමේ නියෝගයක් කිරීමට යෝජනා කරනු ලබන බව සඳහන් කරමින් ඒ නියෝගයෙන් බලපෑම්

ඇති විය හැකි තැනැත්තන්ගේ අවධානයට යොමු කිරීම පිණිස නියම කරනු ලබන යම් ආකාරයකින් දැන්වීමකින් පළ කරනු ලැබිය යුතු ය; සහ

(ii) දැන්වීමේ පිටපතක් සහ යෝජිත නියෝගයේ පිටපතක් බලපත්‍රලාභියා වෙත ලබා දිය යුතු ය.

(ආ) (අ) වන ඡේදයේ දක්වා ඇති දැන්වීමක -

(i) යෝජිත නියෝගය මගින් තහවුරු කර ගැනීමට අදහස් කරනු ලබන අනුකූලතාවයට අදාළ බලපත්‍ර කොන්දේසි හෝ ව්‍යවස්ථාපිත නියම;

(ii) නියාමකගේ මතය අනුව ඒ කොන්දේසිය හෝ නියමය උල්ලංඝනය කිරීමක් ස්ථාපනය කරනු ලබන ක්‍රියා හෝ නොකර හැරීම්;

(iii) නියාමකගේ මතය අනුව යෝජිත නියෝගය සිදු කිරීම සාධාරණීකරණය කරනු ලබන වෙනත් යම් කරුණු;

(iv) යෝජිත නියෝගයේ බලපෑම්; සහ

(v) බලපත්‍රලාභියා විසින් යෝජිත නියෝගයට ඉදිරිපත් කිරීම් හෝ විරෝධතා කළ හැකි, දැන්වීම සිදු කළ දින සිට දින විසි අටකට වඩා අඩු නොවන කාලසීමාව,

දක්වනු ලැබිය යුතු ය.

(ඇ) (4) වන උපවගන්තිය යටතේ බලාත්මක කිරීමේ නියෝගයක් කිරීමට පෙර, නියාමක විසින් (ආ) ඡේදය යටතේ එයට කරන ලද යම් ඉදිරිපත් කිරීම් සහ විරෝධතා සලකා බැලිය යුතු ය.

(ඈ) (i) ප්‍රශ්නගත කොන්දේසියට හෝ නියමයකට අනුකූල වීම අත්කර ගැනීම සඳහා බලපත්‍රලාභියා විසින් ගත යුතු බවට නියාමක සලකනු ලබන සියලු ක්‍රියාමාර්ග බලපත්‍රලාභියා විසින් ගැනීමට එකඟ වී තිබෙන බවට සහ සියලු ක්‍රියාමාර්ග ගනිමින් සිටින බවට; හෝ

(ii) උල්ලංඝනය කිරීම් හෝ සැක කරනු ලබන උල්ලංඝනය කිරීම් සුළු බවට,

නියාමක සෑහීමට පත් වන්නේ නම්, නියාමක විසින් බලාත්මක කිරීමේ නියෝගයක් නොකරනු ලැබිය යුතු ය.

(ඉ) බලාත්මක කිරීමේ නියෝගයක් කිරීමෙන් පසු ප්‍රායෝගිකව හැකි තාක් ඉක්මනින්, නියාමක විසින් -

(i) නියෝගය අදාළ වන බලපත්‍රලාභියා වෙත නියෝගයේ පිටපතක් දෙනු ලැබිය යුතු ය; සහ

(ii) නියෝගයෙන් බලපෑම් ඇති විය හැකි තැනැත්තන්ගේ අවධානයට යොමු කිරීම පිණිස නියම කරනු ලබන යම් ආකාරයකින් නියෝගය පළ කරනු ලැබිය යුතු ය.

(ඊ) බලාත්මක කිරීමේ නියෝගයක් අවලංගු කිරීමට පෙර, නියාමක විසින් -

(i) යෝජිත අවලංගු කිරීමේ නියෝගය මගින් බලපෑම් ඇති විය හැකි තැනැත්තන්ගේ අවධානයට යොමු කිරීම පිණිස නියම කරනු ලබන යම් ආකාරයකින් දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය;

(ii) යෝජිත අවලංගු කිරීමේ නියෝගයේ පිටපතක් බලපත්‍රලාභියාට දෙනු ලැබිය යුතු ය; සහ

(iii) දැන්වීමට ප්‍රතිචාර වශයෙන් කරන ලද යම් ඉදිරිපත් කිරීම් සහ විරෝධතා සලකා බලනු ලැබිය යුතු ය.

(උ) (ඊ) වන ඡේදය යටතේ පළ කරනු ලබන සෑම දැන්වීමක් ම -

(i) දැන්වීමේ නිශ්චිතව දක්වන ලද නියෝගය අවලංගු කිරීමට නියාමක යෝජනා කරනු ලබන බව සහ අවලංගු කිරීමේ බලපෑම සඳහන් කරනු ලැබිය යුතු ය; සහ

(ii) යෝජිත අවලංගු කිරීමේ නියෝගයට කරනු ලබන ඉදිරිපත් කිරීම් හෝ විරෝධතා නියාමක වෙත කළ යුතු, දැන්වීම පළ කළ දින සිට දින විසිඅටකට පසු නොවන කාලසීමාවක් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(ඉ) (ඊ) වන ඡේදය යටතේ පළ කරන ලද දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් කරන ලද යම් ඉදිරිපත් කිරීම් සහ විරෝධතා සලකා බැලීමෙන් පසුව දැන්වීම අදාළ වන බලාත්මක කිරීමේ නියෝගය අවලංගු නොකිරීමට නියාමක තීරණය කරනු ලබන්නේ නම්, එය එහි තීරණය පිළිබඳ දැන්වීම, බලපත්‍රලාභියාට සහ බලපෑම් ඇති වන තැනැත්තන් වෙත ලබාදිය යුතු ය.

(6) (අ) බලාත්මක කිරීමේ නියෝගයක් අදාළ වන බලපත්‍රලාභියකුගේ කාර්යය විය යුත්තේ එකී බලාත්මක කිරීමේ නියෝගයට අනුකූලව කටයුතු කිරීම වේ.

(ආ) බලපත්‍රලාභියා විසින් බලාත්මක කිරීමේ නියෝගය උල්ලංඝනය කිරීමක් මගින් බලපෑමට ලක්විය හැකි යම් තැනැත්තකු කෙරෙහිද වගකීමක් ඇති අතර, ඒ උල්ලංඝනය කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස යම් පාඩුවක් හෝ හානියක් දරන ලද එවැනි යම් තැනැත්තකු විසින් ඒ පාඩුව හෝ හානිය සඳහා වන්දි ලබා ගැනීමට නිසි අධිකරණ බලය සහිත අධිකරණයක බලපත්‍රලාභියාට එරෙහි නඩුවක් ගොනු කරනු ලැබිය හැකි ය.

(ඇ) (ආ) වන ඡේදය යටතේ බලපත්‍රලාභියකුට එරෙහිව ගන්නා ලද නඩුකටයුතුවල දී, බලාත්මක කිරීමේ නියෝගය උල්ලංඝනය කිරීම වැළැක්වීම සඳහා බලපත්‍රලාභියා විසින් සියලු සාධාරණ පියවර ගත් බව සහ සියලු නිසි උද්‍යෝගයෙන් යුතුව කටයුතු කළ බව ඔප්පු කිරීම බලපත්‍රලාභියාට විත්තිවාචකයක් විය යුතු ය.

(7) (අ) බලාත්මක කිරීමේ නියෝගයක් අදාළ වන බලපත්‍රලාභියකු ඒ සම්පූර්ණ බලාත්මක කිරීමේ නියෝගයට හෝ එහි කොටසකට අනුකූල වීමට අපොහොසත් වන්නේ නම්, එවැනි බලපත්‍රලාභියකු මේ පනත යටතේ වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් අනතුරුව වරදකට වරදකරු කිරීමේ දී රුපියල් මිලියනයකට නොඅඩු සහ රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට සහ ඒ වරදකරු කිරීමෙන් පසුව ඒ උල්ලංඝනය කිරීම අඛණ්ඩව සිදු කරනු ලබන එක් එක්

දිනය සඳහා රුපියල් ලක්ෂ පහ බැගින් වන වැඩිදුරටත් වූ දඩයකට යටත් විය යුතු ය.

(ආ) බලාත්මක කිරීමේ නියෝගයක් කිරීමේ දී, එම නියෝගය අදාළ වන බලපත්‍රලාභියා විසින් ඒ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති උල්ලංඝනය කිරීම මගින් බලපෑමට ලක්වන යම් තැනැත්තකුට වන්දි ගෙවිය යුතු බවට විධාන කිරීමට නියාමකට හිමිකම් තිබිය යුතු ය.

(ඇ) මේ වගන්තිය යටතේ පැනවිය හැකි දඩයක සහ වන්දියක ආකාරයෙන් වන අයකිරීම, අනුකූලව කටයුතු නොකිරීමට වරදකරු වන තැනැත්තාට ඇති විය හැකි වෙනත් යම් වගකීම්වලට අමතරව සහ ඒ වගකීම් හීන නොවන පරිදි විය යුතු ය.

(ඈ) යම් බලපත්‍රලාභියකු යම් බලාත්මක කිරීමේ නියෝගයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීමට එරෙහිව නියාමක විසින් අපරාධ නඩුවක් ගොනු කර තිබෙන බව නොසලකා, බලපත්‍රලාභියා විසින් ඒ බලාත්මක කිරීමේ නියෝගයට අනුකූල වීම සහතික කිරීම සඳහා වාරණ නියෝගයක් සඳහා හෝ වෙනත් ප්‍රතිකර්මයක් සඳහා නියාමක විසින් නිසි බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(8) (අ) (i) නියාමක විසින් කරන ලද බලාත්මක කිරීමේ නියෝගයකට යටත් වන; හෝ

(ii) බුන්වත්භාවයකට යටත් වන,

බලපත්‍රලාභියකු විසින් බලපත්‍රය යටතේ ඒ බලපත්‍රලාභියාට කරගෙන යාමට බලය ලබා දෙන ලද කටයුතු නිසි ලෙස කරගෙන නොයන බවට සහ කාර්යක්ෂම, ආරක්ෂිත සහ සුරක්ෂිත ආකාරයකින් පාරිභෝගිකයන්ට විදුලිය සැපයීම ලබා දී නොමැති බවට හෝ ලබා දීමට ඉඩ නොමැති බවට නියාමක සෑහීමට පත් වන අවස්ථාවක දී, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, නියාමක විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් බලපත්‍රලාභියාගේ සම්පූර්ණ ව්‍යාපාර කටයුත්තේ ම හෝ ඉන් කොටසක කළමනාකරණය සහ පාලනය නියමයේ නිශ්චිතව දක්වා ඇති යම් වෙනත් අධිකාරියකට හෝ තැනැත්තකුට පවරනු ලැබිය හැකි අතර, ඒ ව්‍යාපාර කටයුත්ත කරගෙන යාම සඳහා අවශ්‍ය සියලු බලතල ඒ අධිකාරියට හෝ තැනැත්තාට තිබිය යුතු ය.

(ආ) (අ) වන ඡේදය යටතේ ව්‍යාපාර කටයුත්තක කළමනාකරණය සහ පාලනය සතු කරන ලද යම් තැනැත්තකු හෝ අධිකාරියක්, බලපත්‍රලාභියාගේ ව්‍යාපාර කටයුත්තේ කළමනාකාරිත්වය සහ පාලනය අඛණ්ඩව සිදු කිරීම යන පදනම මත 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ වංචනික වරණීයත්වයකට ගැනෙන ක්‍රියාවක් සඳහා වගකීමට යටත් නොවිය යුතු ය.

(ඇ) මේ වගන්තිය යටතේ කිසිදු නියමයක්, යෝජිත නියමය පිළිබඳ ලිඛිත දැන්වීම අදාළ බලපත්‍රලාභියා වෙත ලබා දීමෙන් තොරව සහ බලපත්‍රලාභියාට ඒ සම්බන්ධව කරුණු කියාපෑමට සාධාරණ අවස්ථාවක් ලබා දීමෙන් තොරව කරනු නොලැබිය යුතු ය.

(ඈ) මේ වගන්තිය යටතේ වන නියෝගයක් බලාත්මකව පවත්නා යම් කාලසීමාවක් අතරතුර -

(i) නියාමකගේ කැමැත්ත නොමැතිව, බලපත්‍රලාභියා ස්වේච්ඡාවෙන් හෝ අනිවාර්යයෙන් වසා දමනු නොලැබිය යුතු ය; හෝ දිගට ම ස්වේච්ඡාවෙන් හෝ අනිවාර්යයෙන් වසා දමනු ලැබීමට කටයුතු කරනු නොලැබිය යුතු ය;

(ii) නියාමකට දින දහයක පූර්ව ලිඛිත දැන්වීමක් ලබා දීමෙන් තොරව කිසිදු තැනැත්තකු විසින් ඒ බලපත්‍රලාභියාගේ දේපළ මත නඩු තීන්දුවක් හෝ ඇපයක් බලාත්මක කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට හෝ කිසිදු පියවරක් ගනු නොලැබිය යුතු ය; සහ

(iii) බලපත්‍රලාභියා විසින් ව්‍යාපාර කටයුත්තට හෝ එහි කොටසකට අදාළ බලපත්‍රය යටතේ වන ඔහුගේ කිසිදු අයිතිවාසිකමක් ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

(ඉ) මේ වගන්තියේ "බුන්වත්භාවය" යන්නෙන්,-

(i) ඒකාබද්ධ කිරීමේ හෝ ප්‍රතිසැකසුම් කාර්ය සඳහා හැර, බලපත්‍රලාභියකු වසා දැමීම සඳහා යෝජනා සම්මතයක් සම්මත කර ගැනීම;

(ii) බලපත්‍රලාභියා බලපත්‍රලාභියාගේ ණයකරුවන් සමඟ එකඟතාවයකට එළඹීම;

(iii) බලපත්‍රලාභියා විසින් ණය ගෙවීම අත්හිටුවීම හෝ බලපත්‍රලාභියාගේ ණය ගෙවීමට බලපත්‍රලාභියා සතු නොහැකියාව හෝ බලපත්‍රලාභියා බංකොලොත් ලෙස හෝ බුන්වත් ලෙස ප්‍රකාශයට පත් කිරීම; හෝ

(iv) බලපත්‍රලාභියා වසා දැමීම සඳහා වන පෙත්සමක් ගොනු කිරීම,

අදහස් වේ.

(9) මේ වගන්තිය ප්‍රකාරව බලපත්‍රයක් අවලංගු කිරීමේ දී, අමාත්‍යවරයා විමසා නියාමක විසින් බලපත්‍රය අවලංගු කරන ලද බලපත්‍රලාභියාගේ ව්‍යාපාරයේ කළමනාකාරිත්වය සහ පාලනය සමාන කටයුත්තක යෙදීමට වලංගු බලපත්‍රයක් දරන්නා වූ යම් අස්තිත්වයකට පැවරීමට අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය හැකි ය. ඒ පැවරීම කළ යුත්තේ යම් නියම සහ කොන්දේසි යටතේ ද, ඒ නියම සහ කොන්දේසි නියම කරනු ලබන පරිදි විය යුතු ය.

උත්පාදන බලපත්‍රලාභීන් සඳහා අතිරේක කොන්දේසි

**24.** උත්පාදන බලපත්‍රලාභියකුට -

(අ) උත්පාදන මධ්‍යස්ථාන, බැඳි මාර්ග, උපපොළවල් සහ සමර්පිත සම්ප්‍රේෂණ මාර්ග සහ එයට සම්බන්ධිත වෙනත් යම් ආශ්‍රිත උපාංග පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යෑමට;

(ආ) ජාතික පද්ධති ක්‍රියාකරු සහ ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු අවශ්‍යයයි හෝ යෝග්‍ය යයි සලකන පරිදි උත්පාදන පද්ධතියට අදාළ යම් තාක්ෂණික හෝ මෙහෙයුම් කේත, ප්‍රමිති හෝ පරාමිතීන් ක්‍රියාවේ යෙදවීමට සහ පවත්වාගෙන යාමට;

(ඇ) තැනැත්තන්, විදුලි පිරියත සහ උපාංගවලට වන හානි සහ අලාභහානි වැළැක්වීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට;

(ඈ) විදුලි මාර්ග, කේබල්, විදුලි පිරියත සහ ඉන්ධන පාලන හා ආශ්‍රිත උපාංග වැඩිදියුණු කිරීමට සහ නඩත්තු කිරීමට;

(ඉ) 13 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, වෙනත් යම් බලපත්‍රලාභියකුට හෝ පාරිභෝගිකයකුට විදුලිය අලෙවි කිරීමට;

(ඊ) එහි උත්පාදන මධ්‍යස්ථානවලට අදාළ තාක්ෂණික තොරතුරු නියාමකට භාරදීමට; සහ

(උ) එකී බලපත්‍රලාභියා විසින් උත්පාදනය කළ විදුලිය සම්ප්‍රේෂණය කිරීම සඳහා ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු සහ ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රලාභියා සමඟ සම්බන්ධීකරණය වීමට,

හිමිකම් ලැබිය යුතු ය.

බෙදා හැරීමේ බලපත්‍රලාභීන් සඳහා වන අතිරේක කොන්දේසි

**25.** (1) මේ පනත ප්‍රකාරව විදුලි සැපයුමක් අවශ්‍ය කරන යම් තැනැත්තකුට, ඒ සැපයුම සම්බන්ධයෙන් පහත කරුණු පිළිගන්නා ලෙස බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් නියම කළ හැකි යː-

(අ) අවම කාලසීමාවක් සඳහා සහ අවම පරිභෝජන අවශ්‍යතාවයන්ට යටත්ව, එකී විදුලි සැපයුම අඛණ්ඩව ලබාගෙන ඒ සඳහා ගෙවීම කරගෙන යාමට එකී තැනැත්තාට නියම කරන යම් නියම;

(ආ) මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකට හෝ මේ පනතේ කාර්ය සඳහා නියම කරනු ලැබිය යුතු වන විදුලි සැපයුම් සංග්‍රහයට අනුකූල වීමට එකී බලපත්‍රලාභියාට හැකියාව ඇති කිරීමේ කාර්යය සඳහා පනවනු ලැබීමට අවශ්‍ය කරනු ලැබිය හැකි යම් සීමා කිරීම්; සහ

(ඇ) සියලු අවස්ථානුගත කරුණුවල දී ඒ තැනැත්තා විසින් පිළිගැනීම සාධාරණ වන්නා වූ, කවරාකාරයකින් හෝ උද්ගත වන එකී තැනැත්තා විසින් අත්විඳින යම් ආර්ථික, ආනුෂංගික හෝ වෙනත් වක්‍රාකාර පාඩුවක් සඳහා එකී බලපත්‍රලාභියාගේ යම් වගකීමක් සීමා කිරීමේ යම් නියම.

(2) බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්, ඔහුගේ සැපයුම් ප්‍රදේශය තුළ බලපත්‍රලාභියාගේ පිරිවැයෙන් කාර්යක්ෂම, සම්බන්ධීකරණය කරන ලද සහ ආර්ථිකමය වශයෙන් ශක්‍යතාවයකින් යුත් බෙදා හැරීමේ පද්ධතියක් වැඩිදියුණු කර පවත්වාගෙන යාම සහ එකී ප්‍රදේශයේ පරිශ්‍රවල අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට, එකී අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් විසින් බෙදා හැරීමේ මාර්ග පිහිටුවීම සහ වෙනත් ආශ්‍රිත සම්බන්ධ කිරීමේ පහසුකම් වෙනුවෙන් මූලික වියදම් ගෙවීමේ අවශ්‍යතාවයෙන් තොරව, එකී සේවා සම්බන්ධතා

ගාස්තු ගෙවීමෙන් බෙදා හැරීමේ මාර්ගයේ ආසන්නම සම්බන්ධතා ස්ථානයේ සිට එකී පරිශ්‍රයේ මීටර් පෙට්ටිය දක්වා විදුලි සැපයුම් සම්බන්ධතාවක් ලබා ගැනීමට හැකි වන පරිදි මේ පනත ප්‍රකාරව විදුලිය සැපයීම බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(3) (අ) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින්, 11 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, විශේෂණයකින් තොර පදනමක් මත, පියසි මුදුනේ සූර්ය ජනක යන්ත්‍රය ඇතුළු කාවද්දන ලද උත්පාදකයකට සම්බන්ධ කිරීමකට එහි බෙදා හැරීමේ ජාලයට ඉඩ දිය යුතු ය.

(ආ) එකී ජාලයේ අන්තර් සම්බන්ධතාවය තාක්ෂණික සහ ආරක්ෂක අවශ්‍යතාවන්ට සහ නියම කරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් කොන්දේසිවලට අනුකූල වීමට යටත් විය යුතු ය.

(4) නියාමක විසින් 13 වන වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් තීරණය කරනු ලබන පරිදි යම් දිනයක සිට විවෘත ප්‍රවේශය ක්‍රියාත්මක කළ යුතු ය.

(5) (අ) බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ සැපයුම් ප්‍රදේශය තුළ ස්වකීය පරිශ්‍රය පිහිටා ඇති යම් තැනැත්තකුට වෙනත් යම් උත්පාදන බලපත්‍රලාභියකුගෙන් හෝ වෙනත් බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගෙන් විදුලිය සැපයුමක් අවශ්‍ය වන අවස්ථාවක දී, එකී තැනැත්තා විසින්, දැන්වීමක් මගින්, 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව නියාමක විසින් සාදනු ලබන රීතිවලට අනුව එකී විදුලි සැපයුමට විවෘත ප්‍රවේශය ලබා දෙන ලෙසට එකී තැනැත්තාගේ පරිශ්‍රය ස්වකීය සැපයුම් ප්‍රදේශය තුළ පිහිටා ඇති බෙදා හැරීමේ බලපත්‍රලාභියා ගෙන් ඉල්ලා සිටිය හැකි අතර, එකී සැපසුම සම්බන්ධයෙන් එකී තැනැත්තාගේ පරිශ්‍රය ස්වකීය සැපයුම් ප්‍රදේශය තුළ පිහිටා ඇති බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ කාර්ය විශේෂණයකින් තොරවී විවෘත ප්‍රවේශයක් ලබා දෙන පොදු වාහකයකුගේ කාර්ය විය යුතු ය.

(ආ) නියාමක විසින් පාරිභෝගිකයකුට හෝ පාරිභෝගිකයන් කාණ්ඩයකට ඔහුගේ සැපයුම් ප්‍රදේශයේ බෙදා හැරීමේ බලපත්‍රලාභියකු නොවන තැනැත්තකුගෙන් විදුලි සැපයුමක් ලබා ගැනීමට අවසර ලබා දෙන අවස්ථාවක, එකී බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ විදුලිබල සැපයුම් වගකීමෙන් උද්ගත වන ස්ථාවර

ගාස්තු පියවීමට, නියාමක විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි, 13 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි විවෘත ප්‍රවේශ ගාස්තු ගෙවීමට එකී පාරිභෝගිකයා යටත් විය යුතු ය.

(ඈ) සෑම බෙදා හැරීමේ බලපත්‍රලාභියකු ම, නියමිත දිනය හෝ බලපත්‍රය ප්‍රදානය කරන දිනය යන දින වලින් කලින් එළඹෙන කවර හෝ දිනයක සිට මාස හයක කාලයක් තුළ, නියාමක විසින් සාදනු ලබන රීතිවලට අනුකූලව පාරිභෝගිකයන්ගේ දුක්ගැනවිලි විමසීමට සහ ඒ සඳහා සහනය සැලසීමට වේදිකාවක් සැපයීමට සංසදයක් පිහිටුවනු ලැබිය යුතු ය.

වියදම් ආපසු අයකර ගැනීම සඳහා වන බලය

**26.** (1) විදුලි සැපයුමක් ඉල්ලා සිටිනු ලබන යම් තැනැත්කුට විදුලිය සම්බන්ධතාවය ලබා දීමේ සහ සැපයීමේ කාර්යය සඳහා බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතයක් සපයනු ලබන අවස්ථාවක දී, අදාළ තැනැත්තාට මාර්ගය හෝ පිරියතය හෝ සම්බන්ධතාවය සැපයීමේ දී සහ විදුලිය සැපයීම සිදු කිරීමේ දී සාධාරණ ලෙස ඇති වූ යම් වියදම්, බෙදා හැරීමේ බලපත්‍රයෙහි කොන්දේසි මගින් අවසර දී ඇති තාක් දුරට, 25 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ තැනැත්තා විසින් දරනු ලැබීමට බලපත්‍රලාභියා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) විදුලි සැපයුමක් ඉල්ලා සිටින යම් තැනැත්තකුට (1) වන උපවගන්තිය යටතේ බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට ඇති වූ වියදම් දැරීමට ප්‍රමාණවත් මාර්ගයක් නොමැති අවස්ථාවක දී, එවැනි තැනැත්තකු විසින් සම්මත අයක්‍රම ගිවිසුම ප්‍රකාරව අයක්‍රමය සහ බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් අයකරනු ලබන වෙනත් යම් ගාස්තු සමඟ සාධාරණ මාසික වාරිකවලින් ඒ වියදම් ගෙවීමේ පදනම මත අදාළ පරිශ්‍රයට විදුලිය සම්බන්ධතාවය ලබා දෙන ලෙස සහ විදුලිය සපයන ලෙස බෙදා හැරීමේ බලපත්‍රලාභියාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි යම් තැනැත්තකුට බලපත්‍රලාභියා වෙත ඇති වූ සම්පූර්ණ වියදම් දැරීමට ප්‍රමාණවත් මාර්ගයක් නොමැති බවට බෙදා හැරීමේ බලපත්‍රලාභියා සෑහීමට පත් වන අවස්ථාවක දී, එවැනි තැනැත්තකු විසින් අදාළ පරිශ්‍රයට මාර්ගය හෝ පිරියතය සැපයීමට පෙර හෝ විදුලිය සම්බන්ධ කිරීමට සහ සැපයීමට පෙර, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් යොමුවන ලද පරිශ්‍රයට මාර්ගය හෝ පිරියත හෝ විදුලිය සම්බන්ධ කිරීම සහ

සැපයීම කිරීමට පෙර, බෙදා හැරීමේ බලපත්‍රලාභියා වෙත ඇති වියදම් ඔහු විසින් දැරිය යුතු ආකාරයට අනුව බෙදා හැරීමේ බලපත්‍රලාභියා සමඟ ගිවිසුමකට එළඹීමට නියම කරනු ලැබිය යුතු ය.

(4) යම් බලපත්‍රලාභියකු වෙත ඇති වූ යම් වියදම් දැරීමට ප්‍රමාණවත් මාර්ගයක් යම් තැනැත්තකුට නොමැති බවට (3) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි සෑහීමට පත් වීමේ කාර්යය සඳහා, ඒ බෙදා හැරීමේ බලපත්‍රලාභියාට අවශ්‍ය වන තොරතුරු නියම කරනු ලබන පරිදි වන යම් මාර්ගෝපදේශ මත පදනම් විය යුතු ය.

(5) බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගෙන් විදුලි සැපයුමක් ඉල්ලා සිටින තැනැත්තකුට ඒ සැපයුම ලබා දීමේ කාර්යය සඳහා භාවිත කරනු ලබන යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතයක් සැපයීමේ දී සාධාරණ ලෙස ඇති වූ යම් වියදම් සම්බන්ධයෙන් -

(අ) බෙදා හැරීමේ මාර්ගය ඇතිරීම සහ සම්බන්ධතාවය සෑදීම අතර වන කාලසීමාව;

(ආ) ඒ වියදම්වලට අදාළව යම් වෙනත් තැනැත්තකු බලපත්‍රලාභියාට කර ඇති යම් ගෙවීමක්; සහ

(ඇ) බලපත්‍රලාභියාගේ වියදම් දැනටමත් බලපත්‍රලාභියා විසින් පියවා ගෙන ඇති ප්‍රමාණය,

සැලකිල්ලට ගනිමින්, සියලු අවස්ථානුගත කරුණුවල දී සාධාරණ වන යම් මුදලක් බලපත්‍රලාභියා වෙත ගෙවීමට නියාමක විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ නියාමක විසින් ලබා දෙන ලද විධානය මගින් යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතයක් සැපයීමේ දී සාධාරණ ලෙස දරන ලද වියදම් සම්බන්ධයෙන් යම් මුදලක් අයකර ගෙන ඇති බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට, ඒ ගෙවීම් කිරීමේ දී, ඒ වියදම් සඳහා පෙර දායක වී තිබෙන යම් තැනැත්තකුට නැවත ගෙවීම සුදුසු විය හැකි පරිදි වන, එසේ අයකර ගන්නා ලද යම් මුදලක් හෝ එහි කොටසක් අදාළ කරන ලෙස නියෝග කරනු ලැබිය හැකි ය.

(7) මේ වගන්තියේ "යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතයක් සැපයීමේ දී සාධාරණ ලෙස ඇති වූ යම් වියදම්" යන්නට, මේ වගන්තියේ කරන ලද යම් සඳහනකට, විදුලිය සැපයීම සඳහා බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් අයකරනු ලබන ගාස්තුවල කොටසක් ලෙස මාර්ගය හෝ පිරියතය නඩත්තු කිරීමේ දී ඇති වීමට ඉඩ ඇති යම් වියදම් බලපත්‍රලාභියකු විසින් නැවත අයකර නොගන්නා තාක් දුරට, එසේ ඇති වීමට ඉඩ ඇති යම් වියදම්වල ප්‍රාග්ධනිත වටිනාකමට කරන ලද සඳහනක් ඇතුළත් වේ.

ඇප ඉල්ලා සිටීම සඳහා ඇති බලය

**27.** (1) මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින්, විදුලි සම්බන්ධතාවක් සහ විදුලිබල සැපයුමක් ඉල්ලා සිටින යම් තැනැත්තකුගෙන් -

(අ) සැපයුමට අදාළව; හෝ

(ආ) එම සැපයුම සඳහා යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතයක් ලබා දීම අවශ්‍ය වන අවස්ථාවක, එම විදුලි මාර්ගය හෝ පිරියතය ලබා දීම සම්බන්ධයෙන්,

බලපත්‍රලාභියා වෙත ගෙවිය යුතු බවට පත් වන සියලු මුදල් ගෙවීම සඳහා සාධාරණ ඇපයක් ලබා දීමට ලිඛිත දැන්වීමක් මගින් ඉල්ලා සිටිය හැකි අතර, එම තැනැත්තා විසින් එකී ඇපය ලබා දීමට අසමත් වන්නේ නම්, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් එකී අසමත් වීම පවතින තාක්කල් සැපයුම ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හෝ එම විදුලි මාර්ගය හෝ පිරියතය ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හෝ කළ හැකි ය.

(2) යම් තැනැත්තකු විසින්, (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන පරිදි එකී ඇපය ලබා දී නොමැති අවස්ථාවක හෝ එකී තැනැත්තා විසින් දෙන ලද ඇපය ප්‍රමාණවත් නොවූ අවස්ථාවක -

(අ) බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් දැන්වීමක් මගින් දැන්වීම භාර දීමෙන් පසු දින හතක් ඇතුළත සැපයුමට අදාළව බලපත්‍රලාභියා වෙත ගෙවිය යුතු බවට පත් වන සියලු මුදල් ගෙවීම සඳහා සාධාරණ ඇපයක් ලබා දෙන ලෙස එම තැනැත්තාගෙන් ඉල්ලා සිටිය හැකි ය; සහ

(ආ) එම තැනැත්තා එකී ඇපය ලබා දීමට අසමත් වන්නේ නම්, බලපත්‍රලාභියා විසින්, එකී අසමත් වීම පවතින තාක්කල්, අවස්ථාවෝචිත පරිදි, සම්බන්ධතාව ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හෝ සැපයුම නතර කිරීම කළ හැකි ය.

(3) මේ වගන්තිය ප්‍රකාරව ඇපයක ආකාරයෙන් යම් මුදල් ප්‍රමාණයක් බෙදා හැරීමේ බලපත්‍රලාභියකු වෙත ලබා දෙන අවස්ථාවක, නියාමකගේ අනුමතය ඇතිව, බලපත්‍රලාභියා විසින්, කලින් කලට, නියම කරනු ලැබිය හැකි පොලී අනුපාතයට එම ඇපය බලපත්‍රලාභියා සතුව පවතින කාල පරිච්ඡේදය සඳහා එම මුදල් ප්‍රමාණය මත වන පොලිය, බලපත්‍රලාභියා විසින් ගෙවනු ලැබිය යුතු ය.

**28.** (1) යම් තැනැත්තකු හෝ තැනැත්තන් කාණ්ඩයක් විදුලිය උත්පාදනයේ සහ බෙදා හැරීමේ නිරත වන අවස්ථාවක දී සහ එසේ උත්පාදනය කළ විදුලි ධාරිතාවය හෝ ප්‍රමාණය නියාමක විසින්, ජාතික පද්ධති ක්‍රියාකරු විමසීමෙන් පසු, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වූ යම් ප්‍රමාණයකට වඩා පහළ මට්ටමක පවතින අවස්ථාවක දී, එකී තැනැත්තා හෝ තැනැත්තන් කාණ්ඩය, නීතිය ක්‍රියාත්මක වීම ප්‍රකාරව, ඒ සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් ව්‍යවස්ථාපිතව නිදහස් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. ව්‍යවස්ථාපිත නිදහස් කිරීම්

(2) එකී ව්‍යවස්ථාපිත නිදහස් කිරීම භුක්ති විඳින තැනැත්තා හෝ තැනැත්තන් කාණ්ඩය විසින් එම ව්‍යවස්ථාපිත නිදහස් කිරීම (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණය උල්ලංඝනය කරමින් සිටින බවට නියාමකගේ අවධානයට යොමු කරන අවස්ථාවක දී, නියාමක විසින් වහාම එකී තැනැත්තාට හෝ තැනැත්තන් කාණ්ඩයට එකී උත්පාදනයට සහ බෙදා හැරීමට සම්බන්ධ සියලු කටයුතු නවතා නොපමාව එකී කාර්යය සඳහා භාවිත කරන සියලු උපාංග විසන්ධි කරන ලෙසට දැනුම් දෙනු ලැබිය යුතු ය.

## VIII වන කොටස

### අයකුම

**29.** (1) (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අයකුම පැනවීමේ දී නියාමක විසින් යොදාගනු ලැබිය යුතු මූලධර්ම ජාතික අයකුම ප්‍රතිපත්තියේ අන්තර්ගත විය යුතු අතර, එය අනුමත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. අයකුම

(2) අයකුම පැනවීමේ දී, නියාමනය කරන ලද අස්ථීත්වයන්හි ආයෝජනය මත වූ සාධාරණ ලාභයක් ඇතුළත් කරමින් නියාමක විසින් මූල්‍ය අඛණ්ඩත්වය තහවුරු කරනු ලැබිය යුතු ය.

(3) ජාතික අයකුම ප්‍රතිපත්තියට අනුව නියාමක විසින් නියම කරනු ලබන පරිදි පැනවීමට අවශ්‍ය අයකුම පහතින් දැක්වේ:-

(අ) 11 වන වගන්තියේ (3) වන උපවගන්තියට අනුව, ජාතික පද්ධති ක්‍රියාකරු වෙත විදුලිබලය සපයන විදුලි උත්පාදකයන් වෙත ගෙවනු ලැබිය යුතු වන, සම්මත විදුලි මිල දී ගැනීමේ ගිවිසුම්වල ඇතුළත් කළ යුතු වන, සෑම මාස හයකට වරක් නිශ්චය කොට යාවත්කාලීන කරනු ලබන අවශෝෂක අයකුමය;

(ආ) 11 වන වගන්තියේ (1) වන උපවගන්තියට අනුකූලව ප්‍රසම්පාදනය කරන ලද නව උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් අයකරනු ලබන විදුලිය මිල දී ගැනීමේ අයකුමය;

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලයේ අනුප්‍රාප්තික සමාගම් වෙත නිකුත් කරනු ලබන උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් අයකරනු ලබන විදුලිබලය මිල දී ගැනීමේ අයකුමය සහ ඊට ඇතුළත් විය යුතු 18 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ දක්වා ඇති පරිදි එම අනුප්‍රාප්තික සමාගම්වලට වෙන් කරන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ ණය කොටසේ ණය ගෙවීමේ පිරිවැය;

(ඈ) බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට ගෙවිය යුතු ජාතික පද්ධති ක්‍රියාකරුගේ තොග විකුණුම් අයකුමය;

(ඉ) සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට ගෙවිය යුතු සම්ප්‍රේෂණ අයකුමය සහ විවෘත ප්‍රවේශ ගාස්තු;

(ඊ) බෙදා හැරීමේ ජාලයට සම්බන්ධ පාරිභෝගිකයන් සඳහා වන බෙදා හැරීමේ අයකුමය සහ සැපයුම් අයකුමය සහ සම්ප්‍රේෂණ ජාලයට සම්බන්ධ පාරිභෝගිකයන් සඳහා වන අදාළ සැපයුම් අයකුමයෙන් සමන්විත වන අවසන් පරිශීලක පාරිභෝගික අයකුමය; සහ

(උ) සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් අයකර ගත යුතු අනුමත ආදායම්.

(4) මේ වගන්තිය -

(අ) අවශ්‍ය වන විට, (මෙහි මින්මතු "තොග මිල දී ගැනීමේ අයකුමය" යනුවෙන් සඳහන් කරනු ලබන) උත්පාදකයන්ගෙන් හෝ කලාපීය වෙළෙඳපොළේ සැපයුම්කරුවන්ගෙන් විදුලිබලය ආනයනය කිරීම ඇතුළුව උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් තොග වශයෙන් විදුලිබලය ප්‍රසම්පාදනය කිරීම සඳහා;

(ආ) (මෙහි මින්මතු "තොග විකුණුම් අයකුමය" යනුවෙන් සඳහන් කරනු ලබන) බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට හෝ යම් පාරිභෝගිකයන්ට හෝ වෙළෙන්දන්ට හෝ අපනයන වෙළෙඳපොළේ ගනුදෙනුකරුවන්ට තොග වශයෙන් විදුලිය විකිණීම සඳහා,

ජාතික පද්ධති ක්‍රියාකරු විසින් අයකර ගත යුතු " අයකුම" සහ "වෙනත් ගාස්තු" සඳහා අදාළ විය යුතු ය:

එසේ වුව ද, IX වන කොටස ප්‍රකාරව විධිවිධාන සලසා ඇති ආකාරයෙන් "තොග විදුලිබල වෙළෙඳපොළ" පිහිටුවීම සහ 1 වන වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් තීරණය කරනු ලැබිය යුතු පරිදි යම් දිනයක සිට එය ක්‍රියාත්මක කිරීමත් සමග මේ උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදයන්හි නිශ්චිතව දක්වන ලද අයකුම, අදියරෙන් අදියර ආකාරයෙන් බලාත්මකව පැවතීම අවසන් විය යුතු ය.

(5) ජාතික අයකුම ප්‍රතිපත්තිය යටතේ අනුමත ආයෝජන මත සාධාරණ ප්‍රතිලාභ ඇතුළු යෝග්‍ය සාධාරණ පිරිවැය අයකර ගැනීමට අදාළ බලපත්‍රලාභීන්ට අවසර දෙමින් ජාතික අයකුම ප්‍රතිපත්තියට අනුකූලව පිරිවැය පිළිබිඹු කිරීමේ යාන්ත්‍රණයකට අනුව සියලු අයකුම පනවනු ලැබිය යුතු ය.

(6) විදුලිය බෙදා හැරීම සහ සැපයීම හෝ විදුලිය බෙදා හැරීම හෝ සැපයීම සඳහා බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් අයකර ගනු ලැබිය යුතු (මෙහි මින් මතු "බෙදා හැරීමේ සහ සැපයුම් අයකුම" යනුවෙන් සඳහන් කරනු ලබන) අවසන් පරිශීලක පාරිභෝගික අයකුමය -

(අ) පාරිභෝගික සේවාවන් ඇතුළු බෙදා හැරීමේ ජාලය පවත්වාගෙන යාමේ සහ ක්‍රියාත්මක කිරීමේ සාධාරණ පිරිවැය සලකා බැලීමකින් පසු ජාතික අයකුම ප්‍රතිපත්තිය මත පදනම්ව නියාමක විසින් පනවනු ලැබිය යුතු බෙදා හැරීමේ අයකුමයෙන්; සහ

(ආ) බෙදා හැරීමේ බලත්‍රලාභීන් විසින් ගෙවනු ලබන තොග මිල දී ගැනීමේ අයකුමයේ සහ සම්ප්‍රේෂණ අයකුමයේ පිරිවැය අත්කර ගැනීම සඳහා නියාමක විසින් පනවනු ලබන සැපයුම් අයකුමයෙන්,

සමන්විත විය යුතු යඃ

එසේ වුව ද, IX වන කොටස ප්‍රකාරව විධිවිධාන සලසා ඇති ආකාරයෙන් තොග විදුලිබල වෙළෙඳපොළ පිහිටුවීම සහ 1 වන වගන්තිය ප්‍රකාරව එය ක්‍රියාත්මක කිරීමත් සමඟ, සැපයුම් අයකුමය, වෙළෙඳපොළේ බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ විදුලිබලය ප්‍රසම්පාදනය කිරීමේ පිරිවැය යන පදනම මත තීරණය කරනු ලැබිය යුතු ය.

(7) සැකය දුරු කිරීම සඳහා-

(අ) බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් පනවනු ලබන අවසන් පරිශීලක පාරිභෝගික අයකුමය, එකිනෙකට වෙනස් අයකුම දෙකකින් එනම්, "විදුලිය බෙදා හැරීමේ අයකුමය" සහ "සැපයුම් අයකුමය" යන අයකුමවලින් සමන්විත බව;

(ආ) විවෘත ප්‍රවේශය තෝරා ගන්නා උත්පාදන බලපත්‍රලාභීන් සහ සුදුසුකම්ලත් වෙළෙන්දන් හෝ පාරිභෝගිකයන් අතර පවතින වාණිජමය ගිවිසුම් මත පදනම්ව විවෘත ප්‍රවේශ ගාස්තු තීරණය කරනු ලැබිය යුතු බැවින්, අනාගතයේ දිනයක විවෘත ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමත් සමඟ විවෘත ප්‍රවේශය තෝරා ගන්නා පාරිභෝගිකයන්ට අදාළ විය යුතු සැපයුම් අයකුමය නතර විය යුතු බව,

ප්‍රකාශ කරනු ලැබේඃ

එසේ වුව ද, විවෘත ප්‍රවේශය ප්‍රයෝජනයට ගන්නා යම් පාරිභෝගිකයන්ගෙන් විවෘත ප්‍රවේශ ගාස්තුවල කොටසක් ලෙස බෙදා හැරීමේ අයකුමය අයකර ගැනීමට, බෙදා හැරීමේ බලපත්‍රලාභියා හිමිකම් ලැබිය යුතු ය.

(8) සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් අයකර ගනු ලැබිය යුතු විවෘත ප්‍රවේශ ගාස්තු, විවෘත ප්‍රවේශ ගාස්තු තීරණය කිරීමට අදාළ වන ජාතික අයකුම ප්‍රතිපත්තියේ අදාළ විධිවිධාන ප්‍රකාරව නියාමක විසින් පනවනු ලැබිය යුතු ය.

(9) අවස්ථාවෝචිත පරිදි, තොග මිල දී ගැනීමේ අයකුමය, තොග විකිණීමේ අයකුමය, සම්ප්‍රේෂණ අයකුමය, විවෘත ප්‍රවේශ ගාස්තු සහ බෙදා හැරීමේ අයකුමය සහ සැපයුම් අයකුමය ජාතික අයකුම ප්‍රතිපත්තියට අනුව නියම කර ඇති පරිදි බලපත්‍රලාභීන් විසින් සිදු කරනු ලබන අයකුම ගොනු කිරීම් මත පදනම්ව නියාමක විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර-

(අ) එකී බලපත්‍රලාභියාට ප්‍රදානය කරන ලද බලපත්‍රය මගින් බලය දෙන ලද සියලු කටයුතු කාර්යක්ෂම පදනමක් මත ක්‍රියාවට නැංවීමේ දී සාධාරණ ආයෝජන මත ප්‍රතිලාභ ඇතුළු දරන ලද සියලු සාධාරණ පිරිවැය අයකර ගැනීමට අදාළ බලපත්‍රලාභියාට අවසර දිය යුතු ය; සහ

(ආ) පුළුල් මහජන දැනුම්වත්කම සහතික කරමින් නියාමක විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් පළ කරනු ලැබිය යුතු ය.

(10) අවස්ථාවෝචිත පරිදි, ජාතික පද්ධති ක්‍රියාකරුගේ, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරුගේ හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ බලපත්‍රවල, අවස්ථාවෝචිත පරිදි, තොග මිල දී ගැනීමේ අයකුමය සඳහා හෝ තොග විකිණීමේ අයකුමය සහ වෙනත් ගාස්තු සඳහා හෝ සම්ප්‍රේෂණ අයකුමය සහ වෙනත් ගාස්තු සඳහා හෝ විවෘත ප්‍රවේශ ගාස්තු සහ වෙනත් ගාස්තු සහ බෙදා හැරීමේ අයකුමය සහ සැපයුම් අයකුමය සහ වෙනත් ගාස්තු සඳහා විධිවිධාන ඇතුළත් විය යුතු ය. මේ සියලු අයකුම නියම කර ඇති ආකාරයෙන් නියාමක විසින් සිදු කරනු ලබන සමාලෝචනයකට යටත් විය යුතු ය. එසේම, එමගින් -

(අ) සම්ප්‍රේෂණ අයකුමය සහ බෙදා හැරීමේ අයකුම, විවෘත ප්‍රවේශ ගාස්තු සහ වෙනත් ගාස්තු සමාලෝචනය කිරීම සඳහා, වාර්ෂික කාල සටහන සඳහා;

(ආ) තොග විකිණීමේ අයකුමය, තොග මිල දී ගැනීමේ අයකුමය සහ සැපයුම් අයකුමය සමාලෝචනය කිරීම සඳහා, ත්‍රෛමාසික කාල සටහනක් සඳහා; සහ

(ඇ) පාරිභෝගිකයන්ට සහ වෙනත් උනන්දුවක් ඇති පාර්ශ්වයන්ට සමාලෝචන කාර්ය සඳහා වූ කාර්යපටිපාටියේ දී සහභාගී විය හැකි ආකාරය සඳහා ද,

විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.

(11) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් වුව ද, නියාමක විසින්-

(අ) ඇතැම් පාරිභෝගිකයන්ට සහනාධාර දීමට රජය විසින් අනුමත බෙදා හැරීමේ සමාගම් වෙත යම් සහනාධාරයක පිරිවැය දැරීමට රජය විසින් සපයනු ලබන අරමුදල්වල ප්‍රමාණවත් බව පිළිබඳ සෑහීමට පත් වීමෙන් පසු; සහ

(ආ) ජාතික අයකුම ප්‍රතිපත්තිය ප්‍රකාරව යම් පාරිභෝගික කාණ්ඩයන්ගෙන් අයකර ගත හැකි යම් හරස් සහනාධාරයක් සලකා බැලීමෙන් පසු,

එකී සහනාධාරය පිළිබිඹු වන, අදාළ බලපත්‍රලාභීන්ගෙන් අයකර ගනු ලැබිය යුතු අයකුම සහ ගාස්තු පනවනු ලැබිය හැකි ය.

## IX වන කොටස

### තොග විදුලිබල වෙළෙඳපොළ

තොග විදුලිබල වෙළෙඳපොළ පිහිටුවීම

**30.** (1) 1 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, එහි සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, තොග විදුලිබල වෙළෙඳපොළ ක්‍රියාත්මක වීම ආරම්භ කරනු ලැබිය යුතු දිනය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(2) තොග විදුලිබල වෙළෙඳපොළ තරඟකාරී වෙළෙඳපොළක් විය යුතු අතර, එය ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු මෙහෙයුම් කාර්යපටිපාටි නියම කරනු ලබන ආකාරයට විය යුතු ය.

(3) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් සම්පූර්ණ තොග විදුලිබල වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීම සඳහා (1) වන උපවගන්තිය ප්‍රකාරව යම් නියෝගයක් කිරීමට පෙරාතුව, මෙහෙයුම්, තාක්ෂණ, වාණිජමය සහ ආර්ථික පරාමිතීන් වෙළෙඳපොළ අධීක්ෂණ ක්‍රියාවලි හඳුනා ගනිමින් සහ නිශ්චිතව දක්වමින් තොග විදුලිබල වෙළෙඳපොළ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම පිණිස අවශ්‍ය වන නියෝග, නියම සහ කොන්දේසි, මාර්ගෝපදේශ සහ රීති මේ පනත ප්‍රකාරව සාදනු ලැබ ඇති බවට අමාත්‍යවරයා විසින් සහතික විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, ජාතික ආර්ථිකයේ සුබසිද්ධිය උදෙසා, තොග විදුලිබල වෙළෙඳපොළ පිහිටුවීමට පෙරාතුව උත්පාදන බලපත්‍රලාභීන් සමඟ විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්වලට එළඹීම සඳහා බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට ඉඩ ලබා දිය හැකි ය.

X වන කොටස

**පාරිභෝගික ආරක්ෂාව**

තරඟකාරී භාවිතයන්ට අදාළ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ

31. අමාත්‍යවරයා විසින්, නියාමක විමසා, විදුලිබල කර්මාන්තයේ තරඟකාරිත්වයට බලපාන තරඟකාරී නොවන භාවිතයන්, ඒකාධිකාරීන්, වංචනික හවුල්වීම් හා ආධිපත්‍යයේ අනිසි භාවිතයන් සහ ආනුෂංගික ඒකාබද්ධ කිරීමේ තත්ත්වයන් වැළැක්වීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය.

විදුලිබලය සැපයීම සඳහා වන ප්‍රමිතිය

**32.** (1) විදුලිබලය සැපයීම හා අයකුම පාරිභෝගිකයන්ට විදුලිබලය සැපයීම් සේවා ලබා දීම සම්බන්ධයෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් පවත්වාගෙන යා යුතු වන ප්‍රමිති නියම කරමින් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ දක්වා ඇති නියෝග, ක්‍රියාවේ යෙදවිය හැකිතාක් දුරට, බෙදා හැරීමේ බලපත්‍රලාභීන් හා යෝජිත නියෝග මගින් බලපෑමක් ඇති විය හැකි තැනැත්තන් නියෝජනය කරනු ලබන තැනැත්තන් හෝ මණ්ඩල විමසීමෙන් පසුව, සාදනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියමිත යම් ප්‍රමිතියක් සපුරාලීම පිළිබඳ බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ පැහැර හැරීම හේතු කොටගෙන නියමිත විස්තරයක වූ යම් පාඩුවක් හෝ අලාභයක් යම් තැනැත්තකුට සිදු වන අවස්ථාවක, ඒ නියෝගවල නිශ්චිතව දක්වා ඇති පරිදි, යම් ආකාරයකින් ගණනය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක වන්දියක්, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් ඒ තැනැත්තාට ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියමිත ප්‍රමිතියක් සපුරාලීම, බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් පැහැර හැරීම සම්බන්ධයෙන් (3) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි යම් තැනැත්තකු වෙත වන්දියක් ගෙවීම, ඒ පැහැර හැරීම

සංස්ථාපනය කෙරෙන ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තාට ලැබී ඇති වෙනත් යම් පිළියමකට අගති විරහිතව විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ සාදන ලද නියෝග බලාත්මක කිරීමෙන් පැන නඟින යම් ආරාවුලක්, බෙදා හැරීමේ බලපත්‍රලාභියකු හෝ අයකුම පාරිභෝගිකයකු හෝ බලපෑමට ලක් වූ වෙනත් යම් පාර්ශ්වකරුවකු විසින් නියාමක වෙත යොමු කරනු ලැබිය හැකි අතර, නියාමක විසින්, 42 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ ආරාවුල නිරවුල් කරනු ලැබිය හැකි ය.

විදුලිබලයේ සමස්ත ඉටු කිරීමේ මට්ටම හා කාර්යක්ෂම භාවිතය පිළිබඳ ප්‍රමිති

33. නියාමක විසින්, කලින් කලට, බෙදා හැරීමේ බලපත්‍රලාභීන් හා බලපෑමක් ඇති විය හැකි තැනැත්තන් නියෝජනය කරනු ලබන තැනැත්තන් හෝ මණ්ඩල විමසීමෙන් පසුව-

(අ) නියාමකගේ මතය අනුව විදුලිබලය සැපයීමේ හා විදුලිබලය සැපයීම් සේවාවල තත්ත්වය සහ ඒ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් සපුරාගත යුතු පාරිභෝගිකයන් විසින් කාර්යක්ෂම ලෙස විදුලිබලය පාවිච්චි කිරීම ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධ සමස්ත ඉටු කිරීමේ මට්ටමේ ප්‍රමිති නිශ්චය කරනු ලැබිය හැකි ය; සහ

(ආ) එසේ නිශ්චය කරනු ලැබූ ප්‍රමිති, උචිත යයි සලකන යම් ආකෘතියකින් හා යම් ආකාරයකට පළ කරනු ලැබීමට කටයුතු පිළියෙල කරනු ලැබිය හැකි ය.

ඉටු කිරීමේ මට්ටම් සම්බන්ධයෙන් තොරතුරු

34. (1) නියාමක විසින් -

(අ) 32 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග ප්‍රකාර බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් ගෙවනු ලැබූ වන්දි (ඇත්නම්);

(ආ) විදුලිබලය සැපයීම හා විදුලිබල සැපයීම් සේවා සම්බන්ධයෙන් ඒ බලපත්‍රලාභීන් විසින් සපුරාගනු ලැබූ සමස්ත ඉටු කිරීමේ මට්ටම්; සහ

(ඇ) පාරිභෝගිකයන් විසින් කාර්යක්ෂම ලෙස විදුලිබලය පාවිච්චි කිරීම ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඒ බලපත්‍රලාභීන් විසින් සපුරා ගනු ලැබූ ඉටු කිරීමේ මට්ටම්,

පිළිබඳ තොරතුරු, කලින් කල, එක්රැස් කරගනු ලැබිය යුතු ය.

(2) නියාමක විසින් දෙන ලද විධානයක නිශ්චිතව දක්වනු ලැබිය හැකි එක් එක් වර්ෂයේ යම් දිනයක හෝ ඊට පෙරාතුව,-

(අ) 32 වන වගන්තිය යටතේ වූ නියෝග මගින් නියම කරනු ලැබූ එක් එක් ප්‍රමිතිය සම්බන්ධයෙන් වන්දි ගෙවනු ලැබූ අවස්ථා ගණන හා ගෙවූ වන්දියේ මුළු එකතුව හෝ අගය; සහ

(ආ) 33 වන වගන්තිය යටතේ නිශ්චය කරනු ලැබූ එක් එක් ප්‍රමිතිය සම්බන්ධයෙන්, නියාමක විසින් නියම කරනු ලැබිය හැකි පරිදි බලපත්‍රලාභියා විසින් සපුරා ගත් ඉටු කිරීමේ මට්ටම පිළිබඳ යම් තොරතුරු,

ඇතුළුව, ප්‍රමිතීන්ට අදාළව නියාමක විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු එක් එක් බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් නියාමක වෙත සපයනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය මගින් බලපත්‍රලාභියා විසින් කිරීමට නියමිත යම් දෙයක් කිරීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින බෙදා හැරීමේ බලපත්‍රලාභියකු වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, වරදකරු කරනු ලැබූ විට, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 31 වන වගන්තිය යටතේ පිහිටුවන ලද නියාමකගේ අරමුදලට ගෙවිය යුතු රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හා වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද තවදුරටත් කරගෙන යනු ලබන එක් එක් දවස සඳහා රුපියල් පනස්දහස බැගින් වූ අමතර දඩයකට ද යටත් විය යුතු ය.

(4) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ ගනුදෙනුකරුවන්ට හෝ අපේක්ෂිත ගනුදෙනුකරුවන්ට දීමට සුදුසු යයි පෙනී යන, මේ වගන්තිය යටතේ නියාමක විසින් එක්රැස් කරන ලද හෝ ඒ වෙත සපයන ලද තොරතුරු නියාමක විසින් උචිත යයි සලකන යම් ආකෘතියකින් හා

යම් ආකාරයකින් සෑම වර්ෂයක ම යටත් පිරිසෙයින් එක් වරක්වත් පළ කිරීම සඳහා නියාමක විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

## XIV වන කොටස

## මූල්‍ය

වාර්ෂික අය බද්ධ

**35.** (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මුදල් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යන විෂයයන් පවරනු ලැබ ඇති අමාත්‍යවරයන්ගේ අනුමතය ඇතිව නියාමක විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයකින් වූ වාර්ෂික අයබද්දක් පනවා සෑම බලපත්‍රලාභියකුගෙන් ම අයකර ගනු ලැබිය යුතු ය.

(2) කිසියම් වර්ෂයක් සඳහා වාර්ෂික අයබද්ද තීරණය කිරීමේ දී නියාමක විසින් පහත දැක්වෙන කරුණු කෙරෙහි සැලකිල්ල දැක්විය යුතු යː-

(අ) ඒ වර්ෂය සඳහා නියාමකගේ තක්සේරු කළ වියදම; සහ

(ආ) පසුගිය වර්ෂයෙන් අයකර නොගත් කිසියම් වියදමක්.

(3) කිසියම් වර්ෂයක් සඳහා බලපත්‍රලාභියකු මත (1) උපවගන්තිය යටතේ පනවන ලද අයබද්ද බලපත්‍රලාභියා විසින් ඒ වර්ෂයේ ජුනි මස තිස් වන දිනට කලින් නියාමක වෙත ගෙවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් වර්ෂයක් සඳහා පනවන ලද අයබද්ද ඒ වර්ෂයේ ජුනි මස තිස් වන දිනට කලින් ගෙවීම බලපත්‍රලාභියා විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, අයබද්ද ගෙවීම පැහැර හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, (මෙහි මින්මතු "සභාපති" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 8 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ නියාමකගේ සභාපති විසින් බලපත්‍රලාභියාගෙන් අයවිය යුතු අයබදු ප්‍රමාණය සහතික කරමින් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ සභාපති විසින් නිකුත් කරන ලද සහතිකයේ සඳහන් වන බලපත්‍රලාභියාගේ ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන්නේ කවර දිසා අධිකරණයක අධිකරණ බල සීමාව ඇතුළත ද, ඒ දිසා අධිකරණය ඉදිරියේ එකී සහතිකය ඉදිරිපත්

කරනු ලැබූ විට, බලපත්‍රලාභියාට ඒ සම්බන්ධව කරුණු ක්‍රියාපෑමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව, අධිකරණය විසින්, සහතිකයේ නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා අවශ්‍ය කරනු ලබන ඒ බලපත්‍රලාභියාගේ නිශ්චල හෝ චංචල දේපළ සියල්ලම හෝ ඉන් කිසිවක් තහනමට ගෙන විකිණීමට පිස්කල්වරයාට බලය දෙමින් ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් පිස්කල්වරයා වෙත නිකුත් කළ යුතු අතර, එකී තහනමට ගැනීම හා විකිණීම ක්‍රියාත්මක කිරීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ සභාපති විසින් සහතිකයක් නිකුත් කරන අවස්ථාවක, සහතිකයේ නිශ්චිතව දක්වා ඇති මුදල සහතිකයේ නිශ්චිතව සඳහන් බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතු බවට සභාපති විසින් ලිඛිතව දැන්විය යුතු නමුත්, එවැනි දැන්වීමක් නොලැබීම හේතුවෙන් මේ වගන්තිය යටතේ පවරන ලද යම් නඩු කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

(7) මේ වගන්තියේ කිසිවකින්, පැහැර හරිනු ලැබූ යම් අයබද්දක ප්‍රමාණය වෙනත් යම් ආකාරයකින් අයකර ගැනීම පිණිස නියාමක සතු අයිතියට බලපෑමක් නොවිය යුතු ය; නැතහොත් බලපෑමක් වන්නේ යයි නොසැලකිය යුතු ය.

## XII වන කොටස

### විවිධ

ඉහළ සහ භූගත විදුලි මාර්ග සඳහා අවශ්‍ය වන බලපත්‍රය

**36.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු විසින්, මේ පනත ප්‍රකාරව තත්කාර්යය සඳහා ලබා ගත් බලපත්‍රයක් අනුව මිස, පොළවට ඉහළින් හෝ පොළොවට යටින් විදුලි මාර්ගයක් සවි කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන -

(අ) කිලෝ වෝල්ට් තිස්තුනක් නොඉක්මවන නාමික වෝල්ටීයතාවක් සහිත හෝ නියාමක විසින් තීරණය කරනු ලබන වෙනත් යම් ඉහළ වෝල්ටීයතාවක් සහිත විදුලි මාර්ගයක් හෝ භූගත කේබලයක් සඳහා; සහ

(ආ) එම විදුලි මාර්ග සවි කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තා වාසය කරන හෝ ඔහුගේ පාලනය යටතේ පවතින පරිශ්‍රයක් ඇතුළත පවතින හෝ පැවතිය හැකි යම් විදුලි මාර්ගයක කොටසක් සඳහා,

අදාළ නොවිය යුතු ය.

(3) මේ පනත යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක -

(අ) නියාමකට යෝග්‍ය යයි පෙනී යන (විදුලි මාර්ගයක අයිතිය සහ ක්‍රියාකාරිත්වයට අදාළ කොන්දේසි ඇතුළු) යම් කොන්දේසි ඇතුළත් වී තිබිය හැකි ය;

(ආ) බලපත්‍රයේ නිශ්චිතව දැක්විය හැකි යම් කාලසීමාවක් අවසන් වීමෙන් පසු ඕනෑම අවස්ථාවක දී, නියාමක විසින් වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කරනු ලැබිය හැකි ය; සහ

(ඇ) (ආ) ඡේදයට යටත්ව, බලපත්‍රය යටතේ හෝ මගින් නිශ්චිතව දක්වනු ලබන හෝ නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා අඛණ්ඩව බලාත්මක විය යුතු ය.

(4) මේ පනතේ කාර්ය සඳහා නියාමක විසින් යම් විදුලි මාර්ගයක් "අධිබල වෝල්ටීයතා මාර්ගයක්" වශයෙන් නම් කරන ලෙස විධාන කරනු ලැබිය හැකි ය.

බලශක්ති උත්පාදන සහ සම්ප්‍රේෂණ ව්‍යාපෘති සඳහා දේපළ අත්කර ගැනීම

**37.** (1) අමාත්‍යවරයා විසින් කරනු ලැබූ නිර්දේශයක් මත, යම් නිශ්චල දේපළක්, බලශක්ති උත්පාදන ව්‍යාපෘතියක් හෝ සම්ප්‍රේෂණ ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය වන බව සහ එම ව්‍යාපෘතිය මගින් පොදු සුබසිද්ධිය සහ මහජන ප්‍රතිලාභය සැලසෙන බව ජනාධිපතිතුමාගේ මතය වන අවස්ථාවක, එම නිශ්චල දේපළ එකී කාර්යය සඳහා අවශ්‍ය වන අතර, (295 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඒ අනුව දේපළ අත්කර ගනු ලැබිය හැකි බවත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන තැනැත්තාට හෝ තැනැත්තන් වෙත පවරනු ලැබිය හැකි බවත් ජනාධිපතිතුමා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ප්‍රකාශයට පත් කළ හැකි ය.

(2) 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තියේ සිට 8 වන වගන්තිය දක්වා (එම වගන්ති දෙක ද ඇතුළත්ව) වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (1) වන උපවගන්තිය යටතේ දේපළ අත්කර ගැනීමකට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක්, එම දේපළ පවරනු ලැබුවේ යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ද එම තැනැත්තා හෝ තැනැත්තන් විසින් ගෙවිය යුතු ය.

## XIII වන කොටස

### සාමාන්‍ය

ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය පිහිටුවීම

38. (1) මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යවරයාට සහාය වීමේ කාර්යය සඳහා ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන ලේකම් කාර්යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (අ) අමාත්‍යවරයා විසින්, අවංකභාවයෙන් යුතු වූ ද, පහත දැක්වෙන එක් ක්ෂේත්‍රයක හෝ ඊට වැඩි ප්‍රමාණයක වසර දහයකට නොඅඩු පළපුරුද්දක් ඇත්තා වූ ද, තැනැත්තන් තිදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබිය යුතු යː-

(i) රාජ්‍ය පරිපාලනය;

(ii) මානව සම්පත් කළමනාකරණය;

(iii) රජයට අයත් ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණය;

(iv) නීතිය;

(v) ඉංජිනේරු ශිල්පය;

(vi) රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර; හෝ

(vii) මූල්‍ය.

(ආ) අමාත්‍යවරයා විසින්, පහත දැක්වෙන එක් ක්ෂේත්‍රයක හෝ ඊට වැඩි ප්‍රමාණයක පළපුරුද්දක් ඇති තැනැත්තකු ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ලෙස පත් කරනු ලැබිය යුතු යː-

(i) රාජ්‍ය පරිපාලනය;

(ii) මානව සම්පත් කළමනාකරණය;

(iii) රජයට අයත් ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණය;

(iv) නීතිය;

(v) ඉංජිනේරු ශිල්පය;

(vi) රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර; හෝ

(vii) මූල්‍ය.

(3) මේ පනතේ දක්වා ඇති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම සහ අධීක්ෂණය කිරීම සඳහා ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයට බලය තිබිය යුතු ය. අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, මේ පනතින් අපේක්ෂිත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී, සෑම අවස්ථාවක දී ම අමාත්‍යවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව, ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය අධීක්ෂණය කරනු ලැබිය යුතු ය.

(4) ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය විසින් -

(අ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී සහ 17 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති 2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සංස්ථාගත කරන ලද අලුත් සමාගම් පනතින් විධිවිධාන සලස්වා ඇති පරිදි ස්වකීය මෙහෙයුම් ආරම්භ කරන බවට සහතික කිරීමට අමාත්‍යවරයාට සහාය වීම;

(ආ) විදුලි කර්මාන්තයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා, පනතේ විධිවිධාන යටතේ සාදනු ලැබිය යුතු නියෝග පිළියෙල කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දීමෙන් සහ පහසුකම් සැලසීමෙන් අමාත්‍යවරයාට සහාය වීම;

(ඇ) ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අවසන් කිරීම සඳහා අවශ්‍ය වන මූලික පැවරීමේ සැලැස්ම සහ අවසාන පැවරීමේ සැලැස්ම කඩිනමින් සැකසීම සඳහා පහසුකම් සැලසීම;

(ඈ) 18 වන වගන්තිය ප්‍රකාරව පිළියෙල කරනු ලබන පැවරීමේ සැලැස්මේ හඳුනාගෙන ඇති කටයුතු ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම ඇතුළුව, ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් සහ වගකීම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා යොදාගනු ලැබිය යුතු ක්‍රමවේදය හඳුනාගනු ලබන සම්පූර්ණ සහ කාර්යක්ෂම මූල්‍යමය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් සකස් කිරීම සම්බන්ධීකරණය කිරීම; සහ

(ඉ) ප්‍රතිසංස්කරණය කරන ලද බල ක්ෂේත්‍රය, ක්‍රියාකර වීම සහ තරඟකාරී, විනිවිදභාවයෙන් යුත් සහ වගකිව යුතු කාර්යපටිපාටි භාවිත කරමින් නව උත්පාදන ධාරිතාව ලබා ගැනීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරුගේ ධාරිතා වර්ධනය ආරම්භ කිරීම,

සිදු කළ යුතු ය.

(5) පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ සිට වසර දෙකක කාලසීමාවක් අවසන් වූ විට, ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් වන විධිවිධාන ක්‍රියාත්මක වීම අවසන් විය යුතු යː

එසේ වුව ද, එකී වසර දෙකක කාලසීමාව අවසන් වීමට දින තිහකට පෙරාතුව, අමාත්‍යවරයා විසින්, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලබා ගැනීමට යටත්ව, ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය ක්‍රියාත්මක වීම වසරකට වරක් බැගින් දීර්ඝ කළ හැකි යː

එසේම තවදුරටත්, ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය, එසේ දීර්ඝ කරනු ලැබිය හැකි සමුච්චිත කාලසීමාව පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ සිට වසර පහක කාලසීමාවක් නොඉක්මවිය යුතු ය.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් ස්වකීය සන්තකයේ ඇති සියලු දත්ත සහ තොරතුරු ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය වෙත ලබා දිය යුතු බව

**39.** (1) මේ පනත ප්‍රකාරව සිදු කරනු ලබන ප්‍රතිව්‍යුහගත කිරීම් කටයුතුවල දී, ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය. ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා විසින්, මණ්ඩලය වෙනුවෙන්,-

(අ) එකී මණ්ඩලය සන්තකයේ ඇත්තා වූ ද, සියලු දත්ත සහ ලේඛන සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිදු කරනු ලබන සියලු කටයුතුවලට අදාළ තොරතුරු ඇතුළත් කවරාකාර හෝ වෙනත් යම් සැලකිය යුතු තොරතුරු;

(ආ) නියමිත දිනට පෙරාතුව, අනුප්‍රාප්තික සමාගම් වෙත සියලු වත්කම් මූලිකව වෙන් කිරීම සහ ඉඩම්, ගොඩනැගිලි, පිරියත සහ යන්ත්‍රසූත්‍ර සහ වෙනත් චංචල වත්කම් ඇතුළු එකී වත්කම්වල මූලික තක්සේරුවඃ

එසේ වුව ද, 18 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ පිහිටුවනු ලැබූ අවශේෂ සමාගමේ ප්‍රධන විධායක නිලධරයා, අවසන් පැවරුම් සැලැස්මේ ඇතුළත් කරනු ලබන අවසන් වත්කම් වෙන් කිරීම සඳහා සහ අවසන් වත්කම් තක්සේරුව සඳහා වගකිව යුතු ය;

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය තත්ත්වයට අදාළ වූ තොරතුරු;

(ඈ) නියමිත දිනට පෙරාතුව අවශේෂ සමාගම ඇතුළු අනුප්‍රාප්තික සමාගම් වෙත මූලික කාර්යමණ්ඩල වෙන් කිරීමඃ

එසේ වුව ද, 18 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ පිහිටුවනු ලැබූ අවශේෂ සමාගමේ ප්‍රධාන විධායක නිලධරයා, අවසන් පැවරුම් සැලැස්මේ ඇතුළත් කරනු ලබන අවසන් වෙන් කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් වන කාර්ය මණ්ඩල දුක්ගැනවිලි සඳහා විසඳුම් ලබා දීමට වගකිව යුතු ය;

(ඉ) ලංකා විදුලිබල මණ්ඩලයේ විභාග වෙමින් පවත්නා සියලු නඩු පිළිබඳ තොරතුරු;

(ඊ) 18 වන වගන්තිය මගින් නියම කර ඇති පැවරීමේ සැලැස්ම සම්පූර්ණ කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන ලංකා විදුලිබල මණ්ඩලය විසින් එළඹ ඇත්තා වූ ගිවිසුම්ගත බැඳීම් පිළිබඳ තොරතුරු,

ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය විසින් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබුණු සියලු තොරතුරු සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වා ගත යුතු අතර, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව එහි බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ සහ සිදු කිරීමේ කාර්යය සඳහා පමණක් එකී තොරතුරු භාවිත කළ යුතු යඃ

එසේ ම තවදුරටත්, නියමිත දිනට පෙරාතුව, අනුප්‍රාප්තික සමාගම් වෙත ලබා දීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ගිවිසුම්කාර බැඳීම් වෙන් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා වගකිව යුතු ය.

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ ඇතැම් විධිවිධාන මේ පනතට අදාළ වීම

**40.** 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ III වන කොටසේ I වන පරිච්ඡේදයේ "අල්ලස් හෝ දූෂණවලට අදාළ වැරදි" යන ශීර්ෂය යටතේ වන විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනතේ විධිවිධාන සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

විදුලිය නිස්සාරණය කිරීම වරදක් විය යුතු බව

**41.** (1) (අ) සම්ප්‍රේෂණ හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් සම්ප්‍රේෂණය කරනු ලබන හෝ බෙදා හරිනු ලබන අතරතුර; සහ

(ආ) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු හෝ වෙනත් සම්ප්‍රේෂණ බලපත්‍රලාභියකු සමඟ ඇති කරගන්නා ලද ගිවිසුමක් අනුව මිස,

විදුලිය ලබා ගන්නා වූ, භාවිත කරන්නා වූ හෝ නිස්සාරණය කරන්නා වූ සෑම තැනැත්තකු ම වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට සහ ඒ වරද සෑදුනා වූ ක්‍රියාවේ හෝ පැහැර හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බලපත්‍රලාභියාට සිදු වූ පාඩුවේ හෝ අලාභහානියේ අගයට සමාන මුදලකින් වූ අමතර දඩයක් හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය. එකී අමතර දඩය වශයෙන් අයකර ගනු ලබන මුදල, බලපත්‍රලාභියා විසින් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත ඒ බලපත්‍රලාභියාට ගෙවිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ දඬුවම් කළ හැකි යම් වරදක් සිදු කිරීමට ආධාර දෙන්නා වූ හෝ අනුබල දෙන්නා වූ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, එකී වරද සඳහා විධිවිධාන සලස්වා ඇති දඬුවමට ම යටත් විය යුතු ය.

(3) තැනැත්තන් දෙදෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් ප්‍රධාන

වරදකරු ලෙස හෝ අනුබල දෙන්නා ලෙස එකම වරද සිදු කර ඇති බවට වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී, එකී පාඩුවේ හෝ අලාභයේ වටිනාකම එම තැනැත්තන් අතර විභජනය කරනු ලැබිය හැකි අතර, එසේ විභජනය කරන ලද මුදල එකී එක් එක් තැනැත්තා වෙත දඩයක් ලෙස පනවනු ලැබිය යුතු ය.

(4) පටහැනිව සාක්ෂි නොමැති අවස්ථාවක, බලපත්‍රලාභියා විසින් නිකුත් කරනු ලබන සහතිකයක් එකී පාඩුවේ හෝ අලාභයේ වටිනාකම පිළිබඳ සාක්ෂියක් ලෙස භාර ගනු ලැබිය යුතු ය. ගිවිසුමක් නොමැති අවස්ථාවක, බලපත්‍රලාභියකු විසින්, බලපත්‍රයේ විධිවිධාන සලස්වා ඇති ගාස්තු අය කිරීමේ ක්‍රමයට අනුකූලව පාරිභෝගිකයකු වෙත සපයන ලද විදුලිය මෙන් එසේ සපයන ලද විදුලිය සඳහා වරදකරුවන්ගෙන් අයකිරීම් කරගනු ලැබිය හැකි ය.

විදුලිබලය අනිසි ලෙස භාවිත කිරීම වරදක් විය යුතු බව

**42.** (1) මේ පනතේ විධිවිධානවලට අගතියක් නොමැතිව-

(අ) බලපත්‍රලාභියකුගේ බලයලත් නිලධරයකු නොවෙමින්, බලපත්‍රලාභියා විසින් මනුවේ, දර්ශකයේ හෝ වෙනත් උපකරණයක සිට හෝ මනුව, දර්ශකය හෝ වෙනත් උපකරණයක් වෙත විදුලිබලය සපයනු ලබන හෝ සපයනු ලැබිය හැකි යම් විදුලි මාර්ගයක් සන්ධි කරන හෝ විසන්ධි කරන;

(ආ) බලපත්‍රලාභියකුගේ කැමැත්තෙන් තොරව, යම් විදුලි මාර්ගයක් අතුරන හෝ ඇතිරීමට කටයුතු සලස්වන හෝ බලපත්‍රලාභියකුට අයත් යම් විදුලි මාර්ගයක්, උපකරණයක් හෝ වැඩ කටයුතු සමඟ සම්බන්ධතාවක් ඇති කිරීමේ කාර්යය සඳහා යම් විදුලි මාර්ගයක්, උපාංගයක්, උපකරණයක් හෝ වැඩ කටයුතු සම්බන්ධ කරන; හෝ

(ඇ) චේතනාන්විතව හෝ නොසැලකිලිමත්ව-

(i) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් යම් පරිශ්‍රයකට සපයනු ලබන විදුලි ප්‍රමාණය මැනීම සඳහා භාවිත කරන මනුවෙහි සටහන් කර ඇති විදුලි ප්‍රමාණය වෙනස් කරන; හෝ

(ii) යම් මනුවක්, එකී මනුව මගින් සපයනු ලබන විදුලි ප්‍රමාණය යථා පරිදි සටහන් කිරීමෙන් වළක්වන,

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂයකට නොඅඩු වූ ද රුපියල් ලක්ෂ පහකට නොවැඩි වූ ද දඩයකට සහ ඒ වරද සඳහා වූ ක්‍රියාවේ හෝ පැහැර හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බලපත්‍රලාභියාට සිදු වූ පාඩුවේ හෝ අලාභහානියේ අගයට සමාන මුදලකින් වූ අමතර දඩයකට ද යටත් විය යුතු අතර, එකී බලපත්‍රලාභියා විසින් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත, එකී අයකර ගත් අමතර දඩය බලපත්‍රලාභියා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ වන වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩු පවරනු ලැබූ අවස්ථාවක දී-

(i) නඩු පවරා ඇත්තේ යම් තැනැත්තකුට විරුද්ධව ද, එකී තැනැත්තාගේ භාරයේ හෝ පාලනය යටතේ මනුව තිබූ බවට; සහ

(ii) එකී මනුවේ සටහන් කර ඇති විදුලි ප්‍රමාණය පිළිබඳ දත්ත ගබඩාවේ වෙනසක් සිදු වන පරිදි එකී මනුව පළුදු කර ඇති බවට ද, එනිසා එකී භාවිත කළ විදුලි ප්‍රමාණය සටහන් කිරීමෙන් මනුව වළක්වා ඇති බවට ද, පැහැදිලි සාක්ෂි ඇති බවට,

බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් නිකුත් කරනු ලබන සහතිකයක් සාක්ෂි ලෙස ආවේශ්‍ය විය යුතු අතර, එහි අන්තර්ගත කරුණු බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ දඬුවම් කළ හැකි යම් වරදක් සිදු කිරීම සඳහා ආධාර දෙන හෝ අනුබල දෙන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, ඒ තැනැත්තා ප්‍රධාන වරද සඳහා විධිවිධාන සලස්වා ඇති දඬුවමට ම යටත් විය යුතු ය. තැනැත්තන් දෙදෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින්, ප්‍රධාන වරදකරු ලෙස හෝ අනුබල දෙන්නා ලෙස, එකම වරද සිදු කර ඇති බවට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, එකී පාඩුවේ හෝ අලාභයේ වටිනාකම එකී තැනැත්තන් අතර විභජනය කරනු ලැබිය හැකි අතර, එසේ විභජනය කරන ලද මුදල එකී එක් එක් තැනැත්තා වෙත දඩයක් ලෙස පනවනු ලැබිය යුතු ය.

(4) පටහැනිව සාක්ෂි නොමැති අවස්ථාවක දී, බලපත්‍රලාභියා විසින් නිකුත් කරනු ලබන සහතිකයක්, එකී පාඩුවේ හෝ අලාභයේ වටිනාකම පිළිබඳ සාක්ෂියක් ලෙස භාරගනු ලැබිය යුතු ය. යම් ගිවිසුමක් නොමැති අවස්ථාවක, බලපත්‍රලාභියකු විසින්, බලපත්‍රයේ විධිවිධාන සලස්වා ඇති යම් අයකිරීමේ ක්‍රමවේදයකට අනුව යම් පාරිභෝගිකයකු වෙත සපයන ලද බලශක්තිය සඳහා ගාස්තුවක් අයකරනු ලැබිය හැකි ය.

(5) වරදකරු කරනු ලැබීමෙන් පසු එකී වරද දිගට ම කරගෙන යනු ලබන අවස්ථාවක, වරදකරු කරනු ලැබීමෙන් පසු එකී වරද දිගට ම කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහසක් නොඉක්මවන තවදුරටත් වූ දඩයක් පනවනු ලැබිය යුතු ය.

(6) යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්, වරදකරු කරනු ලැබූ තැනැත්තාගේ පරිශ්‍රයට විදුලි සැපයුම විසන්ධි කිරීම සහ වරද සිදු කරන ලද්දේ යම් මනුවක් සම්බන්ධයෙන් ද, එම මනුව ඉවත් කිරීම කරනු ලැබිය හැකි අතර, ඉන්පසුව, එම මනුව බැහැර කිරීම සඳහා නියාමක විසින් බලපත්‍රලාභියාට අවසර දෙනු ලබන තෙක් එය සුරක්ෂිත භාරයේ තබනු ලැබිය හැකි ය. එසේ වුව ද, නොගෙවූ මුදල් ප්‍රමාණය බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් අයකර ගනු ලැබූ අවස්ථාවක, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්, සාධාරණ කාලසීමාවක් ඇතුළත විසන්ධි කළ විදුලි සැපයුම ආපසු ලබා දෙනු ලැබිය යුතු ය.

(7) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වන වරදක් ඒ පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංඥෙය වරදක් විය යුතු ය.

සාමාන්‍ය දණ්ඩනය

**43.** (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදනු ලබන යම් නියෝගයක් හෝ උල්ලංඝනය කරන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මේ පනතේ අන්‍යාකාරයකින් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට ද, වරදකරු කරනු ලැබීමෙන් පසු එම වරද දිගට ම කරගෙන යනු ලබන අවස්ථාවක, වරදකරු කරනු ලැබීමෙන්

පසු එම වරද දිගට ම කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහසක් නොඉක්මවන තවදුරටත් වූ දඩයකට ද යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු කරනු ලැබූ පසු, මහෙස්ත්‍රාත්වරයකු විසින්, වරද සඳහා (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති යම් දඬුවමකට අමතරව හෝ එම දඬුවම වෙනුවට, වරද සිදු කිරීම සම්බන්ධ යම් සවි කිරීමක් හෝ වෙනත් උපකරණයක් නිශ්චිතව දක්වා ඇති දිනයකට පෙර ගලවා ඉවත් කළ යුතු බවට ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, නියාමක විසින්, ලිඛිතව බලය දෙන ලද යම් නිලධරයකු විසින් මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

(4) නියාමකගේ ලිඛිත අනුමතය ඇතිව මිස, මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් කිසිදු නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි

**44.** මේ පනත යටතේ වන වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කර ඇති අවස්ථාවක දී-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයක් වේ නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ නිලධරයකු ම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් වේ නම්, ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම,

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු යː

එසේ වුව ද, එකී තැනැත්තාගේ දැනීමෙන් තොරව එකී වරද සිදු කළ බවට නැතහොත් එකී වරද සිදු කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය නිසි උද්‍යෝගයෙන් එකී තැනැත්තා ක්‍රියා කර ඇති බවට එකී තැනැත්තා විසින් ඔප්පු කරන්නේ නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ එකී හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

ඇතුළු වීමේ, පරීක්ෂා කිරීමේ සහ සෝදිසි කිරීමේ බලතල

**45.** (1) යම් පරිශ්‍රයක් තුළ මේ පනතේ විධිවිධානවලට පටහැනි කටයුත්තක් සිදු කරගෙන යන බවට නියාමකට විශ්වාස කිරීම සඳහා සාධාරණ හේතු ඇති අවස්ථාවක, නියාමක විසින් හෝ නියාමක වෙනුවෙන් කටයුතු කරන යම් නිලධරයකු විසින් මහෙස්ත්‍රාත්වරයකුගෙන් වරෙන්තුවක් ලබා ගැනීමෙන් ද, අවශ්‍ය නම්, එම වරෙන්තුව ඉදිරිපත් කිරීමෙන් ද පසු-

(අ) දවසේ සාධාරණ වේලාවක් තුළ දී, නියාමනය කරන ලද අස්තිත්වයක් විසින් එහි ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන පරිශ්‍රයට හෝ ඒ හා සම්බන්ධ වෙනත් පරිශ්‍රයකට ඇතුළු වීම, පරීක්ෂා කිරීම සහ සෝදිසි කිරීම; සහ

(ආ) ඒ නියාමනය කරන ලද අස්තිත්වයේ යම් අදාළ වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීම, එහි පිටපත් ලබා ගැනීම හෝ එකී වාර්තා හෝ ලේඛන තහනමට ගැනීම සහ රඳවා තබා ගැනීම,

කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී නියාමකට හෝ නියාමක වෙනුවෙන් කටයුතු කරන යම් නිලධරයකුට බාධා කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

ආරාවුල් නිරාකරණය කිරීම

**46.**(1) (අ) බලපත්‍රලාභියකු සහ අයකුම පාරිභෝගිකයකු;

(ආ) බලපත්‍රලාභියකු සහ තවත් බලපත්‍රලාභියකු;

(ඇ) බලපත්‍රලාභියකු සහ බලපෑමට ලක් වූ වෙනත් යම් පාර්ශ්වකරුවකු;

(ඈ) විදුලි මනු භාවිතය; හෝ

(ඉ) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව අයකුම ගෙවීම,

අතර හෝ ඒ සම්බන්ධයෙන් විදුලිබල සැපයුමට හෝ භාවිතයට සම්බන්ධ යම් ආරාවුලක් උද්ගත වේ නම් සහ ආරාවුල නිරාකරණය කර ගැනීමට පාර්ශ්වකරුවන් අපොහොසත්ව ඇත්තා වූ ද අවස්ථාවක, යම් අගතියට පත් තැනැත්තකු විසින්, ආරාවුලට අදාළ කරුණ නියාමක විසින් විභාග කර තීරණය කරන ලෙස ඉල්ලමින් වහාම නියාමක වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට දී, ආරාවුල අධිකරණය මගින් හෝ බේරුම්කරණය මාර්ගයෙන් තීරණය කිරීම වඩාත් උචිත බවට නියාමක විසින් තීරණය කරනු ලබන්නේ නම් මිස, නියාමක විසින් ආරාවුල සමථ කර නිරාකරණය කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන යම් ආරාවුලක් සමථ කර නිරාකරණය කිරීමේ දී, එසේ කිරීම යෝග්‍ය යයි එය විසින් සලකනු ලබන අවස්ථාවක, නියාමක විසින්, නිරාකරණය කිරීමේ කාර්යය සඳහා එම ආරාවුල නියාමක විසින් පත් කරනු ලබන තැනැත්තන් තිදෙනෙකුගෙන් සමන්විත වූ ද, ඉන් එක් අයකු නියාමකගේ සාමාජිකයකු හෝ නියාමකගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු හෝ රජයේ නිලධරයකු වන සහ එකී මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන තැනැත්තකු වූ ද, සමථකරුවන්ගේ මූල මණ්ඩලයක් වෙත යොමු කරනු ලැබිය හැකි ය. එකී සමථකරුවන්ගේ මූල මණ්ඩලය විසින්, නියාමක විසින් නිශ්චිතව දක්වනු ලබන කාලසීමාව ඇතුළත, එය වෙත යොමු කරන ලද ආරාවුල නිරාකරණය කර එකී ආරාවුලට සම්බන්ධ පාර්ශ්වකරුවන් අතර සමථයක් ඇති කර ගැනීමට සහ එහි විචාරණ අවසන් කිරීමට සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ යම් ආරාවුලක් නිරාකරණය කිරීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙත සහ කාර්යපටිපාටිය නියම කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ නියාමක විසින් සිදු කරනු ලබන නිරාකරණය කිරීමක්-

(අ) නියාමක විසින් උචිත යයි සලකනු ලබන පරිදි නියාමක විසින් දරන ලද පිරිවැය හෝ වියදම් සඳහා යම් මුදලක් ගෙවන ලෙස එක් පාර්ශ්වකරුවකුට හෝ අනෙක් පාර්ශ්වකරුවාට හෝ නියම කරන්නා වූ විධිවිධාන ඇතුළු යම් ආනුෂංගික, අතිරේක සහ අනුගාමී විධිවිධාන ඇතුළත් විය හැකි ය; සහ

(ආ) නියාමක විසින් දරන ලද පිරිවැය හෝ වියදම් සම්බන්ධයෙන් වන විධිවිධාන ඊට ඇතුළත් වන තාක් දුරට, අවසානාත්මක විය යුතු අතර, මුදල් ගෙවීම සඳහා ඒ අධිකරණය විසින් කරන ලද තීන්දු ප්‍රකාශයක් මෙන් කොළඹ දිසා අධිකරණයේ දී බලාත්මක කළ හැකි විය යුතු ය.

(6) නියාමක විසින් මේ වගන්තිය යටතේ වන නිරාකරණය කිරීමට පිරිවැය සහ වියදම් සම්බන්ධයෙන් වන යම් විධිවිධානයක් ඇතුළත් කරනු ලැබූ අවස්ථාවක, නියාමක විසින්, පාර්ශ්වකරුවන්ගේ හැසිරීම සහ වත්කම් සහ වෙනත් යම් අදාළ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත අදාළ නොවිය යුතු බව

**47.** (1) මේ පනත මගින් හෝ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත මගින් නියාමක වෙත පිරිනමන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීමට අදාළව, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මගින් පිහිටුවන ලද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින්, ඒ පනත මගින් ඒ අධිකාරිය වෙත පිරිනමන ලද බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

(2) එසේ කිරීමේ අවශ්‍යතාවක් උද්ගත වූ ද, පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මේ පනතේ සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ නිශ්චිත විධිවිධාන නොමැති වූ ද කවර වූ හෝ අවස්ථාවක, නියාමක විසින්, ඊට අදාළව 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මගින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත පිරිනමන ලද යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, නියාමක විසින් එකී බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

දුෂ්කරතා ඉවත් කිරීම

**48.** (1) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදනු ලබන යම් නියමයක්, නියෝගයක්, රීතියක් හෝ නිවේදනයක් බලාත්මක කිරීමේ දී, යම් දුෂ්කරතාවක් ඇති වූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, යම් නිශ්චිත දුෂ්කරතාවක් ඉවත් කිරීම සඳහා අවශ්‍ය වූ ද නැතහොත් යෝග්‍ය වූ ද, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවූ ද පියවර ගනු ලැබිය හැකි ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, එකී දුෂ්කරතාවක් ඉවත් කිරීමේ කාර්යය සඳහා ගන්නා ලද පියවර නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

රීති

**49.** (1) මේ පනත ප්‍රකාරව රීති සාදනු ලැබීමට නියම කරන ලද හෝ බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(2) මේ පනත ප්‍රකාරව සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එකී පළ කරනු ලබන දිනයේ දී හෝ එහි නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට එම රීති බලාත්මක විය යුතු ය.

**50.** (1) මේ පනත ප්‍රකාරව සාදන ලද සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ නියම, 1 වන වගන්තිය ප්‍රකාරව සාදනු ලබන නියම හැර, එකී පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය. නියම

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ පළ කරන ලද සෑම නියමයක් ම, එකී පළ කිරීමේ සිට දින අනූවක් ඇතුළත, පාර්ලිමේන්තු යෝජනා සම්මතයක් මගින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) එසේ අනුමත කරනු නොලැබූ යම් නියමයක් ඒ යටතේ නිසි ලෙස කරන ලද කිසිවකට අගති විරහිතව එකී යෝජනා සම්මතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**51.** (1) මේ පනතින් නියම කරනු ලැබිය යුතු යයි නියමිත හෝ මේ පනත මගින් නියෝග සෑදීමට නියමිත හෝ බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන් මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග

(2) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එකී පළ කරනු ලබන දිනයේ දී හෝ එහි නිශ්චිතව දක්වනු ලබන යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමේ දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ එවැනි යම් නියෝගයක්, ඒ යටතේ යථා පරිදි කරන ලද කිසිවකට අගති විරහිතව එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

## XIV වන කොටස

### ඉවත් කිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන

ඉවත් කිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන

**52.** (1) නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත ඉවත් කරනු ලැබිය යුතු ය. 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත ඉවත් කිරීම නොතකා-

(අ) ඉවත් කරන ලද 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත යටතේ සාදන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වන දිනයේ දී බලාත්මකව පවතින සියලු නියෝග, එකී නියෝග මේ පනතේ යම් විධිවිධානයක් සමඟ අනනුකූල නොවන තාක් දුරට, එකී නියෝග ප්‍රතියෝජනය කිරීම සඳහා මේ පනත යටතේ නියෝග සාදනු ලබන තෙක්, නියමිත දිනයේ සිට සහ ඉන්පසුව නොකඩවා ක්‍රියාත්මක විය යුතු ය;

(ආ) නියමිත දිනයට පෙරාතුව ම වන දිනයේ දී බලාත්මකව පවතින ලංකා විදුලිබල මණ්ඩලයේ උසස් වීමේ පටිපාටිවල විධිවිධාන, ආචාර ධර්ම සංග්‍රහ සහ විනය සංග්‍රහ, එකී උසස් වීමේ පටිපාටිය, ආචාර ධර්ම සංග්‍රහය සහ විනය සංග්‍රහය මේ පනතේ යම් විධිවිධානයක් සමඟ අනනුකූල නොවන තාක් දුරට, අනුප්‍රාප්තික සමාගම්වල අඛණ්ඩව සේවය කරගෙන යාමට තෝරාගෙන ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ සේවානියුක්තයන්ගේ උසස් වීම්, පැවැත්ම සහ විනය පාලනය සම්බන්ධයෙන් පැන නගින යම් කාරණාවක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන්, එකී සේවානියුක්තයන්ගේ උසස් වීම්, පැවැත්ම සහ විනය පාලනය නියාමනය කිරීම සඳහා අනුප්‍රාප්තික සමාගම් විසින් උසස් වීමේ පටිපාටි, ආචාර ධර්ම සංග්‍රහ සහ විනය සංග්‍රහ සම්මත කර ගනු ලබන තෙක්, නියමිත දිනයේ සිට සහ ඉන් පසුව නොකඩවා ක්‍රියාත්මක විය යුතු ය;

(ඇ) නියමිත දිනයෙන් පසුව, මේ පනත් යටතේ කිසිදු විධිවිධානයක් හෝ කිසිදු සාධනීය විධිවිධානයක් සාදනු ලැබ නොමැති, විදුලිබල කර්මාන්තයේ දී උද්ගත වන හෝ ඒ සම්බන්ධ යම් කාරණාවක් හෝ ගැටලුවක් ඉතිරිව

පවතින අවස්ථාවක දී, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ විධිවිධාන, එකී කාර්යය සඳහා මේ පනතේ විධිවිධාන සාදනු ලබන තෙක්, අන් කිසිවකට නොව එකී යම් කාරණයක් හෝ ගැටලුවක් සම්බන්ධයෙන් පමණක් නියමිත දිනයේ සිට සහ ඉන් පසුව නොකඩවා ක්‍රියාත්මක විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය;

(ඇ) නියමිත දිනයට පෙරාතුව ම වන දිනයේ දී විභාග වෙමින් පවතින ලංකා විදුලිබල මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව ගොනු කරන ලද කවරාකාර ස්වභාවයෙන් යුත් සියලු නඩුකර සහ නඩු කටයුතු නියමිත දිනයේ සිට වන පරිදි අදාළ අනුප්‍රාප්තික සමාගම විසින් හෝ එයට එරෙහිව ගොනු කරන ලද නඩුකර සහ නඩු කටයුතු ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව අඛණ්ඩව පවත්වාගෙන යා හැකි ය;

(ඉ) නියමිත දිනයට පෙර ලංකා විදුලිබල මණ්ඩලයට පක්ෂව සහ එයට එරෙහිව කරන ලද යම් අධිකරණයක සියලු නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ නියෝග එකී දිනයේ සිට සහ ඉන් පසුව නොකඩවා බලාත්මකව පැවතිය යුතු බවට සලකනු ලැබිය යුතු අතර, මේ පනත ප්‍රකාරව ඒ අනුව බලාත්මක විය යුතු ය;

(ඊ) යම් දැන්වීමක, ගිවිසුමක, සාධන පත්‍රයක, වාර්තාවක, කොටස් සහතිකයක, ලේඛනයක, ඔප්පුවක, බැඳුම්කරයක, එකඟතාවයක, ඇපකරයක, ඇටෝර්නි බලපත්‍රයක, නීති නියෝජිත ප්‍රදානයක හෝ කවරාකාර හෝ ස්වභාවයෙන් යුත් යම් වෙනත් සාධන පත්‍රයක ලංකා විදුලිබල මණ්ඩලයට යම් යොමු කිරීමක් දැනට බලාත්මකව පවතින්නේ නම්, එම යොමු කිරීම මේ පනත ප්‍රකාරව වලංගු සහ ක්‍රියාත්මක ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව නොකඩවා බලාත්මක විය යුතු ය.

(2) නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත ඉවත් කරනු ලැබිය යුතු ය. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත ඉවත් කිරීම නොතකා, -

(අ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නිකුත් කරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වන දිනයේ දී බලාත්මකව පවතින සියලු බලපත්‍ර සහ නිකුත් කර ඇති බවට සලකන සියලු බලපත්‍ර, එකී බලපත්‍ර මගින් පහත දැක්වෙන ක්‍රියාකාරකම්වලින් යම් ක්‍රියාකාරකමක් සඳහා බලය දී ඇති තාක් දුරට, නියමිත දිනයේ සිට සහ ඉන් පසුව එකී දිනයේ සිට මාස නවයක කාලසීමාවක් සඳහා නොකඩවා වලංගුව සහ බලාත්මකව පැවතිය යුතු යː-

(i) විදුලිබලය උත්පාදනය කිරීම සඳහා නිකුත් කරන ලද සියලු උත්පාදන බලපත්‍ර සහ නිකුත් කළ ලෙස සලකන උත්පාදන බලපත්‍ර;

(ii) ("ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය" යනුවෙන් ද හඳුන්වනු ලබන) ජාතික සම්ප්‍රේෂණ ජාලයේ ක්‍රියාකාරිත්වය, නඩත්තුව, අනාගත සැලසුම්කරණය සහ සංවර්ධනය සඳහා මේ පනතේ 15 වන සහ 16 වන වගන්ති යටතේ ලැයිස්තුගත කර ඇති ක්‍රියාකාරකම් සිදු කරගෙන යාම සඳහා නිකුත් කරනු ලැබ ඇතැයි සලකනු ලබන ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය;

(iii) ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදා හැරීමේ කොට්ඨාසවල බලයලත් ප්‍රදේශවල පාරිභෝගිකයන්ට සහ හෝ යම් පරිශ්‍රවලට විදුලිබලය බෙදා හැරීම සඳහා සහ හෝ විදුලිබලය සැපයීම සඳහා නිකුත් කරන ලද බෙදා හැරීමේ බලපත්‍ර;

(iv) ප්‍රසම්පාදනය සඳහා සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් සහ යම් වෙනත් ගනුදෙනුකරුවන් වෙත තොග ආකාරයෙන් විදුලිබලය විකිණීම සඳහා 10 වන වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇති ක්‍රියාකාරකම් සිදු කරගෙන යාම සඳහා නිකුත් කරනු ලැබ ඇතැයි සලකනු ලබන ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය;

(v) සීමාසහිත ලංකා විදුලිබල (පුද්ගලික) සමාගමේ බලයලත් ප්‍රදේශයේ පාරිභෝගිකයන්ට හෝ යම් පරිශ්‍රවලට විදුලිබලය බෙදා හැරීම සඳහා සහ හෝ විදුලිබලය සැපයීම සඳහා සීමාසහිත ලංකා විදුලිබල (පුද්ගලික) සමාගම වෙත නිකුත් කරන ලද බෙදා හැරීමේ බලපත්‍රයඃ

එසේ වුව ද, (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ දක්වා ඇති මාස නවයක කාලසීමාව ඉකුත්වීමට පෙර මාස හයකට නොඅඩු කාලයක දී, සියලු බලපත්‍රලාභීන් සහ බලපත්‍රලාභීන් ලෙස සලකනු ලබන සියල්ලන් ම මේ පනතේ විධිවිධාන ප්‍රකාරව බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර යොමු කරන ලෙසට නියම කරනු ලැබිය යුතු යඃ

එසේම තවදුරටත්, ලංකා විදුලිබල මණ්ඩලය නොවන අස්තිත්වයන් වෙත නිකුත් කරන ලද සියලු උත්පාදන බලපත්‍ර සහ සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම වෙත නිකුත් කරන ලද බෙදා හැරීමේ බලපත්‍රය, එකී බලපත්‍රවල ඉතිරි කාලසීමාව සඳහා දිගට ම බලාත්මක විය යුතු ය. ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු, ජාතික පද්ධති ක්‍රියාකරු සහ බෙදා හැරීමේ සමාගම් විසින් දැනට සිදු කරනු ලබන උත්පාදන කටයුතු පවරා ගැනීම සඳහා පිහිටුවනු ලබන අනුප්‍රාප්තික සමාගම් මාස නවයක කාලසීමාවකට මේ පනත යටතේ පවරන ලද කාර්ය ඉටු කිරීම සඳහා බලපත්‍ර ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ අස්තිත්ව විසින්, නියමිත දිනෙන් මාස හයකට පෙරාතුව මේ පනත යටතේ අලුත් බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ඉවත් කරන ලද 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 56 වන වගන්තිය යටතේ සාදන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වන දිනයේ දී බලාත්මකව පවතින සියලු නියෝග, එකී නියෝග මේ පනතේ යම් විධිවිධානයක් සමඟ අනනුකූල නොවන තාක් දුරට, මේ පනත යටතේ නියෝග සාදනු ලබන තෙක්, එකී දිනයේ සිට බලාත්මක වන පරිදි අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු ය සහ බලාත්මකව පවතින බවට සලකනු ලැබිය යුතු ය.

(3) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ II වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වීම ප්‍රකාරව ලංකා විදුලිබල මණ්ඩලය වෙත රජයේ විදුලිබල පවරා ගැනීමේ දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන ආයතනවලින් පවරනු ලැබ ඇති සියලු ඉඩම්, එකී සහතිකයට අමුණනු ලබන උපලේඛනයේ (සීමා සහ මායිම් සහිතව) විස්තර කර ඇති සියලු ඉඩම්වල හිමිකරු ලංකා විදුලිබල මණ්ඩලය වන බව සහතික කරමින් සාමාන්‍යාධිකාරිවරයාගේ සන්තකයේ සහ පාලනයේ පවතින එකී පැවරීම සම්බන්ධ තොරතුරු සහ ලේඛනමය සාක්ෂි මත පදනම්ව ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයාගේ අත්සන යටතේ නිකුත් කරනු ලබන සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් පසුව, ලියාපදිංචි කරන ලෙසට ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත නියම කරනු ලැබිය යුතු ය.

(4) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ II වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වීම ප්‍රකාරව, රජයේ විදුලිබල පවරා ගැනීමේ දෙපාර්තමේන්තුව සහ යම් පළාත් පාලන ආයතනයක් විසින් හිමිකාරිත්වය සහ සන්තකය දැරූ සියලු වත්කම් සහ ඉඩම් ඇතුළු සියලු විදුලිබල කටයුතු පවරා ගැනීමේ දිනයේ සිට, ලංකා විදුලිබල මණ්ඩලය, සහතිකයට අමුණා ඇති උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති ඉඩම්වල හිමිකරු සහ බුක්තිකරු බවට පත් වූ බවට සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සියලු විදුලිබල කටයුතු පවරා ගන්නා ලද දිනයේ සිට සහ ඉන් පසුව කිසිදු අවහිරතාවකින් තොරව ලංකා විදුලිබල මණ්ඩලයේ දේපළ ලෙස එම ඉඩම් සහ වත්කම්වල සියලු ප්‍රතිලාභ භුක්ති විඳිනු ලැබ ඇති බවට ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයාගේ අත්සන යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා "ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ පත් කරන ලද සහ එකී ඉඩම් පිහිටා ඇති දිස්ත්‍රික්ක සහ කොට්ඨාස සම්බන්ධයෙන් නීතිමය අධිකාරය ඇති ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ.

අර්ථ නිරූපණය

**53.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්" යන්නෙන්, 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍ර ප්‍රදානය කරනු ලැබූ සමාගම් අදහස් වේ;

"බලය දීම" යන්නෙන්, බලපත්‍රයක් මගින් බලය දීමක් හෝ මේ පනත යටතේ නිදහස් කිරීමක් අදහස් වේ;

"බලයලත් ප්‍රදේශ" යන්නෙන්, බලපත්‍රයක් මගින් විදුලිබලය සම්ප්‍රේෂණයට හෝ බෙදා හැරීමට සහ සැපයීමට බලයලත් තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ කර ගැනීමේ දී, ඒ බලපත්‍රයේ නම් කර ඇති ප්‍රදේශය අදහස් වේ;

"තොග විකිණීම්" යන්නෙන්, විදුලිය විකිණීම සම්බන්ධයෙන් වන විට දී, ජාතික පද්ධති ක්‍රියාකරු විසින් බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට සහ සම්ප්‍රේෂණ ජාලයට සම්බන්ධිත යයි අදාළ බලපත්‍රය මගින් හඳුනාගනු ලැබිය හැකි වෙළෙන්දන්ට සහ පාරිභෝගිකයන්ට විදුලිය තොග වශයෙන් විකිණීම අදහස් වේ;

"තොග සැපයුම් ගිණුම" යන්නෙන්, විදුලිය තොග වශයෙන් විකිණීම් සහ උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් විදුලිය මිල දී ගැනීම් වාර්තා කිරීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරු විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම අදහස් වේ;

"ගෘහීත උත්පාදන පිරියතය" යන්නෙන්, යම් තැනැත්තකු විසින් මූලික වශයෙන් ඒ තැනැත්තාගේ ස්වකීය භාවිතය සඳහා විදුලිය උත්පාදනය කිරීමට පිහිටුවන ලද විදුලි පිරියතයක් අදහස් වන නමුත්, ඒ තැනැත්තා විසින් යම් අතිරික්ත විදුලිබලයක් මේ පනත යටතේ නිකුත් කළ බලපත්‍රයක් ප්‍රකාරව බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට හෝ ජාතික පද්ධති ක්‍රියාකරුට විකිණිය හැකි ය;

"ලංකා විදුලිබල මණ්ඩලය" යන්නෙන්, 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලය අදහස් වේ;

"සම්බන්ධ කිරීම" යන්නෙන්, යම් පරිශ්‍රයක් සම්බන්ධයෙන් අදාළ වන විට දී, යම් පාරිභෝගිකයකු බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ බෙදා හැරීමේ මාර්ගයට සම්බන්ධ කිරීමක් අදහස් වන අතර, "සම්බන්ධතාවය" යන යෙදුම ඒ අනුව තේරුම් ගත යුතු ය;

"පාරිභෝගිකයා" යන්නෙන්, බලපත්‍රලාභියකු හෝ ශ්‍රී ලංකා රජය හෝ මහජනතාවට විදුලිය සැපයීමේ ව්‍යාපාරයේ නියුතු වෙනත් යම් තැනැත්තකු විසින් පෞද්ගලික භාවිතය සඳහා විදුලිය ලබා දී ඇති යම් තැනැත්තකු අදහස් වන අතර, විදුලිය ලබා ගැනීමේ කාර්යය සඳහා තත්කාලයේ දී සම්බන්ධ කර ඇති පරිශ්‍රයක් අයිති තැනැත්තකු ද විදුලිබලය අපේක්ෂිතව සිටින පාරිභෝගිකයකු ද ඇතුළත් විය යුතු ය;

"සමර්පිත සම්ප්‍රේෂණ මාර්ගය" යන්නෙන්, ගෘහීත උත්පාදන පිරියතයක හෝ උත්පාදනය කිරීමේ ස්ථානයක විදුලි මාර්ග හෝ විදුලි පිරියතයන්, අවස්ථාවෝචිත පරිදි, යම් සම්ප්‍රේෂණ මාර්ගයකට හෝ උපපොළකට සම්බන්ධ කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන යම් විදුලිය සැපයීමේ මාර්ගයක් හෝ ස්ථානයෙන් ස්ථානයට වන සම්බන්ධතාවයක් අදහස් වේ;

"ප්‍රේෂණය" යන්නෙන්, එක් එක් විදුලි පිරියතයක් විසින් නිෂ්පාදනය කළ යුතු විදුලි නිෂ්පාදන ප්‍රමාණය ජාතික පද්ධති ක්‍රියාකරු විසින් විදුලි පිරියත ක්‍රියාකරුවන් වෙත දැන්වීම අදහස් වේ;

"බෙදා හැරීම" යන්නෙන්, විදුලිය සම්බන්ධයෙන් වන විට දී, අඩු වෝල්ටීය මාර්ග සහ විදුලි පිරියතයකින් සමන්විත වන්නා වූ සහ යම් පරිශ්‍රයකට හෝ වෙනත් යම් බෙදා හැරීමේ පද්ධතියකට විදුලිබලය ගෙනයාම සඳහා භාවිත කරනු ලබන පද්ධතියක් අදහස් වන අතර, "බෙදීම" සහ "බෙදා හැරීමේ පද්ධතිය" යන යෙදුම් ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය;

"බෙදා හැරීමේ මාර්ගය" යන්නෙන්, බෙදා හැරීමේ බලපත්‍රලාභියකු සම්බන්ධයෙන් වන විට දී, යම් පරිශ්‍රයකට විදුලිය සැපයීමේ කාර්යය සඳහා භාවිත කරනු ලබන බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ බලයලත් ප්‍රදේශයේ ඇති යම් බෙදා හැරීමේ මාර්ගයක් අදහස් වේ;

"බෙදා හැරීමේ අයක්‍රමය" යන්නෙන්, 29 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ වන පාරිභෝගික සේවා ඇතුළුව බෙදා හැරීමේ ජාලය නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන සාධාරණ පිරිවැය අයකර ගැනීම සඳහා නියාමක විසින් පනවනු ලබන අයක්‍රමය අදහස් වේ;

"බෙදා හැරීමේ වෝල්ටීයතාවය" යන්නෙන්, කිලෝවෝල්ට් 33 ට නොවැඩි යම් වෝල්ටීයතාවයක් හෝ නියාමක විසින් තීරණය කරනු ලබන පරිදි වූ යම් වෝල්ටීයතාවයක් අදහස් වේ;

"විදුලි පිරියතය" යන්නෙන්, විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම හෝ සැපයීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් භාවිත කරන යම් පිරියතයක්, උපකරණයක් හෝ ආම්පන්නයක් අදහස් වන අතර, පාරිභෝගිකයකුගේ පාලනය යටතේ පවතින යම් පරිශ්‍රයකට හෝ යම් විදුලි ආම්පන්නයකට සපයන ලද විදුලිය ප්‍රමාණය දැන ගැනීම සඳහා භාවිත කරන යම් විදුලි මාර්ගයක්, යම් මීටරයක් ඇතුළත් නොවිය යුතු ය;

"විදුලිබල පද්ධතිය" යන්නෙන්, විදුලි උත්පාදක යන්ත්‍රයකින් උත්පාදනය කර පාරිභෝගික ප්‍රදේශවලට හෝ යාබද විදුලිබල පද්ධතිවලට ගෙන යාම සඳහා භාවිත කරන විදුලි උත්පාදක යන්ත්‍ර (උදා: විදුලි පිරියත) සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ මාර්ග, උපකරණ, පරිපථ සහ ට්‍රාන්ස්ෆෝමර්වල එකතුවක් අදහස් වේ;

"විදුලි මාර්ගය" යන්නෙන්, යම් කාර්යයක් සඳහා විදුලිය රැගෙනයාම සඳහා භාවිත කරනු ලබන පොළොව යට හෝ පොළොව මතුපිට බහාලන යම් විදුලි මාර්ගයක් අදහස් වන අතර, එවැනි යම් මාර්ගයකට ආධාරකයක් ලෙස භාවිත කරන යම් උපකරණයක් ඇතුළත්ව එහෙත් එවැනි යම් මාර්ගයකට ආධාර වන්නේ, ගෙනයන්නේ හෝ එල්ලා තබන්නේ යම් ආකෘතියක්, කණුවක් හෝ වෙනත් දෙයක් තුළින් ද, ඒ මතින් ද හෝ එමගින් ද යන්නට සීමා නොවන විදුලිය ගෙනයාමේ කාර්යය සඳහා එවැනි යම් මාර්ගයකට සම්බන්ධ කරන ලද උපකරණ; සහ (එහි කොපුව, පරිවරණය හෝ වැස්ම) එවැනි යම් මාර්ගයක වටේ පිහිටා තිබෙන හෝ ආධාරක වන හෝ ඊට ආසන්නයේ ස්ථාපනය කර ඇති යම් කම්බියක්, කේබලයක්, නලයක්, පයිප්පයක් හෝ වෙනත් සමාන දෙයක් ඇතුළත් වේ;

"විදුලිය වෙළෙඳාම් කිරීම" යන්නෙන්, නැවත විකිණීම සඳහා විදුලිය මිල දී ගැනීමක් අදහස් වන අතර, "වෙළෙඳාම" යන යෙදුම ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය;

"විදුලි සැපයුම් සංග්‍රහය" යන්නෙන්, සියලු බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් අනුකූල විය යුතු නියම කරන ලද ප්‍රමිතීන්ගේ සංග්‍රහයක් අදහස් වේ;

"කාවද්දන ලද උත්පාදකය" යන්නෙන්, බෙදා හැරීමේ ජාලයට සම්බන්ධිත උත්පාදන පිරියතයක් අදහස් වේ;

"බලාත්මක කිරීමේ නියෝගය" යන්නෙන්, මේ පනතේ 22 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගයක් අදහස් වේ;

"අවශෝෂක අයක්‍රමය" යන්නෙන්, කාවද්දන ලද උත්පාදකවලින් විදුලිය මිලදී ගැනීමේ අයක්‍රමය අදහස් වේ;

"උත්පාදනය කිරීමේ ස්ථානය" යන්නෙන්, විදුලිය උත්පාදනය කිරීමේ යම් ස්ථානයක් පිහිටුවන ලද භූමි භාගය සහ ඉහත කී කාර්ය සඳහා භාවිත කරනු ලබන යම් ගොඩනැගිල්ලක්, පිරියතයක්, ට්‍රාන්ස්ෆෝමරයක්, ස්විච් යතුරු ආම්පන්නයක්, ස්විච් යතුරු අංගනයක්, කේබල් හෝ වෙනත් අනුබද්ධ උපාංග වේ නම්, ඒ සියල්ල සහ විදුලිය උත්පාදනය කිරීමේ ස්ථානයක ක්‍රියා කිරීමේ කාර්ය මණ්ඩලය සඳහා නවාතැන් දීමට භාවිත කරන යම් ගොඩනැගිල්ලක් සහ විදුලිය ජල බලයෙන් උත්පාදනය කරන අවස්ථාවක, කොටු දොරවල්, කවරාකාර හෝ නිර්මාණ, ප්‍රධාන සහ නියාමක ජලාශ, වේලි සහ වෙනත් ජල නිර්මාණ ඇතුළත් වන එහෙත් යම් උපපොළක් ඇතුළත් නොවන විදුලි උත්පාදනය කිරීම සඳහා වන යම් පහසුකමක් අදහස් වේ;

"උත්පාදකයා" යන්නෙන්, උත්පාදන බලපත්‍රලාභියා හෝ උත්පාදන බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති තැනැත්තකු අදහස් වේ;

"ජාලකය" යන්නෙන්, අන්තර් සම්බන්ධිත සම්ප්‍රේෂණ මාර්ග, උපපොළවල් සහ උත්පාදන පිරියතවල අධිවෝල්ටීයතාවයෙන් යුත් ප්‍රධාන රැකුල් පද්ධතියක් අදහස් වේ;

"ජාලක කේත සංග්‍රහය" යන්නෙන්, විදුලිබල පද්ධතිය සැලසුම් කිරීම, උත්පාදකයන් කාලසටහන්ගත කිරීම, උත්පාදකයන්, සම්ප්‍රේෂණ උපකරණ සහ පාරිභෝගිකයන් ජාතික ජාලකයට අන්තර් සම්බන්ධ කිරීම, විදුලිබල පද්ධතිය සහ ජාතික ජාලකය ක්‍රියාත්මක කිරීම සහ විදුලිය පැවරීම් මාපනය කිරීම සඳහා වන මෙහෙයුම් කාර්යපටිපාටි සහ ප්‍රමිති අදහස් වේ ;

"අධිවොල්ටීයතා මාර්ගය" යන්නෙන්, කිලෝවෝල්ට් 33 ඉක්මවන්නා වූ නාමික වෝල්ටීයතාවයකින් යුත් හෝ නියාමක විසින්, කලින් කලට, නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වූ යම් නාමික වොල්ටීයතාවයකින් යුත් විදුලි මාර්ගයක් හෝ කේබලයක් අදහස් වේ;

"දේශීය බලශක්ති විභව" යන්නෙන්, දේශීය වශයෙන් නිෂ්පාදිත පොසිල ඉන්ධන බලශක්ති, පුනර්ජනනීය බලශක්තියෙන් නිෂ්පාදනය කරන ලද බලශක්තිය වැනි සහ ඒවායේ වෙනත් යම් ව්‍යුත්පන්න වූ දේ ඇතුළත් ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම ආකාරයක බලශක්ති විභවයක් අදහස් වන නමුත් කිසිදු ආනයනය කරන ලද පොසිල ඉන්ධන පදනම් වූ බලශක්ති නිෂ්පාදන ඇතුළත් නොවේ;

"අයිතිවාසිකම" යන්නෙන්, පහත දැක්වෙන කටයුතුවලින් කිසිවක් කරගෙන යනු ලබන යම් සමාගමක හෝ ව්‍යවසායයක ඍජු හෝ වක්‍ර යම් මූල්‍ය හෝ වෙනත් අයිතිවාසිකමක් අදහස් වේ:-

(අ) විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම හෝ සැපයීම;

(ආ) විදුලිය උත්පාදනය කිරීම සඳහා ඉන්ධන සැදීම, නිෂ්පාදනය කිරීම, විකිණීම හෝ සැපයීම;

(ඇ) විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, සැපයීම හෝ භාවිත කිරීම සඳහා යන්ත්‍රෝපකරණ, පිරියත, උපකරණ, මෙවලම් හෝ පිරිවැද්දුම් ආනයනය කිරීම, සෑදීම, විකිණීම, බද්දට දීම, කුලියට දීම හෝ වෙනත් ආකාරයෙන් සැපයීම හෝ ගනුදෙනු කිරීම; හෝ

(ඈ) යම් සමාගමකට හෝ ව්‍යවසායකට නීතිමය, ගිණුම්කරණ හෝ බැංකු සේවා සැපයීම;

"සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම" යන්නෙන්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම අදහස් වේ;

"බලපත්‍රය" යන්නෙන්, මේ පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වන අතර, "බලපත්‍රලාභියා" යන යෙදුමෙන් විදුලිය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, සැපයීම, වෙළෙඳාම් කිරීම හෝ ප්‍රසම්පාදනය කිරීමට සම්බන්ධිත කටයුතුවල නිරතවීම සඳහා මේ පනත ප්‍රකාරව බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු අදහස් වේ;

"මාර්ගය" යන්නෙන්, විදුලිය රැගෙන යාමේ දී භාවිත කිරීම සඳහා නිර්මාණය කරන හෝ යොදා ගන්නා (එහි කොපුව හෝ වැස්ම ඇතුළත්ව) යම් කම්බියක්, කේබලයක්, පයිප්පයක්, සන්නායකයක් හෝ වෙනත් සමාන දෙයක් අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, කරනු ලබන හා ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර හෝ අධිකාරියක් ද ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විදුලිය විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"ජාතික ජාලකය" යන්නෙන්, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු සහ අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් විසින් හිමිකාරිත්වය දරන සම්ප්‍රේෂණ වත්කම්වලින් සමන්විත, කිලෝ

වෝල්ට් 33කට වැඩි වෝල්ටීයතාවකින් ක්‍රියාත්මක වන සම්ප්‍රේෂණ ජාලය අදහස් වේ;

"ජාතික පද්ධති ක්‍රියාකරු" යන්නෙන්, මේ පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය අදහස් වේ;

"ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු" යන්නෙන්, ජාතික සම්ප්‍රේෂණ ජාලය ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රය ප්‍රදානය කරනු ලැබ ඇති තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය අදහස් වේ;

"විවෘත ප්‍රවේශය" යන්නෙන්, නියාමක විසින් නිකුත් කරන ලද විධාන ප්‍රකාරව, මේ පනත යටතේ උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් ඍජුව ම විදුලිය මිල දී ගැනීම සඳහා සුදුසුකම්ලත් පාරිභෝගිකයන්ට විදුලිය සැපයීම සඳහා සම්ප්‍රේෂණ ජාලය හෝ බෙදා හැරීමේ මාර්ග හෝ ආශ්‍රිත පහසුකම් භාවිත කිරීම සඳහා වෙනස් කොට නොසැලකීමේ සැපයීම අදහස් වේ. එමගින් විවෘත ප්‍රවේශ ගාස්තු ගෙවීමෙන් පසුව, ජාල හිමිකරු හෝ වෙනත් යම් භාවිත කරන්නකු වශයෙන් සමාන කොන්දේසි මත සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ජාලයකට ප්‍රවේශ වීම සඳහා විදුලිය සැපයීමට තුන්වන පාර්ශ්වීය සැපයුම්කරුවන්ට අවසර ලබාදෙනු ලැබේ;

"විවෘත ප්‍රවේශ ගාස්තු" යන්නෙන්, විවෘත ප්‍රවේශය සඳහා සුදුසුකම්ලත් පාරිභෝගිකයන්ට විවෘත ප්‍රවේශය ලබා දීම සඳහා නියාමක විසින් පනවනු ලබන්නා වූ ද, සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් අයකරනු ලබන්නා වූ ද ගාස්තු අදහස් වේ;

"විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම" යන්නෙන්, උත්පාදන බලපත්‍රලාභියා විසින් විදුලිය විකිණීම හසුරුවනු ලබන ජාතික පද්ධති ක්‍රියාකරු, බෙදාහැරීමේ

බලපත්‍රලාභීන් හෝ පාරිභෝගිකයකු සහ උත්පාදන බලපත්‍රලාභියකු අතර ඇති කර ගනු ලැබූ ගිවිසුම අදහස් වේ;

“බල පද්ධතිය” යන්නෙන්, විදුලිය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීමේ, බෙදා හැරීමේ සහ සැපයීමේ සියලු අංශ අදහස් වන අතර, ඊට පහත නම් වශයෙන් දැක්වෙන එකක් හෝ ඊට වැඩි ගණනක් ඇතුළත් වේ:-

(අ) උත්පාදන ස්ථාන;
(ආ) සම්ප්‍රේෂණ මාර්ග;
(ඇ) උපපොළවල්;
(ඈ) බැඳි මාර්ග;
(ඉ) විදුලිය ප්‍රේෂණ කටයුතු;
(ඊ) ප්‍රධාන බෙදා හැරීමේ මාර්ග;
(උ) විදුලි සැපයුම් මාර්ග;
(ඌ) ඉහළින් ඇති මාර්ග;
(එ) සේවා මාර්ග; සහ
(ඒ) වැඩ කටයුතු;

“විදුලිය විකිණීමේ ගිවිසුම”යන්නෙන්, ජාතික පද්ධති ක්‍රියාකරු විසින් බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට විදුලිය තොග වශයෙන් විකිණීම හසුරුවනු ලබන බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සහ ජාතික පද්ධති ක්‍රියාකරු අතර ඇති කර ගනු ලැබූ ගිවිසුම අදහස් වේ;

“පරිශ්‍රය” යන්නෙන්, යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් අදහස් වේ;

“නියම කරන ලද” යන්නෙන්, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කිරීම අදහස් වේ;

“රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය” යන්නෙන්, ආයෝජකයා විසින් සැලකිය යුතු ලෙස ප්‍රාග්ධන ආයෝජන දරනු ලබන විදුලිය, බලශක්ති ගබඩා කිරීම, අනු සේවා හෝ සම්ප්‍රේෂණ සේවා

සැපයීම සඳහා ආයෝජකයකු සමඟ දීර්ඝකාලීන ගිවිසුමකට එළඹීම අදහස් වේ;

"කලාපීය වෙළෙඳපොළ" යන්නෙන්, දකුණු ආසියානු කලාපය තුළ ශ්‍රී ලංකා දේශසීමාවෙන් පිටත ක්‍රියාත්මක වන විදුලි වෙළෙඳපොළ අදහස් වේ;

"කලාපීය සම්ප්‍රේෂණ ජාලය" යන්නෙන්, කලාපීය වෙළෙඳපොළවල් විසින් සිදු කරන සම්ප්‍රේෂණ ජාලය අදහස් වේ;

"ප්‍රමාණිකෘත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම" යන්නෙන්, තාක්ෂණය, නිශ්චිත විදුලිබල මිල දී ගැනීමේ බද්ද සහ මෙගාවොට් 10ක උපරිම ධාරිතාවක් සහිත පුනර්ජනනීය බලශක්තිය පදනම් කර ගත් බලාගාර සඳහා වෙනත් ගිවිසුම්ගත නියම කර ඇති පෙර අර්ථ දැක් වූ නියම සහ කොන්දේසි මත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුමක් අදහස් වේ;

"අනුප්‍රාප්තික සමාගම්" යන්නෙන්, ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යභාරයන් සහ වගකීම් පවරා ගැනීම සඳහා පනතේ 17 වන වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගම් අදහස් වේ;

"සැපයුම" යන්නෙන්, විදුලිබලය සම්බන්ධයෙන් වන විට, බෙදා හැරීමේ පද්ධතිය හරහා අවසාන පරිශීලකයන්ට විදුලිබලය සැපයීම අදහස් වේ;

"සැපයුම් අයකුමය" යන්නෙන්, බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් ගෙවන ලද තොග මිල දී ගැනීමේ අයකුමයේ සහ සම්ප්‍රේෂණ අයකුමයේ පිරිවැය ආවරණය කර ගැනීම සඳහා නියාමක විසින් පනවන ලද අවසාන පරිශීලක අයකුමයේ කොටස අදහස් වේ;

"පද්ධති පාලන මධ්‍යස්ථානය" යන්නෙන්, ජාතික ජාලකය තථ්‍ය කාලයේ ක්‍රියාත්මක කිරීම ක්‍රියාවේ යෙදවීම සඳහා මේ පනතේ 10 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මධ්‍යස්ථානය අදහස් වේ;

"සම්ප්‍රේෂණ අන්තර් සම්බන්ධතාවය" යන්නෙන්, ජාතික ජාලකයට විදුලිබල පිරියතයක් ආරක්ෂාකාරී සහ විශ්වසනීය අන්තර් සම්බන්ධ කිරීමකට අවශ්‍ය වන උපකරණ සහ පහසුකම් අදහස් වේ;

"සම්ප්‍රේෂණ ජාලය" යන්නෙන්, යම් කම්බි හෝ ඉහළින් ඇති මාර්ගවල පාලනයට සහ ආරක්ෂාවට අවශ්‍ය වන සහ ඒ සඳහා භාවිත කරනු ලබන යම් ට්‍රාන්ස්ෆෝමර්, ස්විච්, යතුරු ආම්පන්න සහ වෙනත් කටයුතු හා උපාංග මෙන්ම ඒ ට්‍රාන්ස්ෆෝමර්, ස්විච් යතුරු ආම්පන්න සහ වෙනත් කටයුතු හා උපාංග සපයා දීම සඳහා අවශ්‍ය විය හැකි යම් ගොඩනැගිලි හෝ එහි කොටස් සමඟ උත්පාදන ස්ථානයකින් ජාලක උපපොළකට, එක් උත්පාදන ස්ථානයකින් වෙනත් උත්පාදන ස්ථානයකට හෝ එක් ජාලක උපපොළකින් වෙනත් ජාලක උපපොළකට විදුලිය ගෙනයාම සඳහා භාවිත කරනු ලබන (බලපත්‍රලාභියකුගේ බෙදා හැරීමේ පද්ධතියේ අත්‍යවශ්‍ය කොටසක් නොවන) අධිවෝල්ටීයතාවයෙන් යුතු සියලු කේබල් සහ ඉහළින් ඇති මාර්ග අදහස් වේ;

"සම්ප්‍රේෂණ සේවා ගිවිසුම" යන්නෙන්, උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභීන් සහ පාරිභෝගිකයන් වෙත විදුලිබලය සම්ප්‍රේෂණය කිරීම සඳහා ජාතික ජාලකය භාවිත කිරීම හසුරුවන ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු සහ ජාතික පද්ධති ක්‍රියාකරු අතර ඇති කර ගනු ලැබූ ගිවිසුම අදහස් වේ;

"සම්ප්‍රේෂණ අයක්‍රමය" යන්නෙන්, සම්ප්‍රේෂණ ජාලය භාවිත කිරීම සඳහා සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් විසින් ජාතික පද්ධති ක්‍රියාකරුගෙන් අයකරනු ලබන අයක්‍රමය අදහස් වේ;

"සම්ප්‍රේෂණ වෝල්ටීයතාවය" යන්නෙන්, කිලෝවෝල්ට් 33ට ඉහළ යම් වෝල්ටීයතාවයක් හෝ

සම්ප්‍රේෂණ පද්ධතිය ක්‍රියාත්මක වන වෝල්ටීයතාවය හෝ වෝල්ටීයතාවයන් ලෙස නියාමක විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් වෝල්ටීයතාවයක් අදහස් වේ;

"සම්ප්‍රේෂණය කිරීම" යන්නෙන්, විදුලිය සම්බන්ධයෙන් වන විට දී, අධිවෝල්ටීයතාවයෙන් යුතු මාර්ග සහ විදුලි පිරියතය අඩංගු වන සහ විදුලිය උත්පාදන ස්ථානයකින් ජාලක උපපොළකට, එක් උත්පාදන ස්ථානයකින් වෙනත් උත්පාදන ස්ථානයකට හෝ එක් ජාලක උපපොළකින් වෙනත් ජාලක උපපොළකට ගෙනයාම සඳහා භාවිත කරනු ලබන, සම්ප්‍රේෂණ පද්ධතියක් මගින් විදුලිය ප්‍රවාහනය කිරීම අදහස් වන අතර, "සම්ප්‍රේෂණ" සහ "සම්ප්‍රේෂණ පද්ධතිය" යන යෙදුම් ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය;

"උපයෝගිතාවය" යන්නෙන්, මේ පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලාභියකු ලෙස කටයුතු කරන යම් තැනැත්තකුට අයත් වන සියලු ඉඩම්, ගොඩනැඟිලි, වැඩ කටයුතු සහ ඒවාට සම්බන්ධිත ද්‍රව්‍ය ඇතුළුව විදුලි මාර්ග හෝ විදුලි පිරියතය අදහස් වන අතර, "විදුලි උපයෝගිතාවය" යන්නෙන්, විදුලිබල ශක්තිය නිෂ්පාදනය, සම්ප්‍රේෂණය හෝ බෙදා හැරීම සඳහා මූලිකව ම භාවිත කරනු ලබන සහ ප්‍රයෝජනවත් වන ගිවිසුම් සහ පැවරූ අයිතීන් ඇතුළුව සියලු කොටස් සහ එයට අයත් දේ සමඟ යම් පිරියතයක්, වැඩ කටයුතු පද්ධතියක්, පහසුකම් හෝ දේපළ අදහස් වේ;

"තොග විදුලි වෙළෙඳපොළ" යන්නෙන්, වඩාත් ම ලාභදායී පිරිවැයට පාරිභෝගිකයන්ට විදුලිය සැපයීම සඳහා බහුවිධ විදුලි සපයන්නන් විසින් එකිනෙකා සමඟ තරඟ කරනු ලබන වෙළෙඳපොළක් අදහස් වේ; සහ

"වැඩකටයුතු" යන්නෙන්, විදුලිය ජනතාවට සම්ප්‍රේෂණය කිරීමට, බෙදාහැරීමට හෝ සැපයීමට සහ මේ පනත යටතේ ප්‍රදානය කළ බලපත්‍රයක හෝ අවසරයක පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය කරන විදුලි මාර්ග සහ යම් ගොඩනැගිලි, පිරියත, යන්ත්‍රෝපකරණ, උපකරණ සහ කවරාකාර විස්තරයෙන් යුත් වෙනත් යම් දෙයක් අදහස් වේ.

**54.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**I** උපලේඛනය

[17 වන වගන්තිය]

**විදුලිබල කර්මාන්තයේ ව්‍යුහය**

වර්තමානයේ ලංකා විදුලිබල මණ්ඩලය සතු වන පහත දක්වා ඇති පරිදි වන ජල විදුලිය උත්පාදනය, තාප විදුලිය උත්පාදනය සහ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සම්බන්ධයෙන් වන කටයුතු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාරව, කථානායකවරයා විසින් මේ පනත පාර්ලිමේන්තු පනතක් වශයෙන් සහතික කරන ලද දින සිට මාස හයකට වඩා පසු නොවන, මේ පනත ක්‍රියාත්මකභාවයට එළඹෙන දිනයේ දී, මේ පනත ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා සාරානුකූලව පහත දැක්වෙන ආකාරයෙන් ප්‍රතිව්‍යුහගත කර, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලබන සංස්ථාමය අස්තිත්වයන් සතු කරනු ලැබිය යුතු ය-

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ ජල විදුලිබලය උත්පාදන වත්කම් පවරා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් සියයට සියයක කොටස් දරනු ලබන එක් සමාගමක්;

(ආ) ලංකා විදුලිබල මණ්ඩලය මෙන්ම ලංකා ගල් අඟුරු සමාගම විසින් හිමිකාරීත්වය දරන සහ ක්‍රියාත්මක කරනු ලබන ගල් අඟුරු විදුලි පිරියතය පවරා ගැනීම සඳහා එක් සමාගමක්;

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලයේ තාප විදුලි උත්පාදන වත්කම් පවරා ගැනීම සඳහා එක් සමාගමක්;

(ඈ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් හිමිකාරීත්වය දරන, සන්තකය දරන සහ ක්‍රියාත්මක කරනු ලබන සුළං විදුලි පිරියතය පවරා ගැනීම සඳහා එක් සමාගමක්;

(ඉ) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සැකසෙන්නා වූ භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය පවරා ගැනීමට ශ්‍රී ලංකා රජය විසින් සියයට පනහකට වඩා කොටස් දරනු ලබන එක් සමාගමක්;

(ඊ) උත්පාදන කාල සටහන්ගත කිරීම, වගකීම සහ උත්පාදන පිරියතවල පිරිමැසුම්දායක ප්‍රේෂණය සම්බන්ධයෙන් වන කර්තව්‍ය සහ ලංකා විදුලිබල මණ්ඩලයේ අනාගත විදුලි සහ සම්ප්‍රේෂණ ධාරිතාව සැලසුම් කිරීම සම්බන්ධයෙන් වන කර්තව්‍ය පවරා ගැනීමට ශ්‍රී ලංකා රජය විසින් සියයට සියයක කොටස් දරනු ලබන එක් සමාගමක්;

(උ) ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදා හැරීම් අංශවල බෙදා හැරීමේ කර්තව්‍ය පවරා ගැනීමට වෙන් වූ සමාගම්; සහ

(ඌ) ලංකා විදුලිබල මණ්ඩලයේ අවශේෂ කර්තව්‍ය කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන සමාගම් යම් ගණනක්. වෙනත් කරුණු අතර යම් අනුප්‍රාප්තික සමාගමකට පවරනු නොලැබිය හැකි පහත දැක්වෙන අවශේෂ කර්තව්‍ය භාර ගැනීම සඳහා එකී අවශේෂ සමාගම් සංස්ථාගත කරනු ලැබිය යුතු ය-

(i) සංස්ථාගත කරන ලද සමාගම්වලට පැවරූ ඒ කර්තව්‍ය සහ කටයුතු හැර, ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය පවරා ගැනීම සඳහා එක් සමාගමක්;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ කර්තව්‍ය පවරා ගැනීමට සහ අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ රක්ෂක සහ භාරකරු ලෙස කටයුතු කරමින් කළමනාකරණය කිරීම සඳහා එක් සමාගමක්, එසේ වුව ද, සමාගමේ සම්පූර්ණ කොටස් හිමිකම සෑම විටම රජය සතු විය යුතු ය.

II වන උපලේඛනය

[21(7)(ඇ) වන වගන්තිය]

**බලපත්‍රලාභීන්ගේ වෙනත් බලතල**

**1.** (1) මේ ඡේදයේ පහත දැක්වෙන විධිවිධානවලට යටත්ව, බලපත්‍රලාභියකුගේ බලපත්‍රය මගින් කරගෙන යාමට ඊට බලය දී ඇති ක්‍රියාකාරකම් කරගෙන යාම හා සම්බන්ධිත යම් කාර්යයක් සඳහා බලපත්‍රලාභියකු විසින්, ස්වකීය බලප්‍රදේශය ඇතුළත පහත දැක්වෙන කවර හෝ වැඩකටයුතු, එනම්-

(අ) යම් වීථියක් යටින්, උඩින්, තුළින්, මත, දිගේ හෝ හරහා-

(i) යම් විදුලි මාර්ග හෝ විදුලි පිරියතයක් සහ;

(ii) එවැනි යම් මාර්ග හෝ පිරියතයක් ගෙවැද්දීම හෝ ආවරණය කිරීම සඳහා යම් ඉදි කිරීමක්,

ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අතර, වරින් වර, එකී පිරියතය හෝ මාර්ග පරීක්ෂා කිරීම, නඩත්තු කිරීම, ගැලපීම, අලුත්වැඩියා කිරීම, වෙනස් කිරීම, ප්‍රතියෝජනය කිරීම හෝ ඉවත් කිරීම කරනු ලැබිය හැකි ය; සහ

(ආ) (අ) වන අනුඡේදයේ සඳහන් කරන ලද පහත දැක්වෙන කාර්ය ඇතුළු යම් වැඩකටයුතුවල කාර්ය සඳහා අවශ්‍ය වන හෝ ආනුෂංගික වන යම් වැඩකටයුතු-

(i) යම් වීථියක් හෝ යම් වීථියක් ඇතුළත හෝ ඒ යට තිබෙන යම් කසළ කාණු, කාණු හෝ උමං විවෘත කිරීම හෝ කඩා දැමීම;

(ii) යම් වීථියක් යටින් උමං තැනීම හෝ සිදුරු හෑරීම; සහ

(iii) යම් වීථියක් තුළ හෝ යට ඇති සියලු පස් සහ ද්‍රව්‍ය ඉවත් කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම;

එසේ වුව ද, මේ අනුඡේදයේ ඇතුළත් කිසිවකින්, මහජන භාවිතය සඳහා වෙන් කරනු ලැබ නැති යම් ගොඩනැගිල්ලක් හෝ යම් ඉඩමක් තුළට හරහා හෝ එල්ලේ යම් විදුලි මාර්ගයක් ඇදීමට හෝ විදුලි පිරියතයක් තැන්පත් කිරීමට බලපත්‍රලාභියකුට බලය නොපැවරෙන්නේ ය.

(2) කිසියම් විදුලි මාර්ගයක් හෝ පිරියතයක් ගෙවැද්දීම සඳහා වීථියක් මත හෝ උඩින් කිසියම් ඉදි කිරීමක් තැබීම පිණිස (1) වන ඡේදය යටතේ බලපත්‍රලාභියකුට පැවරී ඇති බලය පළාත් පාලන ආයතනයේ හෝ වෙනත් අදාළ අධිකාරයක එකඟතාවය ඇතිව පමණක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) යම් විදුලි මාර්ග හෝ විදුලි පිරියතයක වරදකින් පැන නඟින හදිසි අවස්ථාවක දී හැර, පළාත් පාලන අධිකාරියක හෝ වෙනත් අදාළ අධිකාරියක, අධිකාරය තුළට නොවැටෙන වීථියක, (1) වන ඡේදයෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී, නියාමකගේ එකඟත්වය ඇතිව හැර විවෘත කිරීම හෝ කැඩීම නොකළ යුතු ය.

(4) (7) වන ඡේදයේ කුමක් සඳහන් වුව ද, බලපත්‍රලාභියා විසින් නියාමකගේ එකඟත්වය ඇතිව, තාවකාලික වූ ද නියමිත ප්‍රමිතිවලට අනුකූල නොවන්නා වූ ද විදුලි මාර්ග ඉදි කරනු ලැබිය හැකි ය.

(5) අන්‍යාකාරයෙන් එකඟත්වය අවශ්‍ය කරන්නේ කවර තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා වෙත ඉල්ලීම පිළිබඳ දැන්වීම බලපත්‍රලාභියා විසින් භාර දී ඇත්තේ නම් මිස, (3) වන ඡේදය යටතේ තම එකඟත්වය සඳහා වූ ඉල්ලීමක් නියාමක විසින් සලකා නොබැලිය යුත්තේ ය.

(6) (1) වන ඡේදයෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී බලපත්‍රලාභියා විසින් හැකිතරම් දුරට අඩුම ප්‍රමාණයේ හානියක් කළ යුතු අතර, එම බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා සිදුවන යම් හානියක් සඳහා වන්දි ගෙවීම කළ යුතු ය.

(7) බලපත්‍රලාභියකු විසින් යම් වීථියක් යටින්, උඩින්, තුළ, මත, දිගේ හෝ හරහා සවි කරන හෝ සවි කර තබා ඇති කිසිවක් මහජනයාට අනතුරුදායක ප්‍රභවයක් නොවන බවට සහතික කිරීමට හැකි ආකාරයෙන් (1) වන ඡේදය මගින් පැවරී ඇති බලතල බලපත්‍රලාභියකු විසින් ක්‍රියාත්මක කළ යුතු අතර, බලපත්‍රලාභියා විසින් -

(අ) කඩන ලද හෝ විවෘත කරන ලද කොටස වටා වැට බැඳ ආරක්ෂා කිරීම පිණිස වහාම කටයුතු සැලැස්විය යුතු ය;

(ආ) ඒ කොටස කඩා දමා හෝ විවෘත කර තබන කාලය තුළ දී, ඒ කොටසට එරෙහිව හෝ ඒ අසල එතනින් යන එන්නන්ට අනතුරු හැඟවීම පිණිස ප්‍රමාණවත් ආලෝක සංඥාවක් හිරු බැසීමේ සිට හිරු උදාව තෙක් සවි කොට පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය; සහ

(ඇ) හැකි සාධාරණ ඉක්මනින් බිම පුරවා යථා තත්ත්වයට පත් කළ යුතු අතර, කඩා දමන ලද හෝ විවෘත කරන ලද බිම හෝ පදික වේදිකාව හෝ කසළ කාණුව, කාණුව හෝ උමඟ නිසි පරිදි සකස් කළ යුතු අතර, එය මාස තුනක කාලයක් නිසි අලුත්වැඩියා තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, යම්කිසි කිඳා බැසීමක් ඇති වූයේ නම්, ඒ කිඳා බැසීම පවත්නා කාලය තුළ දී මාස හයක් නොඉක්මවන තවදුරටත් වූ යම් කාලයක් නිසි අලුත්වැඩියා තත්ත්වයෙන් පවත්වා ගෙන යා යුතු ය.

(8) (7) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින බලපත්‍රලාභියකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසක් නොඉක්මවන්නා වූ දඩයකට යටත් විය යුතු ය.

**2.** (1) 1 වන අයිතමයෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී කරනු ලබන කර්මාන්ත නිසා පහත දැක්වෙන යම් කිසිවක තාවකාලික හෝ ස්ථිර වෙනසක් කිරීමට සිදු වුව ද බලපත්‍රලාභියා විසින් ඒ කර්මාන්ත කර ගෙන යනු ලැබිය හැකි ය:-

(අ) වෙනත් බලපත්‍රලාභියකුගේ පාලනය යටතේ පවතින යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතයක්;

(ආ) ගෑස් ක්‍රියාකාරිකයකුගේ පාලනය යටතේ පවතින ගෑස් ප්‍රවාහනය සඳහා භාවිත කරන යම් පයිප්පයක් ද ඇතුළුව, (එය ඇත්තේ වීථියක් තුළ හෝ නොවූව ද) ජල ක්‍රියාකාරියකුගේ, කසල නාලිකා ක්‍රියාකාරිකයකුගේ හෝ ව්‍යවස්ථාපිත බලතල ක්‍රියාත්මක කරමින් ජලය සපයන තැනැත්තකුගේ පාලනය යටතේ වූ යම් පයිප්පයක්;

(ඇ) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ බලපත්‍රලත් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරන විදුලි සංදේශ පද්ධතියක කාර්යය සඳහා භාවිත කරනු ලබන කිසියම් විදුලි සංදේශ උපකරණයක;

(ඈ) දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් මෙහෙයවනු ලබන විදුලි පණිවිඩ යැවීමේ පද්ධතියක කාර්යය සඳහා භාවිත කරනු ලබන කිසියම් විදුලි සංදේශ උපකරණයක්; හෝ

(ඉ) 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත අදාළ වන කේබල් රූපවාහිනී පද්ධතියක කාර්ය සඳහා භාවිත කරනු ලබන කිසියම් විදුලි සංදේශ උපකරණයක්.

(2) (1) වන ඡේදයේ (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඉ) වන අනුඡේදවල සඳහන් කරන ලද එවැනි යම් වෙනස් කිරීමක් සිදු වන හෝ සිදු විය හැකි කර්මාන්ත 1 වන අයිතමයෙන් පවරන ලද බලය ක්‍රියාත්මක කිරීමේ දී බලපත්‍රලාභියකු විසින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන අවස්ථාවක, මේ ඡේදයේ අනුප්‍රාප්තික විධිවිධාන අදාළ විය යුතු අතර, ඒ විධිවිධානවල "ක්‍රියාකාරිකයා" යන සඳහන් කිරීමක්, (1) වන ඡේදයේ (අ) වන, (ආ) වන, (ඇ) වන, (ඈ) වන හෝ (ඉ) වන අනුඡේදවල සඳහන් කර ඇති "ක්‍රියාකාරිකයකු" සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් ලෙස සැලකිය යුතු ය.

(3) යම් විදුලි මාර්ගයක හෝ විදුලි පිරියත සම්බන්ධයෙන් වෙනස් කිරීම් කරන ලෙස එවැනි කර්මාන්ත (1) වන ඡේදයේ (අ) වන අනුඡේදය තුළට අඩංගු වුව ද ඒ බව නොසලකා මහජනයාගෙන් අයකු විසින් අදාළ බලපත්‍රලාභියකුගේ ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(4) (5) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, බලපත්‍රලාභියකු විසින්, කර්මාන්තය ආරම්භ කිරීමට පෙරාතුව එක් මසකට නොඅඩු, බලපත්‍රලාභියා විසින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනු ලබන කර්මාන්තවල ස්වභාවය, සිදු වන හෝ සිදු වීමට ඉඩ ඇති වෙනස් වීම සහ කර්මාන්තය ආරම්භ කිරීමට යෙදෙන වේලාව සහ ස්ථානය නිශ්චිතව සඳහන් කෙරෙන දැන්වීමක් අදාළ ක්‍රියාකාරිකයා වෙත දිය යුතු ය.

(5) කර්මාන්තය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමෙන් පසු ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් අදාළ ක්‍රියාකාරිකයාට බලපත්‍රලාභියා විසින් දැනුම් දීම කෙරෙන්නා වූ යම් හදිසි කර්මාන්ත සම්බන්ධයෙන් (4) වන ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය

(6) (4) වන ඡේදය යටතේ බලපත්‍රලාභියා විසින් අදාළ ක්‍රියාකාරිකයාට දැන්වීම, දී ඇති අවස්ථාවක, දැන්වීමේ දිනයේ සිට දින හතක කාලයක් තුළ දී ක්‍රියාකාරිකයා විසින්-

(අ) බලපත්‍රලාභියා විසින් කරගෙන යාමට යෝජනා කරනු ලබන කර්මාන්තවලින් අවශ්‍ය කෙරෙන්නා වූ හෝ උචිත වන්නා වූ යම් වෙනස් කිරීමක් ක්‍රියාකාරිකයා විසින් ම කිරීමට අදහස් කරන බව; හෝ

(ආ) ක්‍රියාකාරිකයාගේ අධීක්ෂණය යටතේ සහ ක්‍රියාකාරිකයා සෑහීමට පත් වන ආකාරයට එවැනි යම් වෙනස් කිරීමක් බලපත්‍රලාභියා විසින් ම කිරීම ක්‍රියාකාරිකයා විසින් නියම කරන බව,

යන දෙකින් කවරක් හෝ සඳහන් කරන ප්‍රතිදැන්වීමක් බලපත්‍රලාභියා වෙත දිය හැකි ය.

(7) (6) වන ඡේදය යටතේ දෙන ලද ප්‍රතිදැන්වීමක යම් වෙනස් කිරීමක් ඔහු විසින් හෝ ඇය විසින් ම කිරීමට අදාළ ක්‍රියාකාරිකයා අදහස් කරන බව සඳහන් කර ඇති අවස්ථාවක,-

(අ) ඒ වෙනස් කිරීම කිරීමේ කාර්යය සඳහා යම් කර්මාන්තයක් ක්‍රියාත්මක කිරීම පිණිස, බලපත්‍රලාභියා වෙනුවට ක්‍රියාකාරිකයාට අයිතිය තිබිය යුතු ය; සහ

(ආ) එම කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේ දී ක්‍රියාකාරිකයා විසින් දරන්නට යෙදුණු යම් සාධාරණ වියදම් සහ ඒ වෙනස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රියාකාරිකයාට විඳින්නට සිදු වූ යම් පාඩුවක හෝ අලාභහානියක ප්‍රමාණය ක්‍රියාකාරිකයා විසින් බලපත්‍රලාභියාගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

(8) (6) වන ඡේදය යටතේ දෙන ලද ප්‍රතිදැන්වීමක අදාළ ක්‍රියාකාරිකයාගේ අධීක්ෂණය යටතේ සහ ඔහු සෑහීමට පත් වන ආකාරයෙන් යම් වෙනස් කිරීමක් කළ යුතු බව සඳහන් වන අවස්ථාවක-

(අ) බලපත්‍රලාභියා විසින්, ඒ ප්‍රතිදැන්වීමේ නියමයන් අනුව ක්‍රියා කිරීමක් හැර වෙනස් කිරීම නොකළ යුතු ය; සහ

(ආ) ඒ අධීක්ෂණය කිරීමේ දී හෝ ඒ හා සම්බන්ධිතව ක්‍රියාකාරිකයා විසින් දරන ලද යම් සාධාරණ වියදම් සහ ඒ වෙනස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රියාකාරිකයාට විඳින්නට සිදු වූ යම් පාඩුවක හෝ අලාභහානියක ප්‍රමාණය ක්‍රියාකාරිකයා විසින් බලපත්‍රලාභියාගෙන් නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක දී අයකර ගනු ලැබිය යුතු ය.

(9) (අ) (6) වන ඡේදය යටතේ ප්‍රතිදැන්වීමක්, දී නොමැති අවස්ථාවක; හෝ

(ආ) ඒ ඡේදය යටතේ ප්‍රතිදැන්වීමක් දීමෙන් පසු, බලපත්‍රලාභියා විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත කර්මාන්ත මගින් අවශ්‍ය කරන්නා වූ හෝ උචිත වන්නා වූ යම් වෙනස් කිරීමක්, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභියා විසින් දැන්වීම මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන (පැය හතලිස්අටකට නොඅඩු වන) යම් කාලසීමාවක් තුළ දී සිදු කිරීම අදාළ ක්‍රියාකාරිකයා විසින් පැහැර හරිනු ලැබූ හෝ අවශ්‍ය අධීක්ෂණය සැපයීමට සාධාරණ හේතු රහිතව අපොහොසත් වූ අවස්ථාවක,

වෙනස් කිරීම කිරීමේ කාර්ය සඳහා අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභියා විසින් ඒ කර්මාන්ත ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාකාරිකයාගේ අධීක්ෂණය නොමැතිව ඒ කර්මාන්ත ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය හැකි ය: එහෙත් ඒ අවස්ථා දෙකෙන් කවර අවස්ථාවක වුව ද, ඒ කර්මාන්ත ක්‍රියාකාරිකයා සෑහීමට පත් වන ආකාරයට ක්‍රියාත්මක කළ යුතු ය.

(10) (අ) (4) වන ඡේදය මගින් නියම කර ඇති දැන්වීම දීමෙන් තොරව යම් කර්මාන්තයක් ක්‍රියාත්මක කරන්නා වූ; හෝ

(ආ) මේ ඡේදය යටතේ අදාළ ක්‍රියාකාරිකයකු විසින් දෙන ලද යම් සාධාරණ නියමයක් අනුව ක්‍රියා කිරීමට සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින,

බලපත්‍රලාභියකු හෝ එකී බලපත්‍රලාභියාගේ යම් නියෝජිතයන් මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**3.** (1)(අ) බලපත්‍රලාභියකුගේ බලපත්‍රයක් මගින් කර ගෙන යාම පිණිස බලපත්‍රලාභියාට බලය දී ඇති කටයුතු කරගෙන යාමට සම්බන්ධිත යම් කාර්යයක් සඳහා බලපත්‍රලාභියකුට යම් ඉඩමක් මත, යටින් හෝ උඩින් විදුලි මාර්ගයක් සවි කිරීම හෝ සවි කොට පවත්වා ගැනීම අවශ්‍ය කරන්නා වූ හෝ උචිත වන්නා වූ අවස්ථාවක; සහ

(ආ) ඉඩමේ අයිතිකරුට හෝ පදිංචිකරුට, දැන්වීමේ නිශ්චිතව සඳහන් (දින විසිඑකකට අඩු නොවිය යුතු) කාලසීමාවක් තුළ දී අවශ්‍ය මාර්ග අවසරය දෙන ලෙස නියම කරමින් දැන්වීමක් දීමෙන් පසු එකී අයිතිකරු හෝ පදිංචිකරු විසින්-

(i) ඒ කාලසීමාව අවසාන වීමට ප්‍රථම මාර්ග අවසරය දීම පැහැර හරින ලද; හෝ

(ii) බලපත්‍රලාභියාට පිළිගත නොහැකි නියම සහ කොන්දේසිවලට යටත්ව මාර්ග අවසරය දී ඇති අවස්ථාවක,

මේ අයිතමය අදාළ විය යුතු ය.

(2) (අ) තම බලපත්‍රය මගින් කර ගෙන යාම පිණිස බලපත්‍රලාභියකුට බලය දී ඇති කටයුතු කර ගෙන යාම හා සම්බන්ධිත කිසියම් කාර්යයක් සඳහා යම් ඉඩමක් මත, යටින් හෝ උඩින් විදුලි මාර්ගයක් සවිකර තබා ගැනීමට බලපත්‍රලාභියකුට අවශ්‍ය වන්නා වූ හෝ උචිත වන්නා වූ අවස්ථාවක; සහ

(ආ) ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් 5(2) වන ඡේදය යටතේ විදුලි මාර්ගය ඉවත් කරන ලෙස ඉල්ලමින් බලපත්‍රලාභියා වෙත දැන්වීමක් දී ඇති අවස්ථාවක,

මේ අයිතමය අදාළ විය යුතු ය.

(3) (1) වන හෝ (2) වන ඡේද අදාළ වන සහ නියාමක -

(අ) මාර්ග අවසරයක් ලබා ගැනීම සුරක්ෂිත කර ගැනීම පිණිස බලපත්‍රලාභියකු විසින් සියලු සාධාරණ ප්‍රයත්න ගෙන ඇති බවට;

(ආ) එම ප්‍රයත්න අසාර්ථක වී ඇති බවට; සහ

(ඇ) බලපත්‍රලාභියාගේ බලපත්‍රය මගින් බලය දී ඇති කටයුතු කරගෙන යාම සඳහා එම මාර්ග අවසරය අත්කර ගැනීම අවශ්‍ය වී තිබෙන බවට,

සෑහීමට පත් වූ අවස්ථාවක, නියාමක විසින්, බලපත්‍රලාභියා විසින් කරන ලද ඉල්ලීමකින් පසු සති හයක් තුළ දී මාර්ග අවසරය අත්කර ගැනීම අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය යුතු ය. ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමය මගින් අමාත්‍යවරයා විසින් යෝජිත අත්කර ගැනීම අනුමත කරනු ලැබූ අවස්ථාවක, මාර්ග අවසරය පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය වී ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, (295 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබ බලපත්‍රලාභියා වෙත පවරා දිය හැකි ය.

(4) (3) වන ඡේදය යටතේ මාර්ග අවසරයක් අත්කර ගැනීම-

(අ) ඉඩම වාසස්ථානයකින් ආවරණය වී තිබෙන හෝ ඒ ඉඩමෙහි වාසස්ථානයක් ඉදි කිරීම සඳහා නීති යටතේ සැලසුම් අවසරය ප්‍රදානය කර ඇති අවස්ථාවක දී; සහ

(ආ) විදුලි මාර්ගය සවි කිරීමට ඇත්තේ එම ඉඩම මත හෝ උඩින් වන අවස්ථාවක දී,

නියාමක විසින් නිර්දේශ කරනු නොලැබිය යුතු ය.

(5) (3) වන ඡේදය යටතේ නිර්දේශයක් කිරීමට ප්‍රථමයෙන්, නියාමක විසින්-

(අ) ඉඩමේ පදිංචිකරුට; සහ

(ආ) පදිංචිකරු ඒ ඉඩමේ අයිතිකරු නොවන අවස්ථාවක, අයිතිකරුට,

නියාමක විසින් පත් කරන ලද තැනැත්තකු විසින් කරනු ලබන කරුණු විමසීමක දී සවන් දෙනු ලැබීමේ අවස්ථාවක් ලබා දිය යුතු ය.

(6) (295 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ මාර්ග අවසරයක් අත්කර ගනු ලැබ, බලපත්‍රලාභියා වෙත එය පවරා දෙනු ලැබූ අවස්ථාවක, ඒ මාර්ග අවසරය-

(අ) ඉඩම කෙරෙහි වූ සම්බන්ධතා හෝ ඒ මත තාවකාලික බැඳීම් හෝ ඊට බලපාන වෙනත් බැඳීම් ලියාපදිංචි කිරීමට නියම කෙරෙන්නා වූ යම් නීති ප්‍රඥප්තියක විධිවිධානවලට යටත් නොවිය යුතු ය;

(ආ) ඉඩමේ කවර හෝ වේලාවක අයිතිකරු හෝ පදිංචිකරු වන කවර හෝ තැනැත්තකු කෙරෙහි බන්ධනය විය යුතු ය.

4. (1) 3 වන අයිතමය යටතේ බලපත්‍රලාභියකුට මාර්ග අවසරයක් ප්‍රදානය කර ඇති අවස්ථාවක-

(අ) ඉඩමේ පදිංචිකරු විසින්; හෝ

(ආ) පදිංචිකරු ඉඩමේ අයිතිකරු ද නොවන අවස්ථාවක, ඉඩමේ අයිතිකරු විසින්,

නියාමක විසින් තීරණය කරනු ලැබිය හැකි, ඒ ප්‍රදානය වෙනුවෙන් සාධාරණ වන්දියක් බලපත්‍රලාභියාගෙන් අයකර ගනු ලැබිය හැකි ය.

(2) එවැනි මාර්ග අවසරයකින් පවරන ලද යම් අයිතියක් ක්‍රියාත්මක කිරීමේ දී ඉඩමට හෝ චංචල දේපළවලට යම් හානියක් සිදු වූ අවස්ථාවක, ඉඩම කෙරෙහි හෝ චංචල දේපළ කෙරෙහි සම්බන්ධතාව ඇති යම් තැනැත්තකු විසින් ඒ අලාභහානිය සම්බන්ධයෙන් බලපත්‍රලාභියාගෙන් සාධාරණ වන්දි අයකර ගනු ලැබිය හැකි ය. තව ද, එවැනි අයිතියක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, තැනැත්තකුට යම් ඉඩමක් හෝ චංචල දේපළක් එකී තැනැත්තා විසින් භුක්ති විඳීමේ දී බාධා කිරීමක් සිදු වූ අවස්ථාවක, ඒ බාධා වීම සම්බන්ධයෙන් නියාමක විසින් තීරණය කරනු ලබන පරිදි වූ මුදලකින් බලපත්‍රලාභියාගෙන් වන්දි අයකර ගනු ලැබිය හැකි ය.

(3) නියාමක විසින්, ස්වකීය පෙලඹවීමෙන්ම හෝ බලපෑමට ලක් වූ තැනැත්තකුගේ ඉල්ලීම මත, (1) වන සහ (2) වන ඡේද යටතේ බලපත්‍රලාභියකු යම් තැනැත්තකුට යම් වන්දියක් ගෙවීමට යටත්ව සිටින්නේ දැයි තීරණය කිරීම පිණිස අවශ්‍ය විය හැකි විමසීම් සිදු කරනු ලැබිය හැකි ය.

(4) (3) වන ඡේදය යටතේ වූ යම් තීරණයක් නියාමක විසින් බලපත්‍රලාභියාට සහ වන්දි ඉල්ලා ඇති යම් තැනැත්තකුට හෝ වන්දි ප්‍රදානය කරනු ලැබූ තැනැත්තකුට දන්වා සිටිය යුතු ය.

(5) (1) වන හෝ (2) වන ඡේද යටතේ වන්දි ගෙවීමට නොමැති බවට වූ නියාමකගේ තීරණයකින් අතෘප්තියට පත් තැනැත්තකු විසින් හෝ නියාමක විසින් ගෙවීමට තීරණය කරන ලද වන්දියේ ප්‍රමාණය කෙරෙහි සෑහීමට පත් නොවුණු තැනැත්තකු විසින්, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක, වන්දි ඉල්ලා සිටිනු ලබන බලපත්‍රලාභියාට විරුද්ධව ඒ තැනැත්තා ඉල්ලා සිටින වන්දි මුදල හෝ ඒ තැනැත්තා ඉල්ලා සිටින වන්දි මුදල සහ ඒ තැනැත්තාට ගෙවීමට නියාමක විසින් තීරණය කර ඇති වන්දි මුදල අතර වෙනස අය කර ගැනීම සඳහා නඩු පවරනු ලැබිය හැකි ය.

(6) (5) වන ඡේදය යටතේ යම් තැනැත්තකු විසින් ගෙනෙනු ලබන යම් නඩුවක්-

(අ) (4) වන ඡේදය යටතේ නියාමක විසින් එවනු ලබන සන්නිවේදනයක් ඒ තැනැත්තාට ලැබුණු දිනයේ සිට;

(ආ) නියාමක විසින් තීරණය කරන ලද වන්දියේ ප්‍රමාණය (7) වන ඡේදය යටතේ ඒ තැනැත්තාට ගෙවූ දිනයේ සිට; හෝ

(ඇ) (7) වන ඡේදය යටතේ ඒ මුදල අධිකරණයට ගෙවීම පිළිබඳ දැන්වීම දුන් හෝ පළමුවන වතාවට ප්‍රදර්ශනය කළ දිනයේ සිට,

මාස දෙකක කාලයක් තුළ දී පවරනු ලැබිය යුතු ය.

(7) (1) වන හෝ (2) වන ඡේද යටතේ ඒ ඉඩමේ අයිතිකරුට වන්දි මුදලක් ගෙවීමට යටත්ව සිටින බලපත්‍රලාභියකු විසින් ඒ මුදල, නියාමක විසින් තීරණය කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත දී ඒ තැනැත්තා වෙත ගෙවිය යුතු ය. අයිතිකරු කවරෙක් දැයි නොදන්නා විට හෝ ඉඩමේ අයිතිය ආරාවුලකට යටත්ව තිබෙන විට, බලපත්‍රලාභියා විසින්-

(අ) ඒ මුදල, ඉඩම පිහිටි ස්ථානය අරබයා නිසි අධිකරණ බලය ඇති දිසා අධිකරණයෙන්, හිමිකම ඔප්පු කිරීම මත ඒ තැනැත්තා විසින් ලබා ගනු පිණිස නියාමක තීරණය කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත දී ඒ අධිකරණය වෙත ගෙවිය යුතු ය; සහ

(ආ) නියාමක විසින් තීරණය කරන ලද කාලය ඇතුළත, ඒ මුදල අධිකරණය වෙත ගෙවීම පිළිබඳ ලිඛිත දැන්වීම් ඉඩමේ පදිංචිකරු වෙත දිය යුතු අතර, පදිංචිකරුවකු නොසිටී නම්, ඒ දැන්වීම ඒ ඉඩමේ හොඳින් පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

5. (1) (3) වන අයිතමයේ සඳහන් කරන ලද පරිදි වූ (ඒ අයිතමය යටතේ ප්‍රදානය කරන ලද්දේ හෝ පාර්ශ්වයන් අතර එකඟත්වයෙන් දෙන ලද්දේ වුව ද) මාර්ග අවසරයක් කිසියම් අවස්ථාවක -

(අ) මාර්ග අවසරයේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඉකුත්ව යාමෙන් පසු තීරණය කරනු ලබන අවස්ථාවක;

(ආ) මාර්ග අවසරයේ අන්තර්ගත නියමයකට අනුකූලව ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් අවසන් කරනු ලැබූ අවස්ථාවක; හෝ

(ඇ) මාර්ග අවසරය දීමෙන් පසු ඉඩමේ අයිතිය හෝ පදිංචිය වෙනස් වීම හේතුවෙන්, එය ඉඩමේ අයිතිකරු කෙරෙහි හෝ පදිංචිකරු කෙරෙහි බන්ධනය වීම අවසන් වන අවස්ථාවක,

මේ ඡේදය අදාළ විය යුතු ය.

(2) (1) වන ඡේදය තුළට ගැනෙන කාරණයක දී ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් -

(අ) මාර්ග අවසරයේ නිශ්චිතව සඳහන් කාලසීමාව අවසාන වීමට ප්‍රථමයෙන් මාස තුනකට පසුව හෝ ඇතුළත ඕනෑම අවස්ථාවක දී;

(ආ) එකී ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් මාර්ග අවසරය අවසන් කරන ලද ඕනෑම අවස්ථාවක දී; හෝ

(ඇ) ඒ ඡේදයේ සඳහන් කර ඇති පරිදි ඉඩමේ අයිතියෙහි හෝ පදිංචියෙහි සිදු වන වෙනස්වීමක් ප්‍රකාර ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු බවට පත් වීමෙන් පසු ඕනෑම අවස්ථාවක දී,

ඉඩමෙන් විදුලි මාර්ගය ඉවත් කරන ලෙස බලපත්‍රලාභියාට නියම කරමින් බලපත්‍රලාභියා වෙත දැන්වීමක් දෙනු ලැබිය හැකි ය. එසේ වුව ද, මේ ඡේදයේ

පහත දැක්වෙන විධිවිධානවලින් ඉඩ සලස්වා ඇති අවස්ථාගත කරුණුවල දී සහ ප්‍රමාණයට හැර, එවැනි දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීමට බලපත්‍රලාභියා බැඳී නොසිටින්නේ ය.

(3) (2) වන ඡේදය යටතේ වූ දැන්වීමේ දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලයක් තුළ දී, බලපත්‍රලාභියා -

(අ) 3 වන අයිතමය යටතේ අවශ්‍ය මාර්ග අවසරය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමට අපොහොසත් වන අවස්ථාවක;

(ආ) 3 වන අයිතමය යටතේ අවශ්‍ය කරන මාර්ග අවසරය ලබා ගැනීම පිණිස ඉල්ලීමක් කරනු ලැබ ඒ ඉල්ලීම නියාමක විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක;

(ඇ) මේ උපලේඛනයේ 7 වන අයිතමය යටතේ ඉඩම අනිවාර්යයෙන් මිලට ගැනීමට බලය දෙමින් වූ නියමයක් ලබා ගැනීමට අසමත් වූ අවස්ථාවක,

බලපත්‍රලාභියා විසින්, කාලසීමාව අවසානයේ දී නැතහොත් (ආ) වන අනුඡේදය සම්බන්ධයෙන් වන විට, නියාමකගේ තීරණයේ දිනයෙන් ආරම්භ වන මාසයක කාලසීමාව හෝ නියාමක විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ඊට වඩා දීර්ඝ කාලයක් අවසානයේ දී හෝ දැන්වීමට අනුව ක්‍රියා කළ යුතු ය.

(4) මේ උපලේඛනයෙහි ඉඩමකට අදාළව "මාර්ග අවසරය" යන්නෙන්, ඒ ඉඩම මත, යට හෝ උඩින් විදුලි මාර්ගයක් සවි කිරීම පිණිස සහ සවි කර තැබීම පිණිස ද ඒ විදුලි මාර්ගය පරීක්ෂා කිරීමේ, නඩත්තු කිරීමේ, වෙනස් කිරීමේ, අලුත්වැඩියා කිරීමේ, ඉවත් කිරීමේ හෝ ප්‍රතියෝජනය කිරීමේ කාර්යය සඳහා ඒ ඉඩමට ප්‍රවේශය ලැබීම පිණිස බලපත්‍රලාභියාට අයිතියක් සැදෙන පරිදි ඉඩම කෙරෙහි වූ සම්බන්ධතාව අදහස් වේ.

6. (1) බලපත්‍රලාභියා විසින් සවි කර ඇත්තා වූ හෝ සවි කරනු ලබන්නා වූ හෝ සවි කිරීමට ඇත්තා වූ හෝ විදුලි මාර්ගයකට හෝ විදුලි පිරියතයකට -

(අ) ඒ විදුලි මාර්ගය හෝ විදුලි පිරියත සවි කිරීම, නඩත්තුව හෝ ක්‍රියකාරිත්වයට බාධා කෙරෙන හෝ මැදිහත් වන පරිදි; හෝ

(ආ) පිළිගත නොහැකි, (ළමයින්ට හෝ වෙනත් තැනැත්තන්ට) අනතුරු ඇති කරන ප්‍රභවයක් සැදෙන පරිදි,

යම් ගසක් සමීප ස්ථානගතව තිබෙන හෝ තිබිය හැකි අවස්ථාවක, මේ අයිතමය අදාළ විය යුතු අතර, මේ අයිතමයේ "ඉඩම" යන්නෙන්, ගස වැඩෙමින් පවතින්නා වූ ඉඩම අදහස් වේ.

(2) (1) වන ඡේදයේ (අ) හෝ (ආ) වන අනුඡේදවල සඳහන් කරන ලද බලපෑම්වලින් වැළකීමට හැකි වන පරිදි, ගස කපා දැමීමට හෝ අතු කපා දැමීමට හෝ එහි මුල් කපා දැමීමට ඉඩමේ පදිංචිකරුට නියම කරමින් වූ දැන්වීමක්, ඒ දැන්වීමේ නියමයන් අනුව කටයුතු කිරීමේ දී එකී පදිංචිකරු විසින් සාධාරණ ලෙස දරන ලද වියදම් බලපත්‍රලාභියා විසින් එකී පදිංචිකරුට ගෙවීමට යටත්ව, බලපත්‍රලාභියා විසින් එකී පදිංචිකරුට දිය හැකි ය.

(3) පදිංචිකරු ඉඩමේ අයිතිකරු ද නොවන අවස්ථාවක, (2) වන ඡේදය යටතේ වූ යම් දැන්වීමක පිටපතක් අයිතිකරු වෙත ද භාර දෙනු ලැබිය යුතු ය.

(4) (2) වන ඡේදය යටතේ දැන්වීමක් දීමෙන් පසු, දින විසිඑකක් ඇතුළත දී -

(අ) දැන්වීමේ නියමයන් ඉටු කර නොමැත්තේ නම්; සහ

(ආ) ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු යන දෙදෙනාම විසින් (5) වන ඡේදය යටතේ ප්‍රතිදැන්වීමක් දී නොමැත්තේ නම්,

බලපත්‍රලාභියා විසින්, (1) වන ඡේදයේ (අ) වන හෝ (ආ) වන අනුඡේදවල සඳහන් කරන ලද බලපෑමෙන් වළක්වාලීමට හැකි වන පරිදි ඒ ගස කපා දැමීමට හෝ අතු කපා දැමීමට හෝ එහි මුල් ගලවා දැමීමට කටයුතු සැලැස්විය යුතු ය.

(5) (2) වන ඡේදය යටතේ දැන්වීමක් දීමෙන් දින විසිඑකක් ඇතුළත දී, ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින්, දැන්වීමේ නියමයන්ට විරෝධය ප්‍රකාශ කරමින් ප්‍රතිදැන්වීමක් බලපත්‍රලාභියාට දෙන්නේ නම්, කාරණය නියාමක වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(6) (5) වන ඡේදය යටතේ නියාමක වෙත යොමු කිරීමෙන් පසු, නියාමක විසින් පත් කරන ලද තැනැත්තකු විසින් කරුණු විමසා බැලීම පිණිස පාර්ශ්වකරුවන්ට අවස්ථාවක් දීමෙන් පසු, නියාමක විසින් යුක්ති සහගත යයි අවස්ථානුකූල කරුණු අනුව කල්පනා කරන නියමයක් කරනු ලැබිය හැකි ය; එම නියමය මගින් -

(අ) (නියමය මගින් විධාන කෙරෙන පරිදි කර්මාන්තය ආරම්භ කිරීම පිළිබඳව වූ දැන්වීම, ප්‍රතිදැන්වීමක් දී ඇති තැනැත්තකු වෙත දීමෙන් පසු,) 1 වන ඡේදයේ (අ) වන හෝ (ආ) වන අනුඡේදයේ සඳහන් බලපෑමක් වැළැක්වීමට හැකි වනු පිණිස ඒ ගස කපා දැමීමට හෝ අතු කපා දැමීමට හෝ මුල් කපා දැමීමට සැලැස්වීම පිණිස බලපත්‍රලාභියාට ඉඩ දිය හැකි ය; සහ

(ආ) අයිතිකරු හෝ පදිංචිකරු විසින් බලපත්‍රලාභියාට ගෙවිය යුතු වියදම් (කිසිවක් වේ නම්) කවරේද යන්න පිළිබඳ යම් ප්‍රශ්නයක් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(7) (4) වන ඡේදයට හෝ (6) වන ඡේදය යටතේ කරන ලද නියමයකට අනුව බලපත්‍රලාභියා ක්‍රියා කරන අවස්ථාවක, බලපත්‍රලාභියා විසින් -

(අ) ගස් කපා බිම හෙළීමට හෝ අතු කපා දැමීමට නැතහොත්, සුදුසු වෘක්ෂ වගා පිළිවෙතකට අනුකූලව සහ ගස්වලට, වැටවලට, බඩවැටිවලට සහ වැඩෙන එළදාවට හැකිතාක් අඩුවෙන් හානි සිදු විය හැකි පරිද්දෙන් ඒවායේ මුල් කැපීමට සැලැස්වීම;

(ආ) කපා බිම හෙලූ ගස්, කපන ලද අතු හෝ කැපූ මුල්, අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ විධානවලට අනුකූලව ඉවත් කිරීමට සැලැස්වීම; සහ

(ඇ) ඉඩමට කරන ලද යම් හානියක් පූර්ණය කිරීම,

කරනු ලැබිය යුතු ය.

(8) මේ අයිතමයේ "ගස" යන්නට, යම් පඳුරක් ඇතුළත් වන අතර, " කපා බිම හෙලීම" සහ "අතු කැපීම" සම්බන්ධයෙන් වූ යොමු කිරීම්, ඒ අනුව තේරුම් ගත යුතු ය.

**7.** (1) බලපත්‍රලාභියකුගේ බලපත්‍රයක් මගින් කර ගෙන යාමට බලපත්‍රලාභියාට බලය දී ඇති කටයුතු කර ගෙන යාමේ කාර්යය සඳහා හෝ ඒ බලපත්‍රලාභියාට මේ පනතින් වෙන් කර දී ඇති යම් කර්තව්‍යයක් ඉටු කිරීමේ කාර්යය සඳහා යම් නිශ්චල දේපළක් අවශ්‍ය කරන බවට නියාමක සෑහීමට පත් වූ අවස්ථාවක සහ -

(අ) ඒ දේපළ අත්කර ගැනීම සාකච්ඡා කිරීම පිණිස දේපළේ අයිතිකරු සමඟ බලපත්‍රලාභියා විසින් සියලු සාධාරණ උත්සාහ දරා ඇති; සහ

(ආ) එම උත්සාහයන් අසාර්ථක වී ඇති අවස්ථාවක,

නිශ්චල දේපළ (295 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගන්නා ලෙසත් එය බලපත්‍රලාභියාට පවරා දෙන ලෙසත් නියාමක විසින් අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන ඡේදය යටතේ කරන ලද නියාමකගේ නිර්දේශයෙහි නිශ්චිතව සඳහන් නිශ්චල දේපළේ යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, ඒ නිශ්චල දේපළ පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, (295 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන බලපත්‍රලාභියා වෙත පැවරිය යුතු ය.

(3) බලපත්‍රලාභියකු සඳහා (295 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතු ය.

(4) ඒ නිශ්චල දේපළ, එය අයිති වෙනත් බලපත්‍රලාභියකු විසින්, බලපත්‍රලාභියාගේ බලපත්‍රයෙන් බලපත්‍රලාභියාට බලය දී ඇති කටයුතු කර ගෙන යාම සඳහා අවශ්‍ය කරන සවි කිරීමක කාර්යය සඳහා භාවිත කරනු ලබන්නේ නම්, හෝ එවැනි සවි කිරීමක කාර්යය සඳහා ඒ වෙනත් බලපත්‍රලාභියා විසින් අවුරුදු පහක කාලයක් ඇතුළත භාවිත කිරීමට යෝජනා කර ඇත්තේ නම්, නියාමක විසින්, (1) වන ඡේදය යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම නිර්දේශ කරනු නොලැබිය යුතු ය.

## **III** වන උපලේඛනය

[21(7)(ඈ) වන වගන්තිය]

### විදුලිබල සැපයීම් සංග්‍රහය

**1.** (1) (2) වන ඡේදයට යටත් ව, විදුලිබලය සැපයීම සම්බන්ධයෙන් හෝ යම් විදුලි මීටරයක්, විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතයක් සැපයීම සම්බන්ධයෙන්

බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින්, අයකුම පරිභෝගිකයකුගෙන් බලපත්‍රලාභියාට ලැබිය යුතු යම් ගාස්තුවක් අයකර ගනු ලැබිය යුතු ය.

(2) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින්, අයකුම පාරිභෝගිකයකුට විදුලිය සැපයූ යම් පරිශ්‍රයකින් එකී අයකුම පාරිභෝගිකයා විසින් බෙදා හැරීමේ බලපත්‍රලාභියාට යටත් පිරිසෙයින් වැඩ කරන දින දෙකකටවත් පෙර දැනුම්දීමක් නොකර ඉවත් වී ගියහොත් එකී අයකුම පාරිභෝගිකයා, පරිශ්‍රයට සපයන ලද විදුලිය වෙනුවෙන් -

(අ) පරිශ්‍රයට සාධාරණ ප්‍රවේශය දීමට යටත්ව, එකී අයකුම පාරිභෝගිකයා ඒ දැන්වීම දීමෙන් පසු දෙවන වැඩ කරන දිනයට කලින් දින තෙක්;

(ආ) යම් මීටරයක සලකුණු වී ඇති සංඛ්‍යාව ස්ථිර ලෙස සහතික කර ගත් දිනයට පසු දිනයට කලින් දින තෙක්; සහ

(ඇ) අනතුරුව එම පරිශ්‍රයේ පදිංචි වන යම් තැනැත්තකු විසින් පරිශ්‍රයට විදුලිය සපයන ලෙස සැපයුම්කරුගෙන් ඉල්ලා සිටින දිනයට කලින් දින තෙක්,

එකතු වී ඇති සියලු ගාස්තු ගෙවීමට යටත් විය යුතු ය.

(3) අයකුම පාරිභෝගිකයකු විසින්, බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට ගෙවිය යුතු විදුලිය ගාස්තු සඳහා වූ සෑම ඉල්ලීම් පත්‍රිකාවක් මතම, (2) වන ඡේදයේ විධිවිධාන හෝ එම විධිවිධාන සඳහන් කෙරෙන ප්‍රකාශයක් පිටසන් කරනු ලැබිය යුතු ය.

(4) බෙදාහැරීමේ බලපත්‍රලාභියකු විසින්, අයකුම පාරිභෝගිකයකුට, විදුලිබලය සැපයූ යම් පරිශ්‍රයක් එකී අයකුම පාරිභෝගිකයා විසින්, සපයන ලද විදුලිබලය වෙනුවෙන් එකී අයකුම පාරිභෝගිකයාගෙන් අයවිය යුතු සියලු ගාස්තු හෝ සැපයුමේ කාර්ය සඳහා වූ යම් විදුලි මීටරයක්, විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතයක් සැපයීමේ වියදම් නොගෙවා ඉවත්ව ගියහොත් බලපත්‍රලාභියා විසින් -

(අ) අයවිය යුතු ගාස්තු එකී අයකුම පාරිභෝගිකයා විසින් ගෙවන තෙක් එකී අයකුම පාරිභෝගිකයාට වෙනත් යම් පරිශ්‍රයක විදුලිබලය සැපයීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය;

(ආ) පරිශ්‍රයේ ඊළඟ පදිංචිකරුට එම ගාස්තු ගෙවන ලෙස නියම කිරීමට එකී බලපත්‍රලාභියාට හිමිකමක් නොමැත්තේ ය.

(5) අයකුම පාරිභෝගිකයකු විසින්-

(අ) යම් පරිශ්‍රයකට සපයන ලද විදුලිබලය වෙනුවෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට අය විය යුතු සියලු ගාස්තු හෝ සැපයුමේ කාර්ය සඳහා වූ යම් විදුලි මීටරයක්, විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතයක් සැපයීමේ වියදම් නියමිත කාලසීමාව තුළ දී නොගෙවුවහොත්; හෝ

(ආ) බලපත්‍රලාභියා විසින් වෙනත් යම් පාරිභෝගිකයකුට දී ඇති සැපයුමට අනිසි ලෙස හෝ අනුචිත ලෙස මැදිහත් වන යම් මෙවලමක් භාවිත කිරීම නවත්වන ලෙස එකී අයක්‍රම පාරිභෝගිකයාට නියම කරමින් බලපත්‍රලාභියාගෙන් ලත් දැන්වීමක් අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්,

නියමිත කාලසීමාව අවසානයේ දී ඒ පරිශ්‍රයට දී ඇති සැපයුම හෝ පාරිභෝගිකයා පදිංචිව සිටින වෙනත් යම් පරිශ්‍රයකට වූ සැපයුම බලපත්‍රලාභියා යෝග්‍ය යයි කල්පනා කරන මාර්ගයකින් කපා හැර, එසේ කිරීමේ යම් වියදමක් පාරිභෝගිකයාගෙන් අයකර ගත යුතු ය.

(6) (5) වන ඡේදයේ සඳහන් වන "නියමිත කාලසීමාව" යන්නෙන් -

(අ) පූර්ණ ලෙස හා ප්‍රධාන ලෙස ගෘහ කාර්ය සඳහා භාවිත කරන පරිශ්‍ර සම්බන්ධයෙන් වන විට, අයවිය යුතු ගාස්තු ගෙවීම සඳහා ලියවිල්ලකින් වූ ඉල්ලීමක් බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් කිරීම හෝ වෙනත් පාරිභෝගිකයකුට දෙන ලද විදුලිය සැපයුම සමඟ මැදිහත් වන මෙවලම් භාවිතය නවත්වන ලෙස අයක්‍රම පාරිභෝගිකයකුට නියම කරමින් බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් දැන්වීමක් කිරීම යන දෙකින් කවරකට හෝ පසු දින දහයකට අඩු නොවන කාලසීමාවක්; සහ

(ආ) වෙනත් යම් පරිශ්‍රයක් සම්බන්ධයෙන් වන විට, එවැනි ඉල්ලීමක් කිරීමෙන් පසු දින දහයක කාලසීමාවක්,

අදහස් වේ.

(7) අයවිය යුතු ගාස්තු පිළිබඳව අව්‍යාජ ආරාවුලක් ඇත්තේ නම්, (5) වන ඡේදය මගින් බලපත්‍රලාභියකුට පවරා දී ඇති බලතල බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් ක්‍රියාත්මක නොකළ යුතු ය.

(8) මේ අයිතමයෙහි යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතයක ධරකයක් සැපයීමක් සම්බන්ධයෙන් කර ඇති සඳහනකට, එවැන්නක් අලුතින් සවි කිරීමෙන් හෝ දැනට තිබෙන්නක් විකරණයෙන් එවැනි මාර්ගයක් හෝ ධරකයක් සැපයීම පිළිබඳ සඳහනක් ඇතුළත් විය යුතු ය.

**2.** (1) අයක්‍රම පාරිභෝගිකයකුගේ යම් පැහැර හැරීමක ප්‍රතිඵලක් වශයෙන් යම් පරිශ්‍රයක විදුලිය සැපයුම බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් කපා හරිනු ලැබූ අවස්ථාවක,

(2) වන ඡේදයේ නියමයන් සම්පූර්ණ කරනු ලැබූ විට, වැඩ කරන දින දෙකක් ඇතුළත විදුලිය සැපයුම නැවත යථා තත්ත්වයට පත් කිරීම පිණිස වූ බැඳීමකට බලපත්‍රලාභියා යටත් වන්නේ ය.

(2) මේ ඡේදයේ නියමයන් නම්, පැහැර හරිනු ලැබූ පාරිභෝගිකයා විසින් -

(අ) පැහැර හැරීම යථා තත්ත්වයට පත් කිරීම;

(ආ) සැපයුම විසන්ධි කිරීමේ සහ යළි සම්බන්ධ කිරීමේ සාධාරණ වියදම් ගෙවීම; සහ

(ඇ) මේ පනතේ 27 වන වගන්තියේ සඳහන් කර ඇති පරිදි ඇප සපයා දීම,

වේ.

(3) (1) වන ඡේදයෙන් බෙදාහැරීමේ බලපත්‍රලාභියකු වෙත පනවන ලද බැඳීම, ඒ බැඳීම අනුව කටයුතු කිරීම පැහැර හැරීමෙන් බලපෑමක් ඇති විය හැකි යම් තැනැත්තකු කෙරෙහි බෙදා හැරීමේ බලපත්‍රලාභියාගෙන් ඉටු විය යුතු යුතුකමක් විය යුත්තේ ය.

(4) (3) වන ඡේදය ප්‍රකාරව, යම් තැනැත්තකුට බලපත්‍රලාභියා විසින් ඉටු කළ යුතුව ඇති කාර්ය කඩ කරනු ලැබ ඇති අවස්ථාවක සහ එසේ කඩ කිරීමෙන් ඒ තැනැත්තාට පාඩු සහ අලාභහානි සිදු වන අවස්ථාවක, එය සිවිල් නඩුවක දී හෝ ඒ තැනැත්තාගේ ඉල්ලීම මත හෝ නඩු පැවරිය හැක්කේ ය.

(5) (4) වන ඡේදය ප්‍රකාරව බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට එරෙහිව ගෙනෙන ලද යම් නඩු කටයුත්තක දී, (1) වන ඡේදයෙන් බලපත්‍රලාභියා මත පැනවී ඇති බැඳීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වීම මඟහැරවීම පිණිස තමා විසින් සියලු සාධාරණ පියවර ගන්නා ලද බවත්, සියලු නිසි උද්‍යෝගය ඇතිව ක්‍රියා කළ බවත් ඔප්පු කිරීම බෙදා හැරීමේ බලපත්‍රලාභියා වෙනුවෙන් විත්තිවාචකයක් විය යුතු ය.

(6) (1) වන ඡේදයෙන් බලපත්‍රලාභියකු මත පැනවී ඇති බැඳීමක් අනුව කටයුතු කිරීම පැහැර හැරීමක් සම්බන්ධයෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට විරුද්ධව සිවිල් නඩු කටයුතු ගෙන ඒමට (4) වන ඡේදයේ බලය ප්‍රකාරව යම් තැනැත්තකුට ඇති යම් අයිතියකට අගතියක් නොවන පරිදි, ඒ බැඳීම අනුව කටයුතු කිරීමට සැලැස්වීම, සිවිල් අධිකරණ බලය ඇති අධිකරණයක උචිත නඩු කටයුතු පැවරීම මගින් නියාමක විසින් බලාත්මක කරනු ලැබිය හැක්කේ ය.

**3.** (1) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින්, යම් පරිශ්‍රයක විදුලිබල සැපයුම කපා හරිනු ලැබූ අවස්ථාවක, ඒ බලපත්‍රලාභියා හැරෙන්නට වෙනත් කිසිදු තැනැත්තකු විසින් එහි විදුලිබලය සැපයීම නැවත ලබා නොදිය යුතු ය.

(2) යම් තැනැත්තකු (1) වන ඡේදය උල්ලංඝනය කරමින් ක්‍රියා කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විදුලිබලය සැපයීම කපා හරිනු ලැබිය යුතුය.

**4.** (1) චේතනාන්විතව හෝ නොසැලකිලිමත්කම නිසා හෝ යම් තැනැත්තකු විසින් -

(ඇ) (i) බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට;

(ii) උත්පාදන බලපත්‍රලාභියකුට; හෝ

(iii) ප්‍රේෂණ බලපත්‍රලාභියකුට,

අයිති හෝ ඔවුන් විසින් ක්‍රියාත්මක කරන යම් විදුලි පිරියතයකට හෝ විදුලි මාර්ගයකට; හෝ

(ආ) බෙදාහැරීමේ බලපත්‍රලාභියකුගේ දේපළ මත පිහිටි ඒ බලපත්‍රලාභියාට අයිති හෝ ඔහු හෝ ඇය විසින් ක්‍රියාත්මක කරන යම් ගෘහ විදුලිය සම්පාදන උපකරණයකට හෝ ඉන් කොටසකට,

අලාභහානි කරන්නේ නම් හෝ අලාභහානි කිරීමට සලස්වන්නේ නම්, එකී තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) මේ ඡේදයේ "ගෘහ විදුලිබල සැපයීම් උපකරණ" යන්නට, පාරිභෝගිකයකුගේ දේපළ තුළ පිහිටි මීටරය තෙක් හා දක්වා සහ මීටරය ද ඇතුළුව සියලු විදුලි මාර්ග සහ පිරියත ඇතුළත් වේ.

(3) බෙදාහැරීමේ බලපත්‍රලාභියකුගේ, විදුලි මාර්ගය හෝ විදුලි පිරියතය සම්බන්ධයෙන් (1) වන ඡේදයේ (අ) වන අනුඡේදය යටතේ වරදක් සිදු කර ඇති අවස්ථාවක, එකී කාරණයට පිළියමක් යොදන තෙක් එකී තැනැත්තාගේ විදුලි සැපයුම බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් විසන්ධි කරනු ලැබිය හැක්කේ ය.

(4) යම් ගෘහ විදුලි සැපයීම් උපකරණයක් සම්බන්ධයෙන් (1) වන ඡේදයේ (ආ) අනුඡේදය යටතේ වරදක් සිදු කර ඇති අවස්ථාවක, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් -

(අ) අදාළ කාරණය සම්බන්ධ පිළියම් යොදනු ලබන තෙක් එලෙස වරද කරන තැනැත්තාගේ විදුලිය සැපයුම විසන්ධි කරනු ලැබිය හැක්කේ ය;

(ආ) වරද සිදු කරනු ලබුවේ යම් මීටරයක් සම්බන්ධවද එම මීටරය ගලවා ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන ඡේදය යටතේ වූ බලතල ක්‍රියාත්මක කරමින් බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් මීටරයක් ගලවා ඉවත් කරනු ලැබූ අවස්ථාවක, නියාමක විසින් එය විනාශ කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට බලය දෙන තුරු බලපත්‍රලාභියා විසින් එය ආරක්ෂා සහිතව තබා ගත යුතු ය.

**5.** (1) 8 වන අයිතමයේ විධිවිධානවලට යටත්ව, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් බලය දෙන ලද යම් නිලධරයකු, පහත දැක්වෙන කාර්යවලින් කවරක් හෝ සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභියාට අයිති හෝ එය විසින් ක්‍රියාත්මක කරනු ලබන විදුලි මාර්ග හා විදුලි පිරියතය හරහා බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් විදුලි සැපයුම ලබා දෙන ඕනෑම පරිශ්‍රයකට ඇතුළු විය හැකිය:-

(අ) බෙදා හැරීමේ බලපත්‍රලාභියාට අයත් හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් ක්‍රියාත්මක කරන යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතයක් පරීක්ෂා කිරීම;

(ආ) යම් විදුලි මීටරයක සටහන් වී ඇති සංඛ්‍යාවන් සහතික ලෙස දැනගැනීම සහ ගාස්තු කලින් ගෙවීමේ මීටරයක් පිළිබඳ කරුණක් වන විට හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියාට අයිති හෝ එය විසින් ක්‍රියාත්මක කරන යම් මුදලක් හෝ ටෝකන ඉවත් කරගෙන යාම;

(ඇ) යම් විදුලි මීටරයක් ඉවත් කර ගැනීම, පරීක්ෂා කර බැලීම හෝ නැවත සවි කිරීම හෝ යම් ආදේශිත මීටරයක් හෝ ආශ්‍රිත උපකරණයක් නැවත සවි කිරීම.

(2) (1) වන ඡේදයේ (අ) සහ (ආ) අනුඡේදවලින් පවරා දුන් බලතල-

(අ) බලපත්‍රලාභියා විසින් පරිශ්‍රයට විදුලි සැපයුම නතර කරන ලෙස පාරිභෝගිකයා විසින් ලිඛිතව බෙදා හැරීමේ බලපත්‍රලාභියාගෙන් ඉල්ලා ඇති; සහ

(ආ) සාධාරණ කාලයක් තුළ දී එසේ කිරීමට බලපත්‍රලාභියාට නොහැකි වී ඇති,

පරිශ්‍රයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොකළ යුතු ය.

**6.** (1) මේ උපලේඛනයේ 4 වන අයිතමයේ (3) වන හෝ (4) වන ඡේදවලින් බෙදා හැරීමේ බලපත්‍රලාභියාට-

(අ) යම් පරිශ්‍රයකට දී ඇති විදුලි සැපයුම විසන්ධි කිරීම පිණිස; හෝ

(ආ) ඒ ඡේදය යටතේ වරද සිදු කිරීමට යෙදුණු විදුලි මීටරය ඉවත් කිරීම පිණිස,

බලය දී ඇති අවස්ථාවක, 8 වන අයිතමයට යටත්ව, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් බලය දී ඇති යම් නිලධරයකු විසින්, විදුලි සැපයුම විසන්ධි කිරීමේ කාර්ය සඳහා හෝ විදුලිය බෙදා හැරීම හෝ සැපයීම හා සම්බන්ධ කාර්ය සඳහා භාවිත කරන ලද මීටරය හෝ යම් ආශ්‍රිත විදුලි පිරියතයක් ඉවත් කර ගැනීමේ කාර්ය සඳහා හෝ පරිශ්‍රයට ඇතුළු විය හැකි ය.

(2) (අ) යම් පරිශ්‍රයක විදුලිය සැපයුම කපා හැරීම හෝ විසන්ධි කිරීම පිණිස මේ පනතේ වෙනත් යම් විධිවිධානවලින් හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලින් බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට බලය දී ඇති අවස්ථාවක;

(ආ) බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් විදුලිය සපයනු ලැබූ යම් පරිශ්‍රයක පදිංචිව සිටින තැනැත්තාට එවැනි විදුලි සැපයුමක් අවශ්‍ය වීම අවසන් වූ අවස්ථාවක;

(ඇ) බෙදාහැරීමේ බලපත්‍රලාභියකු විසින් කලින් විදුලිය සැපයුමක් දී තිබුණු යම් පරිශ්‍රයක පදිංචියට පැමිණෙන තැනැත්තකුට එවැනි සැපයුමක් අවශ්‍ය නොවන අවස්ථාවක;

(ඇ) බෙදාහැරීමේ බලපත්‍රලාභියකුට අයත් හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් ක්‍රියාත්මක කරන ලද මීටරයක් හරහා කලින් සිදු කළ විදුලිය සැපයුමක් ඇති යම් පරිශ්‍රයක පදිංචියට පැමිණෙන තැනැත්තාට ඒ මීටරය කුලියට ගැනීමට හෝ ණයට ගැනීමට අවශ්‍ය නොවූ අවස්ථාවක,

බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් බලය දුන් යම් නිලධරයකු විසින් 8 වන අයිතමයට යටත්ව, සැපයුම විසන්ධි කිරීමේ හෝ යම් විදුලි පිරියතයක්, විදුලි මාර්ගයක් හෝ විදුලි මීටරයක් ඉවත් කිරීමේ කාර්ය සඳහා පරිශ්‍රයට ඇතුළු විය හැකිය.

**7.** (1) අවස්ථාවෝචිත පරිදි, බෙදාහැරීමේ බලපත්‍රලාභියකු විසින්, උත්පාදන බලපත්‍රලාභියකු විසින් හෝ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියකු විසින් බලය දී ඇති යම් නිලධරයකු, 8 වන අයිතමයට යටත්ව-

(අ) දැනටමත් නීත්‍යානුකූල ලෙස සවි කොට පවතින විදුලි මාර්ගය හෝ පිරියතයක් වෙනුවට හෝ ඊට අමතරව අලුත් විදුලි මාර්ගයක් හෝ අලුත් විදුලි පිරියතයක් ස්ථානගත කිරීමේ; හෝ

(ආ) දැනට පවත්නා යම් විදුලි මාර්ගයක් හෝ පිරියතයක් අලුත්වැඩියා කිරීමේ හෝ වෙනස් කිරීමේ,

කාර්ය සඳහා යම් පරිශ්‍රයකට ඇතුළු විය හැකි ය.

(2) යම් විදුලි මාර්ගයක හෝ විදුලි පිරියතයක වරදක් හේතුවෙන් පැන නඟින හදිසි අවස්ථාවන් පිළිබඳ කරුණක දී 8 වන අයිතමයෙන් දිය යුතු බවට නියම කර ඇති දැන්වීම නොකර (1) වන ඡේදය යටතේ යම් පරිශ්‍රයකට ඇතුළු විය හැකි නමුත් ඒ දැන්වීම හැකි තරම් ඉක්මනින් එවිට, දෙනු ලැබිය යුතු ය.

**8.** (1) මේ පනත යටතේ යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළු වීමට බලය දී ඇති විදුලි පරීක්ෂකයකු හෝ බලපත්‍රලාභියකු (හෝ බලපත්‍රලාභියාගේ නිලධරයකු) විසින්, පහත දැක්වෙන අවස්ථාවල දී මිස, එසේ කිරීමට අයිතියක් ලෙස ඉල්ලා නොසිටිය යුතු ය:-

(අ) කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාවල ස්වභාවය සහ ප්‍රමාණය හැකි තාක් දුරට සම්පූර්ණයෙන් සහ නිවැරදි ලෙස සඳහන් කරමින් විදුලි පරීක්ෂකවරයා විසින් හෝ බලපත්‍රලාභියා විසින් හෝ බලපත්‍රලාභියාගේ නිලධරයකු විසින් අදහස් කර ඇති ඇතුළු වීම සම්බන්ධයෙන් දින තුනක දැන්වීමක් කර තිබීම;

(ආ) එසේ කිරීමට නියම කර ඇත්නම්, එකී විදුලි පරීක්ෂකවරයා හෝ බලපත්‍රලාභියා විසින් ස්වකීය බලතල පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කර තිබීම;

(ඇ) ඇතුළු වීම ප්‍රකාරව සිදු විය හැකි යම් අවහිර වීමක්, අබලතාවක් හෝ අලාභහානියක් සඳහා ඉඩමේ හෝ පරිශ්‍රයේ අයිතිකරුට සාධාරණ වන්දියක් ගෙවීම.

(2) (1) වන ඡේදයේ (අ) වන අනුඡේදයේ සඳහන් කරන ලද යම් දැන්වීමක් -

(අ) ඉඩමෙහි පදිංචි වී සිටින අවස්ථාවක පදිංචිකරුට දිය යුතු ය;

(ආ) ඉඩමෙහි පදිංචි වී නැති අවස්ථාවක, ඉඩමේ අයිතිකරුගේ නම සහ ලිපිනය දන්නේ නම් හෝ සාධාරණ උනන්දුවකින් සහතික ලෙස දැනගැනීමට හැකි නම් ඉඩමේ අයිතිකරුට දිය යුතු ය;

(ඇ) ඉඩමෙහි පදිංචි වී නැති විට සහ සාධාරණ උනන්දුවකින් අයිතිකරුගේ නම සහ ලිපිනය දැනගත නොහැකි අවස්ථාවක, ඉඩමේ හොඳින් පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය; සහ

(ඈ) ඉඩම යම් පොදු කටයුත්තක් සඳහා භාවිත කරන අවස්ථාවක හෝ ඒ සඳහා වෙන් කර ඇති අවස්ථාවක, ඒ කාර්යය ක්‍රියාත්මක කිරීම භාරව සිටින නිලධරයාට හෝ වෙනත් තැනැත්තාට දිය යුතු ය.

(3) විදුලි පරීක්ෂකවරයාට හෝ බලපත්‍රලාභියාට හෝ තත්කාර්යය සඳහා බලපත්‍රලාභියා විසින් ලියවිල්ලකින් බලය දී ඇති තැනැත්තාට, (1) වන ඡේදයේ (අ) අනුඡේදයේ සඳහන් කරන ලද දැන්වීම දීමේ කාර්යය සඳහා ඉඩමට ඇතුළු වීමට හිමිකම් තිබිය යුතු ය.

(4) මේ අයිතමයෙන් පැවරී ඇති කිසියම් බලතල යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරන අවස්ථාවක, ඔහුට හෝ ඇයට ලිඛිතව බලය දෙනු ලැබූ බලපත්‍රලාභියා විසින්, එලෙස ඉඩමට ඇතුළු වීමේ ප්‍රතිඵලයක් ලෙස කර ඇති යම් හානියක් යථා තත්ත්වයට පත් කළ යුතු ය.

(5) මේ පනතින් හෝ ඒ යටතේ පැවරී ඇති කිසියම් බලතල ක්‍රියාත්මක කිරීමේ දී යම් ඉඩමකට හෝ යම් චංචල දේපළකට යම් හානියක් සිදු වූ අවස්ථාවක, ඉඩම කෙරෙහි හෝ චංචල දේපළ කෙරෙහි යම් සම්බන්ධතාවක් දක්වන යම් තැනැත්තකු විසින්, ඒ බලතල ක්‍රියාත්මක කරන ලද්දේ කවර බලපත්‍රලාභියකු වෙනුවෙන් ද ඒ බලපත්‍රලාභියාගෙන් ඒ හානිය සම්බන්ධයෙන් වන්දි අයකර ගනු ලැබිය හැකි ය; තව ද, එවැනි බලයක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් ඉඩමක හෝ චංචල දේපළක ස්වකීය භුක්ති විඳීම කෙරෙහි යම් අවහිරයක් හෝ බාධාවක් සිදු වූ අවස්ථාවක, ඒ අවහිර වීම හෝ බාධාව වෙනුවෙන් නියාමක විසින් තීරණය කරනු ලබන පරිදි වූ සාධාරණ වන්දියක් එකී තැනැත්තා විසින් ඒ බලපත්‍රලාභියාගෙන් අයකර ගනු ලැබිය හැකි ය.

**9.** (1) මේ උපලේඛනය මගින් පවරා දෙන ලද ඇතුළු වීමේ බලතලවලින් කිසිවක් ක්‍රියාත්මක කිරීමට ගන්නා වෑයමක දී, බෙදා හැරීම් බලපත්‍රලාභියා විසින් පරිශ්‍රයට ඇතුළු වීම සඳහා බලය පාවිච්චි කිරීමෙන් හැර, අන්‍යාකාරයෙන් සියලු සාධාරණ උත්සාහ ගෙන තිබේ නම් සහ ඒ සියලු උත්සාහ අසාර්ථක වූයේ නම් බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්, පරිශ්‍රය පිහිටි ස්ථානය අරබයා නිසි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත, එකී පරිශ්‍රයට බලෙන් ඇතුළු වීම පිණිස බලපත්‍රලාභියාට හෝ බලපත්‍රලාභියා විසින් බලය දෙන ලද නිලධරයකුට බලය දෙන්නා වූ ආඥාවක් ලබා ගැනීම පිණිස ඒකපාක්ෂික ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන ඡේදය යටතේ දෙන ලද ආඥාවක, බලපත්‍රලාභියා විසින් හෝ බලපත්‍රලාභියා විසින් බලය දෙන ලද නිලධරයා විසින් බලෙන් ඇතුළු වීම ක්‍රියාත්මක කිරීමට ගත යුතු ක්‍රියාමාර්ගය, නිශ්චිතව සඳහන් විය යුතු අතර, එසේ ඇතුළු වීමෙන් පසු බලපත්‍රලාභියා හෝ ඒ නිලධරයා විසින් පිළිපැදිය යුතු කොන්දේසි නියම කරනු ලැබිය හැකි ය.

(3) බලපත්‍රලාභියා හෝ බලපත්‍රලාභියා විසින් බලය දෙන ලද නිලධරයකු විසින්, බලෙන් ඇතුළු වීම සම්බන්ධයෙන් කවර හෝ තැනැත්තකුට වගකීමක් නොදැරිය යුත්තේ යඃ

එසේ වුව ද, එකී බලපත්‍රලාභියා හෝ බලපත්‍රලාභියා විසින් බලය දෙන ලද නිලධරයා විසින්-

(අ) ආඥාවේ නිශ්චිතව සඳහන් ක්‍රියාමාර්ගය හැර, ඇතුළු වීම ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය;

(ආ) ආඥාවෙන් නියම කරනු ලැබ ඇති යම් කොන්දේසියක් අනුගමනය කළ යුතු ය; සහ

(ඇ) නිශ්චිත ක්‍රියාමාර්ගය ගැනීමේ දී සහ නියම කර ඇති යම් කොන්දේසියක් නිරීක්ෂණය කිරීමේ දී සාධාරණ ලෙස ප්‍රායෝගික අවම ප්‍රමාණයේ හානියක් පමණක් කළ යුතු ය.

(4) (අ) (1) වන ඡේදය යටතේ වූ ආඥාවක් කිරීමට හෝ නොකිරීමට; හෝ

(ආ) එවැනි ආඥාවක නියම කරනු ලැබ ඇති නියමයන් හා කොන්දේසි පිළිබඳව,

මහෙස්ත්‍රාත් අධිකරණයේ තීරණයකට එරෙහිව අභියාචනයක් නොතිබිය යුත්තේ ය.

(5) (1) වන ඡේදය යටතේ වූ ආඥාවක් ලබා ගැනීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී බලපත්‍රලාභියකු විසින් දරන ලද යම් වියදමක්, ආඥාව අදාළ වන පරිශ්‍රයේ අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් සිවිල් ණයක් ලෙස අයකර ගනු ලැබිය යුතු ය.

**10.** (1) මේ උපලේඛනයෙන් පැවරුණු ඇතුළු වීම පිළිබඳ කිසියම් බලතල ප්‍රකාරව බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් බලය දුන් නිලධරයකු විසින් යම් පරිශ්‍රයකට ඇතුළු වීමක් සිදු කළ අවස්ථාවක -

(අ) ඇතුළු වීම හේතුවෙන් පරිශ්‍රය වඩා අඩු ආරක්ෂාවෙන් යුතුව නොතබන බව නිලධරයා විසින් සහතික කළ යුතු ය; සහ

(ආ) පරිශ්‍රයට ඇතුළු වීමේ දී හෝ මේ උපලේඛනයෙන් බලය දී ඇති යම් ක්‍රියා මාර්ගයක් ගැනීමේ දී හෝ පරිශ්‍රය සුරක්ෂිත කිරීමේ දී නිලධරයා විසින් හෝ ඔහු හෝ ඇය කැටුව යන වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් අලාභහානියක් බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් යථා තත්වයට පත් කළ යුතු ය; නැතහොත් වන්දි ගෙවිය යුතු ය.

(2) මේ උපවගන්තියෙන් පවරා දෙන ලද ඇතුළු වීමේ බලතල ක්‍රියාත්මක කරන ලද නිලධරයකු විසින්, ඇතුළු වීම කරනු ලබන්නේ කවර කාර්යයක් සඳහා ද ඒ කාර්යය සඳහා හෝ (1) වන ඡේදයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි හෝ යෝග්‍ය තැනැත්තන් කැටුව යා හැකි ය.

(3) මේ උපලේඛනය මගින් පවරා දී ඇති ඇතුළු වීමේ බලතල ක්‍රියාත්මක කරන යම් නිලධරයකුට යම් තැනැත්තකු හිතාමතාම විරුද්ධ වන්නේ නම් හෝ අවහිර කරන්නේ නම්, එකී තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුත්තේ ය.

**11.** බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට අයත් හෝ ඒ බලපත්‍රලාභියා විසින් පාරිභෝගිකයකුට කුලියට දී ඇති හෝ ණයට දී ඇත්තා වූ ද එහි අයිතිකරු බෙදා හැරීමේ බලපත්‍රලාභියා බව නිරූපණය කරමින් එහි ප්‍රමාණවත් සලකුණක් හෝ ලකුණක් ලකුණු කර හෝ ඔබ්බවා හෝ ඇත්තා වූ ද යම් විදුලි පිරියතයක්, විදුලි මාර්ගයක් හෝ විදුලි මීටරයක්-

(අ) ඒවා පිහිටුවනු ලැබ ඇති පරිශ්‍රයේ යම් කොටසකට සවි කර හෝ තදින් යා කර තිබුණේ වී වුව ද, ඉඩම් හිමියාගේ සවි කිරීම් ලෙස නොසැලකිය යුතු ය; සහ

(ආ) ඒවා තිබෙන්නේ කවර තැනැත්තකුගේ සන්තකයේ ද ඒ තැනැත්තාට එරෙහිව වූ යම් අධිකරණ ක්‍රියාවලියක් යටතේ හෝ බංකොලොත් බව ප්‍රකාශ කිරීමේ යම් නීති කෘත්‍යයක් යටතේ තහනමට ගැනීමට හෝ ඇස්කීසි කරනු ලැබීමට යටත් නොවිය යුතු ය.

**IV** වන උපලේඛනය

[21(7)(ඉ) වන වගන්තිය]

**විදුලි මීටර භාවිතය**

**1.** (1) බෙදාහැරීමේ බලපත්‍රලාභියකු විසින් සපයනු ලබන විදුලිබලය පරිභෝජනය කරන පාරිභෝගිකයකුගේ විදුලිය, සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් සපයන ලද විදුලිය ප්‍රමාණය සම්බන්ධයෙන් අයකරනු ලැබීමට ඇති අවස්ථාවක, පාරිභෝගිකයා සහ බෙදා හැරීමේ බලපත්‍රලාභියා අතර අන්‍යාකාරයෙන් එකඟ වී ඇත්තේ නම් මිස, අවස්ථාවෝචිත පරිදි, උචිත මීටරයක් හෝ මීටර් හරහා දිය යුතු අතර, විදුලිබල ප්‍රමාණය එමගින් ස්ථිරව දැනගත යුතු ය.

(2) මීටරය-

(අ) බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් සපයා දිය යුතු ය; හෝ

(ආ) නිදහස් සැපයුමකට සම්බන්ධිතව භාවිත කරන හෝ භාවිත කිරීමට අදහස් කර ඇති මීටරයක් පිළිබඳ කාරණයක දී පාර්ශ්වකරුවන් අතර එකඟ වී සිටින්නේ නම්, පාරිභෝගිකයා විසින් සපයා දිය යුතු ය.

(3) සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගැනීමේ දී මීටරය පරිශ්‍රයෙන් පිටත හෝ වෙනත් ඇතැම් ස්ථානයක ස්ථානගත කිරීම වඩා සාධාරණ නම් මිස, මීටරය පාරිභෝගිකයාගේ පරිශ්‍රයෙහි බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් තීරණය කරනු ලබන ස්ථානයක සවි කරනු ලැබිය යුතු ය. මේ පනතේ කාර්ය සඳහා බලපත්‍රලාභියකු විසින් පාරිභෝගිකයකු වෙත විදුලිබලය සැපයීමේ කාර්ය, පාර්ශ්වකරුවන් අතර අන්‍යාකාරයකින් එකඟ වී ඇත්නම් මිස, විදුලිබලය සැපයීම මැනීම සඳහා භාවිත කරන මානන උපකරණයෙන් හෝ මානන උපකරණයෙන් පිට වී යන කම්බි කෙළවර, ආරම්භ වන්නා වූ ලෙස සැලකිය යුතු ය.

(4.) (අ) මේ උපලේඛනයේ විධිවිධාන අනුව හෝ මේ පනත යටතේ සාදන ලද කිසියම් නියෝගවල විධිවිධාන අනුව කටයුතු කිරීම සහතික කිරීම පිණිස මීටරයක් ප්‍රතියෝජනය කිරීම අවශ්‍ය වන අවස්ථාවක; හෝ

(ආ) වෙනත් සියලු අවස්ථානුගත කරුණුවලට අනුව අන්‍යාකාරයෙන් සාධාරණ අවස්ථාවක,

(2) වන හා (3) වන ඡේදවලට අනුකූලව සපයන ලද සහ සවි කරන ලද යම් මීටරයක් ප්‍රතියෝජන කරන ලෙස බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් නියම කරනු ලැබිය හැකි ය. තව ද, එසේ ප්‍රතියෝජනය කරන ලද යම් මීටරයක්, එම ඡේදවලට අනුකූලව සපයා සවි කරනු ලැබිය යුතු ය.

(5) (2) වන හා (3) වන ඡේදවලට අනුකූලව සපයා සවි කරන ලද උචිත මීටරයක් හරහා ස්වකීය විදුලි සැපයුම ලබා ගැනීමට පාරිභෝගිකයා ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ පැහැර හරින්නේ නම්, සැපයුම්කරු විසින් සැපයුම දීම ප්‍රතික්ෂේප කිරීම හෝ සැපයුම විසන්ධි කිරීම කළ හැකි ය.

(6) මේ ඡේදයේ කාර්ය සඳහා මීටරයක්, සැපයුම සම්බන්ධයෙන් අයකිරීම කරනු ලැබිය යුත්තේ කවර නියමයන් මත ද ඒ නියමයන් කෙරෙහි සැලකිල්ල ඇතිව, එම ප්‍රයෝජනය සඳහා යෝග්‍ය ආකාරයක හෝ නිෂ්පාදනයක මීටරයක් වේ නම්, එය යම් සුවිශේෂ විදුලි සැපයුමක් සම්බන්ධයෙන් භාවිත කිරීම සඳහා උචිත මීටරයක් වේ.

(7) මේ ඡේදය යටතේ පැන නගින්නා වූ යම් ආරාවුලක් 23 වන වගන්තිය යටතේ තීරණය කරනු ලැබීමේ අපේක්ෂාවෙන්, නියාමක විසින්, මීටරයක් සැපයීමට හෝ සවි කිරීමට අදාළ විධාන දෙනු ලැබිය හැකි අතර, මේ ඡේදය යටතේ වූ විධාන යම් සුවිශේෂී විස්තරයක මීටර් පිළිබඳ කාරණාවල දී හෝ සුවිශේෂී කාරණාවල දී යන දෙකෙන් කවරක් සඳහා හෝ අදාළ විය හැකි ය.

(8) මේ උපලේඛනයෙහි "නිදහස් සැපයුම" යන්නෙන්-

(අ) පරිශ්‍රය, ගෘහ කාර්ය සඳහා සම්පූර්ණ ලෙස හෝ ප්‍රධාන ලෙස භාවිත කරන පරිශ්‍රයක් නොවන අවස්ථාවක; හෝ

(ආ) සැපයුම්කරු හෝ පාරිභෝගිකයා එම ස්ථානවලට විදුලිය සැපයීම පිණිස වූ නිදහස් කිරීමකින් බලය දෙනු ලැබ ඇති තැනැත්තකු වන අවස්ථාවක,

යම් පරිශ්‍රයකට විදුලිබලය සැපයීම අදහස් වේ.

**2.** (1) බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් පාරිභෝගිකයකුට සපයනු ලබන විදුලිබල ප්‍රමාණය සහතික ලෙස දැනගැනීම සඳහා-

(අ) මීටරය අනුමත ආකාරයක හෝ නිෂ්පාදනයක සහ අනුමත කරන ලද ආකාරයකින් සවි කර ඇත්තේ නම් මිස; සහ

(ආ) (2) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, 4 වන අයිතමය යටතේ සහතික කර ඇත්තේ නම් මිස,

කිසිදු මීටරයක් භාවිත කරනු නොලැබිය යුතු ය. තව ද මෙම උපලේඛනයේ " අනුමත කරන ලද" යන්නෙන්, මෙම පනත යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව නියාමක විසින් අනුමත කිරීම අදහස් වේ.

(2) බෙදාහැරීමේ බලපත්‍රලාභියා සහ පාරිභෝගිකයා (1) වන ඡේදයේ (ආ) අනුඡේදයේ නියමයන් අතහැර දැමීමට ලිඛිතව එකඟ වී ඇත්තේ නම්, ඒ අනුඡේදයේ විධිවිධාන නිදහස් සැපයුමක් සම්බන්ධිතව භාවිත කරනු ලබන මීටරයකට අදාළ නොවිය යුතු ය.

(3) (අ) නියෝග මගින් හෝ නියෝග යටතේ දෙනු ලබන අනුමත කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම සඳහා;

(ආ) යම් සුවිශේෂ ආකාරයක හෝ නිෂ්පාදනයක මීටරයක් සඳහා එසේ දෙන ලද අනුමතයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා සහ සවි කරනු ලැබ ඇති ඒ ආකාරයේ හෝ නිෂ්පාදනයේ මීටර් වෙනුවට, වෙනත් අනුමත ආකාරයක හෝ නිෂ්පාදනයක මීටර් නියමිත කාලසීමාවක් තුළ දී ප්‍රතියෝජනය කිරීම සඳහා;

(ඇ) යම් සුවිශේෂ ආකාරයක සවි කිරීමට එලෙස දෙන ලද අනුමතයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා සහ ඒ ආකාරයෙන් නම් කරන ලද මීටර්, නියෝගවල නිශ්චිතව සඳහන් කාලසීමාවක් තුළ දී අනුමත කළ වෙනත් ආකාරයකින් සවි කිරීම නියම කරමින්,

නියෝගවල විධිවිධාන සලස්වනු ලැබිය හැකි අතර, වෙනස් විස්තරවල මීටර් සඳහා හෝ වෙනස් කාර්යයක් සඳහා භාවිත කරන හෝ භාවිත කිරීමට අදහස් කරන මීටර් සඳහා වෙනස් වෙනස් විධිවිධාන සාදනු ලැබිය හැකි ය.

**3.** (1) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින්, සපයන ලද විදුලිබල ප්‍රමාණය සහතික ලෙස දැනගැනීම සඳහා භාවිත කෙරෙන මීටරයක් හරහා විදුලිය සපයන අවස්ථාවක සහ-

(අ) මීටරය අනුමත කළ ආකාරයක හෝ නිෂ්පාදනයක මීටරයක් නොවන විට හෝ එය අනුමත කළ ආකාරයකින් සවි කරනු ලැබ නැති විට; හෝ

(ආ) 1 වන අයිතමයේ (2) වන ඡේදයේ (ආ) අනුඡේදයේ සඳහන් මීටරයක් පිළිබඳ කාරණයක දී හැර, එය 4 වන අයිතමය යටතේ සහතික කර නොමැති විට,

බෙදා හැරීමේ බලපත්‍රලාභියා මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු, වෙනත් යම් තැනැත්තකුගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් හේතුවෙන් මේ අයිතමය යටතේ වරදක් සිදු කරන අවස්ථාවක, ඒ වෙනත් තැනැත්තා ද වරදක් සිදු කරන අතර පළමුවෙන් සඳහන් කළ තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පවරා ඇත්තේ වුව ද නොවුව ද මේ ඡේදය ප්‍රකාරව ඒ වෙනත් තැනැත්තාට විරුද්ධව නඩු පවරා වරදට වරදකරු කරනු ලැබිය හැකි ය

(3) මේ අයිතමය යටතේ වරදක් සම්බන්ධයෙන් වූ යම් නඩු කටයුත්තක දී, වරද සිදු කිරීම මගහැරීම සඳහා එම තැනැත්තා විසින් සියලු සාධාරණ පියවර ගත් බව සහ සියලු නිසි උද්‍යෝගයකින් ක්‍රියා කළ බව ඔප්පු කිරීම චෝදනාවට ලක් වූ තැනැත්තා සඳහා විත්තිවාචකයක් විය යුත්තේ ය.

(4) මේ ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නියාමක විසින් හෝ නියාමක වෙනුවෙන් හැර, කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

**4.** (1) මීටර්වල හරි වැරදි බලා සහතික කිරීම පිණිස නියාමක විසින් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(2)(අ) යම් මීටරයක් අනුමත කළ ආකාරයේ හෝ නිෂ්පාදනයේ නම් මිස; සහ

(ආ) නියෝගවලින් නියම කරනු ලබන පරිදි, මීටරය (ආන්තරික වැරදිවලට යොමුව සාදන ලද ප්‍රමිති ද ඇතුළුව) ඒ ප්‍රමිතිවලට අනුකූල නම් මිස,

කිසිදු මීටරයක් (1) වන ඡේදයට අනුකූලව සහතික කරනු නොලැබිය යුතු අතර මේ උපලේඛනයේ නියම කරන ලද ආන්තරික වැරදිවලට කරන යොමු කිරීම් යන්න ඒ අනුව තේරුම් ගත යුතු ය.

(3) වෙනස් විස්තරවල මීටර් සඳහා වෙනස් විධිවිධාන සලස්වාලමින් සහ වෙනස් කාර්ය සඳහා භාවිත කරන හෝ භාවිත කිරීමට අදහස් කරන මීටර් සඳහා විධිවිධාන සලස්වාලමින් නියෝග සාදනු ලැබිය හැකි අතර, පහත දැක්වෙන විධිවිධාන ද ඊට ඇතුළත් විය හැකි යː-

(අ) නියමිත ප්‍රමිතිවලට තවදුරටත් අනුකූල නොවන මීටර් සම්බන්ධයෙන් සහතික කිරීම අවසන් කිරීම සඳහා; සහ

(ආ) මීටර් පරීක්ෂා කිරීම, හරි වැරදි බැලීම සහ සහතික කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම සඳහා සහ ඒවා ගෙවිය යුත්තේ කවර තැනැත්තන් විසින් ද යන වගට; සහ

(ඇ) මීටර් පරීක්ෂා කිරීමේ දී, හරි වැරදි බැලීමේ දී සහ සහතික කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය පිළිබඳව.

**5.** (1) බෙදාහැරීමේ බලපත්‍රලාභියකු විසින් සපයනු ලබන විදුලිබලය පරිභෝජනය කරන පාරිභෝගියකුගේ විදුලිය, සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන්, සපයන ලද විදුලි ප්‍රමාණය සම්බන්ධයෙන් අයකරනු ලැබීමට ඇති අවස්ථාවක, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් එහි සාමාන්‍ය ක්‍රියාවලිය තුළ දී පාරිභෝගිකයා විසින් පරිභෝජනය කර ඇති විදුලිබල ප්‍රමාණය තක්සේරු කොට, තක්සේරු කළ විදුලිබල පරිභෝජනයේ ප්‍රමාණය සාධාරණ කාලසීමාවක් තුළ දී මීටර් කියවීමක් මගින් තහවුරු කරන තාක් කල් ඒ අනුව ගාස්තු අයකර ගනු ලැබිය යුතු ය.

(2) (අ) (යම් පාරිභෝගිකයකුට සපයන ලද විදුලියේ ප්‍රමාණය ගණන් බලනු ලබන) මීටරයක පරිභෝජනය වැරදි ලෙස සටහන් වන බව ඔප්පු වන විටක දී; හෝ

(ආ) යම් මීටරයක් ක්‍රියා විරහිත වූ විටක දී; හෝ

(ඇ) යම් පරිශ්‍රයකට සපයනු ලබන විදුලියේ ප්‍රමාණය මැනීම සඳහා භාවිත කරන යම් මීටරයක සටහන් වන සංඛ්‍යා යම් තැනැත්තකු විසින් වෙනස් කරන විටක දී,

පරිභෝජනය තක්සේරු කර ඒ අනුව ගාස්තු අයකර ගැනීමට බෙදාහැරීමේ බලපත්‍රලාභියාට අයිතිය තිබිය යුතු ය.

(3) (1) වන හෝ (2) වන ඡේදවලට අනුකූලව බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් විදුලි පරිභෝජන තක්සේරු කර ඇති අවස්ථාවක, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් සකස් කරන ලද ඇස්තමේන්තුවට අනුකූලව පරිභෝජනය කරන ලද විදුලිය සඳහා හෝ ආරාවුල් විසඳීමට අදාළ විධිවිධානවලට අනුකූලව අන්‍යාකාරයෙන් තීරණය කරනු ලබන පරිදි පාරිභෝගිකයා විසින් ගෙවීම් කරනු ලැබිය යුතු ය.

**6.** (1) මේ අයිතමය යම් පරිශ්‍රයකට සපයන ලද විදුලියේ ප්‍රමාණය සහතික ලෙස දැනගැනීම සඳහා භාවිත කරන මීටර්වලට අදාළ වේ.

(2) මේ අයිතමය අදාළ වන මීටරයක සටහන් වීම, ඒ මීටරය හරහා සපයන ලද විදුලියේ ප්‍රමාණය පිළිබඳ සාක්ෂියක් ලෙස අධිකරණයේ කවර හෝ නඩු කටයුත්තක දී අවේශ්‍ය විය යුතු ය.

(3) අනුමත කළ ආකාරයක හෝ නිෂ්පාදනයක වූ ද අනුමත කරන ලද ආකාරයකින් සවි කරනු ලැබ ඇත්තා වූ ද මීටරයක් හරහා කිසියම් කාලසීමාවක් සඳහා විදුලිබලය සපයනු ලැබ ඇති අවස්ථාවක, මීටරයේ සටහන් වීම, ඒ කාලසීමාව තුළ දී -

(අ) නියමිත ආන්තික වැරදි ඇතුළත; සහ

(ආ) නිදහස් සැපයුමක් සම්බන්ධයෙන් වන විට, භාවිත කරන ලද මීටරයක් පිළිබඳ කාරණයක දී එකඟ වූ ආන්තික වැරදි ඇතුළත,

සටහන් වී ඇති ලෙස උපකල්පනය කළ යුතු ය.

(4) මේ ඡේදය අදාළ වන මීටරයක් මගින් යම් කාලසීමාවක් සඳහා -

(අ) නියමිත ආන්තික වැරදි ඇතුළත; සහ

(ආ) නිදහස් සැපයුමක් සම්බන්ධයෙන් වන විට, භාවිත කරන ලද මීටරයක් පිළිබඳ කාරණයක දී එකඟ වූ ආන්තික වැරදි ඇතුළත,

සටහන් වී ඇති ලෙස උපකල්පනය කරනු ලබන අවස්ථාවක, ඒ කාලසීමාව තුළ දී ඒ මීටරය හරහා සපයන ලද විදුලියේ ප්‍රමාණය මීටරයෙහි වැරදි ලෙස සටහන් වන බව ඔප්පු කිරීම පාරිභෝගිකයා මත පැවරෙන භාරයක් විය යුත්තේ ය.

**7.** (1) බෙදාහැරීමේ බලපත්‍රලාභියකු විසින් සපයන විදුලිබලය පරිභෝජනය කරන පාරිභෝගිකයකු විසින්, එකී පාරිභෝගියාට සපයනු ලබන විදුලිබලයේ ප්‍රමාණය නිවැරදි ලෙස සටහන් වීමට හැකි වනු පිණිස එකී පාරිභෝගිකයාට අයිති යම් මීටරයක් එකී පාරිභෝගිකයාගේ වියදමින් සියලු කල්හිම නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු ය. එකී පාරිභෝගිකයා විසින් එසේ කිරීම පැහැර හරිනු ලැබුවහොත්, සැපයුම්කරු විසින් ඒ මීටරය හරහා විදුලිබලය සැපයීම විසන්ධි කරනු ලැබිය හැකි ය.

(2) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් යම් පාරිභෝගිකයකුට බලපත්‍රලාභියාගේ වියදමින් සපයනු ලබන කුලියට හෝ ණයට දුන් යම් මීටරයක් විදුලිබලයේ ප්‍රමාණය නිවැරදි ලෙස සටහන් වීමට හැකි වනු පිණිස නිසි තත්ත්වයෙන් සියලු කල්හිම පවත්වාගෙන යා යුතු අතර, කලින් ගෙවන මීටර් සම්බන්ධයෙන් වන විට, අවශ්‍ය ගෙවීම් ලැබුණු විට නිසි ලෙස ක්‍රියාත්මක කළ යුතු ය.

(3) බලපත්‍රලාභියා විසින්, පාරිභෝගිකයකුට සපයන විදුලියේ ප්‍රමාණය සටහන් වන යම් මීටරයක් ඉවත් කිරීමට, පරීක්ෂා කිරීමට සහ නැවත සවි කිරීමට බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට බලය ඇත්තේ ය. එවැනි මීටරයක් ඉවත් කරනු ලැබූ විට, ඒ ස්ථානයෙහි ආදේශිත මීටරයක් සවි කරනු ලැබිය යුතු අතර, මීටරය ඉවත් කර ගැනීමේ, පරීක්ෂා කර බැලීමේ සහ ආදේශිත මීටරය සවි කිරීමේ පිරිවැය බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් දැරිය යුතු ය.

(4) (2) වන හා (3) වන ඡේදවල විධිවිධාන, මීටරය පිළිබඳ නිසි සැලකිල්ල දැක්වීම පැහැර හැරීම වෙනුවෙන් පාරිභෝගිකයකුට විරුද්ධව බෙදා හැරීමේ බලපත්‍රලාභියාට ඇති යම් ප්‍රතිකර්මයකට අගති විරහිතව විය යුතු ය.

**8.** (1) (1) යම් තැනැත්තකු චේතනාන්විතව හෝ නොසැලකිලිමත්ව -

(අ) බෙදාහැරීමේ බලපත්‍රලාභියකු විසින් යම් පරිශ්‍රයකට සපයනු ලබන විදුලිබල ප්‍රමාණය මැනීම සඳහා භාවිත කරන යම් මීටරයක සටහන් වීම වෙනස් කළහොත්; හෝ

(ආ) එවැනි යම් මීටරයක, ඒ මීටරය හරහා සපයනු ලබන විදුලිබල ප්‍රමාණය නිසි ලෙස සටහන් වීම වැළැක්වුවහොත්,

එකී තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ළඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ වූ වරදකට යම් තැනැත්තකුට විරුද්ධව අපරාධ නඩුවක් පවරන ලද අවස්ථාවක -

(අ) මීටරය එකී තැනැත්තාගේ භාරයේ හෝ එකී තැනැත්තාගේ පාලනය යටතේ පවතින බවට වූ සාක්ෂිය; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, මීටරයේ සටහන් වීමෙහි වෙනස් කිරීමක් සිදු කිරීම සඳහා වූ උපක්‍රමයක් එකී තැනැත්තා සන්තකයේ තිබෙන බවට හෝ මීටරයෙහි නිසි ලෙස සටහන් වීම වළක්වාලීම සඳහා වූ උපක්‍රමයක් තිබෙන බවට වූ සාක්ෂිය,

එකී තැනැත්තා විසින් වෙනස් කිරීම හෝ වැළැක්වීම චේතනාන්විතව කර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(3) (1) වන ඡේදය යටතේ වූ වරදකට පාරිභෝගිකයකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් පාරිභෝගිකයාගේ පරිශ්‍රයට සපයා ඇති සැපයුම විසන්ධි කර, වරද කරනු ලැබුවේ යම් මීටරයක් සම්බන්ධයෙන්ද ඒ මීටරය ගලවා ගෙන යා හැකි ය.

(4) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින්, (3) වන ඡේදය යටතේ මීටරයක් ඉවත් කරනු ලැබූ අවස්ථාවක, බලපත්‍රලාභියා විසින් ඒ මීටරය, විනාශ කිරීමට හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීමට නියාමක විසින් බලය දෙන තෙක් බලපත්‍රලාභියාගේ භාරයේ තබා ගත යුතු ය.

**9.** (1) කලින් ගෙවන මීටරයක් හරහා ස්වකීය විදුලිය සැපයුම ලබා ගන්නා, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් සපයන විදුලිය පරිභෝජනය කරන විදුලි පාරිභෝගිකයෙක්, ඒ මීටරයට ඇතුළු කරනු ලබන යම් මුදල් හෝ ටෝකන ආරක්ෂා සහිතව තැබීමට සියලු සාධාරණ පූර්වාරක්ෂණ ගැනීම පිණිස වූ වගකීමකින් බැඳී සිටිය යුතු ය.

(2) පාරිභෝගිකයාගේ අවසරය ඇතිව හැර, කලින් ගෙවන මීටරයක්, බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට පාරිභෝගිකයකුගෙන් විදුලිබලය සැපයීම වෙනුවෙන්, විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතයක් සැපයීම වෙනුවෙන් හෝ මීටරය සැපයීම වෙනුවෙන් අයවිය යුතු මුදල් හැර, අන්‍යාකාරව ලැබිය යුතුව ඇති යම් මුදලක් අයකර ගැනීම පිණිස භාවිත කරනු නොලැබිය යුතු ය.